# බදුල්ල නගර සංවර්ධන සැලැස්ම

## පළමු වෙළුම

### I කොටස

## තත්ත්ව වාර්තාව








නාගරිකසංවර්ධනඅධිකාරිය

"සෙත්සිරිපාය"

බත්තරමුල්ල

2018 - 2030

# I. ඇමතිතුමාගේ පණිවිඩය

## II. නගරාධිපතිතුමාගේ පණිවිඩය

## III. පූර්විකාව

බදුල්ල, බදුල්ල දිස්ත්‍රික් ප්‍රධාන අග නගරය සහ ඌව පළාතේ ප්‍රධාන පරිපාලන අග නගරය වේ. පරිපාලන කටයුතු වලට පරිබාහිරව සෞඛ්‍ය සේවා සැපයීමේදී ද පළාත් සෞඛ්‍ය සේවා සැපයුම්කරු ලෙස සලකයි. ඒ අනුව මෙම සංවර්ධන සැලසුමෙහි මුඛ්‍ය අරමුණ වනුයේ පවත්නා පරිපාලන ආයතනික සේවා හා සෞඛ්‍ය සේවා ශක්තිමත් කරලීමට අවශ්‍ය භූමි පරිහරණ රටාව සකස් කරලීමයි. මෙම සැලැස්මට 2018-2030 කාල සීමාව සඳහා වලංගු වේ. මෙම සැලැස්ම සකස් කරලීමේදී පවත්නා භූමි පරිහරණ රටාව, නගරයට පැමිණෙන සංක්‍රමණික ප්‍රජාව, නේවාසික ප්‍රජාවගේ ඝණත්වය හා ස්වභාවය, ආර්ථික රටාව, මහා මාර්ග ව්‍යාප්තිය හා එහි වර්ගීකරණය, සෞඛ්‍ය සේවාවල ස්වභාවය, ආයතනික රටාවේ ස්වභාවය යනාදි ක්ෂේත්‍ර ගණනාවන් අධ්‍යයනය කර ඇත.

සංවර්ධන සැලසුමෙහි දැක්ම ලෙස ඌව නීලහරිත මිටියාවතේ පරිපාලන හා සුවසේවා නගරය යන තේමා පාඨය සලකා ඇත. ඒ අනුව පවත්නා යටිතල පහසුකම් හා වාණිජ භාවිතය ඉහත මුඛ්‍ය සේවා අංශ වෙත ඵලදායි ලෙස සකස් කිරීමටත්, ඒ තුලින් නගරය සංවර්ධනය ළඟා කර ගැනීමට අපේක්ෂිතය. එසේම නීල හරිත මිටියාවතේ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශය ලෙස එහි ඇති පාරිසරික සම්පත් හා පාරිසරික සංවේදිතාවය ආරක්ෂා කිරීටමත් අපේක්ෂිතය.

නගර සංවර්ධන සැලසුම කොටස් දෙකකින් සමන්විත වන අතර ඉන් වෙළුම I තුල අධ්‍යයනය කළ තොරතුරු හා භෞතික සැලසුම් ව්‍යාපෘති සමඟ ඇතුලත් කොට ඇත. වෙළුම I සංවර්ධන රෙගුලාසි ඇතුලත් වේ.

## IV. කෘතඥතාවය

නාගරික සංවර්ධන අධිකාරිය, ඌව පළාත් කාර්යාලය සැලසුම් කණ්ඩායම විසින් සකස් කරන ලද බදුල්ල සංවර්ධන සැලැස්මට දායකත්වය ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් පහත රාජ්‍ය ආයතන සඳහා කෘතඥතාවය පළ කර සිටිමු.

**නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන කාර්යාලය**

| | |
|---|---|
| 1 | සංවර්ධන සැලසුම් අංශය |
| 2 | පර්යේෂණ හා සංවර්ධන ඒකකය |
| 3 | භූගෝලිය තොරතුරු පද්ධති අංශය |
| 4 | භූ දර්ශන හා පාරිසරික අංශය |

**අනෙකුත් ආයතන**

| | |
|---|---|
| 1 | බදුල්ල මහ නගර සභාව |
| 2 | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 3 | ලංකා විදුලිබල මණ්ඩලය, බදුල්ල |
| 4 | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 5 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දපාර්තමේන්තුව |
| 6 | පළාත් මහ රෝහල බදුල්ල |
| 7 | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| 8 | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 9 | බදුල්ල පොලිසිය |
| 10 | මාර්ග සංවර්ධන අධිකාරිය බදුල්ල |
| 11 | පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 12 | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිංඅරාව, බදුල්ල |
| 13 | ජා.ගො.ප.සංවිධානය |
| 14 | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 16 | වාණිජ මණ්ඩලය |
| 17 | පුරාවිද්‍යා ප්‍රාදේශිය කාර්යාලය |
| 18 | ශ්‍රීලංගම, බදුල්ල |
| 19 | බදුල්ල ඩිපෝව |
| 20 | බන්ධනාගාරය, බදුල්ල |
| 21 | ක්‍රීඩා දෙපාර්තමේන්තුව |
| 22 | මධ්‍යම පරිසර අධිකාරිය |
| 23 | බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලය |
| 24 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 27 | බදුල්ල ප්‍රාදේශිය සභාව |

# V. පටුන

I. ඇමතිතුමාගේ පණිවිඩය ....... i
II. නගරාධිපතිතුමාග් පණිවිඩය ....... ii
III. පූර්විකාව....... iii
IV. කෘතඥතාවය ....... iv
V. පටුන....... v
VI. සිතියම් ලැයිස්තුව....... vii
VII. වගු ලැයිස්තුව....... viii
VIII. රූප ලැයිස්තුව....... ix

1. හැදින්වීම ....... 1
   1.1 සංවර්ධන සැලසුමක පසුබිම....... 1
   1.2 සැලසුම් කණ්ඩායම ....... 2
   1.3 විෂය පථය ....... 4
   1.4 සැලසුම් ක්‍රියා පටිපාටිය ....... 9
2. ප්‍රාථමික සමීක්ෂණ කටයුතු ....... 12
   2.1 අධ්‍යානය ප්‍රදේශ ....... 12
   2.2 සැලසුම් පසුතලය හා තත්ත්ව වාර්තාව ....... 13
   2.3 සැලසුම් සීමා නිර්ණය කිරීම....... 32
3. නගර සංවර්ධන සැලැස්ම යාවත් කාලීන කිරීමේ අවශ්‍යතාවය....... 38
4. සංවර්ධන සැලසුම් රාමුව ....... 46
   4.1 දැක්ම....... 46
   4.2 දැක්මෙහි ප්‍රකාශනය....... 46
   4.3 අරමුණු....... 47
   4.4 පරමාර්ථ....... 47
5. සවිස්තරාත්මක විශ්ලේශණ සාරාංශය....... 49
   5.1 ශදුඅත විශ්ලේශන ක්‍රම වේදය (SWOT Analysis)....... 50
   5.2 සංවර්ධන පීඩන විශ්ලේශන ක්‍රම වේදය (Development Pressure Analysis)....... 97
6. සැලැස්ම ....... 99
   6.1 සංකල්පිත සැලැස්ම ....... 99
      6.1.2 සංකල්පිත සැලැස්ම හැදින්වීම ....... 100
   6.2 භූමි හා ගොඩනැගිලි සංවර්ධන උපක්‍රම....... 101
      6.2.1 යෝජිත ඉඩම් පරිහරණ සැලසුම ....... 101
   6.3භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම ....... 104

6.3.1 යෝජිත සේවා සැපයුම් සැලැස්ම ..... 104
6.3.2 යෝජිත ප්‍රවාහන සැලැස්ම ..... 114
6.3.3 යෝජිත ජල සැපයුම් සැලැස්ම ..... 126
6.3.4 යෝජිතවිදුලිසහදත්තරඟැන්සැලස්ම ..... 127
6.3.5 යෝජිතඅපද්‍රව්‍ය හා මලාපවාහන සැලසුම ..... 128
6.3.6 යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ..... 129
6.4 ආර්ථික සංවර්ධන උපායමාර්ග ..... 132
6.4.1 යෝජිත ආර්ථික සැලැස්ම ..... 132
6.5 පාරිසරික තිරසාර උපායමාර්ග ..... 136
6.5.1 යෝජිත පාරිසරික සංරක්ෂණය ..... 136
6.5.2 යෝජිත භූ දර්ශණ කළමනාකරණය ..... 137
6.5.3 යෝජිත ස්වභාවික ආපදා හා විපත් අවම කිරීමේ උපායමාර්ගය ..... 142
6.6 සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ග ..... 147
6.6.1 යෝජිත සංස්කෘතික උරුමයන් සංරක්ෂණ සැලැස්ම ..... 147
7.6.2 යෝජිත පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණ සැලැස්ම ..... 149
6.7 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ..... 152
6.7.1. උපාය මාර්ගික ව්‍යාපෘති ලේඛනය ..... 153
6.7.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය ..... 155
Concept Paper ..... 162

ඇමුණුම අංක 1 ..... 179
ඇමුණුම අංක 2- ව්‍යාපෘති ලේඛනය ..... 183
ඇමුණුම අංක 3- ව්‍යාපෘති සංසංධනාත්මක විශ්ලේශණය ..... 185
ඇමුණුම අංක 4- ව්‍යාපෘති සමාජීය හා පාරිසරික විශ්ලේෂණය ..... 188

# VI. සිතියම් ලැයිස්තුව


සිතියම අංක 1.1 : 2030 ජාතික භෞතික සැලසුම .....5
සිතියම අංක 1.2: 2050 ජාතික භෞතික සැලසුම .....6
සිතියම අංක 1.3 : 2010-2024 බදුල්ල කලාපීයකරණ සැලැස්ම .....7
සිතියම අංක 2.1 : බදුල්ල ජන ඝනත්වය .....17
සිතියම අංක 2.2 : බදුල්ල භූමි පරිහරණ රටාව .....19
සිතියම අංක 2.3 : බදුල්ල ජලවහන රටාව .....21
සිතියම අංක 2.4 : බදුල්ල මාර්ග ව්‍යාප්තිය .....24
සිතියම අංක 2.5 : බදුල්ල ජල සැපයුම .....25
සිතියම අංක 2.6 : බදුල්ල විදුලිබල සැපයුම .....26
සිතියම අංක 2.7 :බදුල්ල සෞඛ්‍ය සේවා සැපයුම් ස්ථාන .....28
සිතියම අංක 2.8 : බදුල්ල නගර සීමාව .....35
සිතියම අංක 2.9 : සංවර්ධන පීඩන විශලේෂණය .....36
සිතියම අංක 2.10 : ගොඩනැගිලි ඝනත්ව විශලේෂණය .....37
සිතියම අංක 5.1 : බදුල්ල නගරයේ ජීවත් වීමට සුදුස් පරිසර කලාප විශ්ලේෂණය .....57
සිතියම අංක 5.2 : බදුල්ල නගරයේ සංවේදි පරිසර කලාප විශ්ලේෂණය .....58
සිතියම අංක 5.3 : අවකාශ වින්‍යාසය(Space syntax) .....65
සිතියම අංක 5.4 : බදුල්ල නගරයේ විදුලි රැහැන් ව්‍යාප්තිය .....68
සිතියම අංක 5.5 : බදුල්ල නගරයේ ඉඩම් වටිනාකම් .....73
සිතියම අංක 5.6 : බදුල්ල නගරයේ බෑවුම් කලාප විශ්ලේෂණය .....80
සිතියම අංක 5.7 : බදුල්ල නගරයේ ස්වාභාවික බෑවුම අනුව ජල බැස්ම .....85
සිතියම අංක 5.8 : බදුල්ල නගරයේ ප්‍රධාන කාණු පද්ධතිය .....86
සිතියම අංක 5.9: පවත්නා විවේකී හා විනෝද ස්ථාන .....88
සිතියම අංක 5.10 : බදුල්ල නගරයේ නාය යෑම් අවදානම් කලාප .....90
සිතියම අංක 5.11 : බදුල්ල නගර සීමාවේ ගංවතුර හානි සිදුවන ස්ථාන .....91
සිතියම අංක 5.12 : සංවර්ධන පීඩන විශ්ලේෂණ ක්‍රමවේදය .....98
සිතියම අංක 6.1 : සංකල්පිත සැලැස්ම .....99
සිතියම අංක 6.2 : යෝජිත ඉඩම් පරිහරණ සැලසුම .....101
සිතියම අංක 6.3 : යෝජිත බදුල්ල මහ රෝහල පුළුල් කිරීමේ ව්‍යාපෘති ඉඩම .....106
සිතියම අංක 6.4 : යෝජිත පරිපාලන සංකීර්ණය අදියර 2 .....108
සිතියම අංක 6.5 : යෝජිත බදුළුපිටිය පාර පරිපාලන සංකීර්ණය .....109
සිතියම අංක 6.6 : යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය -බන්ධනාගාර ඉඩම .....110
සිතියම අංක 6.7 : යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය .....110

සිතියම අංක 6.9 : යෝජිත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය ......112
සිතියම අංක 6.10 : යෝජිත සරස්වතී කනිටු විදුහල ප්‍රතිශ්ඨාපනය ......113
සිතියම අංක 6.11 : පවත්නා හා යොජිත ඒ 5 මාර්ගය......115
සිතියම අංක 6.12 : යෝජිත මංසන්ධි සංවර්ධනය ......116
සිතියම අංක 6.13 : යෝජිත මාර්ග පළල් කිරීම් ......117
සිතියම අංක 6.14 : මැදිරිය පාර නව මාර්ග සංවර්ධනය......118
සිතියම අංක 6.15 : යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය......119
සිතියම අංක 6.16 : යෝජිත බස් නැවතුම් පොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය......120
සිතියම අංක 6.17 : යෝජිත පටුමං සංවර්ධනය......121
සිතියම අංක 6.18 : යෝජිත වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය......122
සිතියම අංක 6.19 : යෝජිත පදික මාර්ග සංවර්ධනය ......123
සිතියම අංක 6.20 : යෝජිත සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය ......125
සිතියම අංක 6.21 : යෝජිත බදුල්ල- හාලිඇල- ඇල්ල ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය- බෙදාහැරීමේ ප්‍රදේශ......126
සිතියම අංක 6.22 : යෝජිත භූගත සේවා තීර ......128
සිතියම අංක 6.23 : යෝජිත අපද්‍රව්‍ය හා මලාපවාහන සැලසුම ......129
සිතියම අංක 6.24 : සේවා ආශ්‍රිත වාණිජ සංවර්ධනය......133
සිතියම අංක 6.25 : ප්‍රාදේශීය ආර්ථික ප්‍රශස්තිකරණය......135
සිතියම අංක 6.26: යෝජිත පොදු එළිමහන් කලාපයන්හි සේවා කලාපය ......146
සිතියම අංක 6.27 : බදුල්ල සංස්කෘතික පෙරහැර පවත්වන මාර්ග ......148

## VII. වගු ලැයිස්තුව

*වගුව අංක 2.1 : නගරයට පැමිණෙන සංක්‍රමණික ජනගහනය වර්ගීකරණය ......18*
*වගුව අංක 2.2 : බදුල්ල නගරයේ ඉඩම් හිමිකාරිත්වය ......20*
*වගුව අංක 2.3 : බදුල්ල නගරයේ මාර්ග වර්ගීකරණය ......22*
*වගුව අංක 2.4 : බදුල්ල නගරයට පැමිණෙන හා පිටවන පොදු බස්රථ ප්‍රමාණය ......22*
*වගුව අංක 2.5 : බදුල්ල මහ රෝහලේ වෛද්‍ය සේවක සංයුතිය ......27*
*වගුව අංක 2.6 : බදුල්ල නගරයේ කසළ වර්ගීකරණය ......29*
*වගුව අංක 5.1: අරමුණු අංක 1 ශුදුඅත විශ්ලේශණය ......50*
*වගුව අංක 5. 2: ග්‍රාම සේවා වසම් අනුව රැකියාවල නියුක්ත නේවාසික ජනගහනවර්ගීකරණය......52*
*වගුව අංක 5.3 : වාර්ෂික රෝගී තොරතුරු ......53*
*වගුව අංක 5.4 : දෛනික රෝගී තොරතුරු......54*
*වගුව අංක 5.5: බදුල්ල නගරයේ ජීවත් වීමට සුදුසු පරිසර කලාප සිතියමේ සාරාංශය......56*
*වගුව අංක 5.6 : බදුල්ල නගරයේ පාරිසරික සංවේදී කලාප සිතියමේ සාරාංශය ......59*
*වගුව අංක 5.7 : ද්විතියික අධ්‍යාපනික ආයතන......59*
*වගුව අංක 5.8 : බදුල්ල නගර සීමාවේ උසස් අධ්‍යාපනික ආයතන......60*

වගුව අංක 5.9 : අරමුණු අංක 2 ශුද්‍ධත විශ්ලේශණය ....64
වගුව අංක 5.10 : බදුල්ල මහ නගර සභා සීමාවේ නල ජලසම්බන්ධතා....66
වගුව අංක 5.11 : බදුල්ල නගර සීමාව තුළ ජල පොම්පාගාර හා ඒවායේ ජල ධාරිතාවයන්....66
වගුව අංක 5.12: හඳුනාගත් මාර්ග කොටස් වල පවත්නා වේග සීමාවන්....72
වගුව අංක 5.13 : අරමුණු අංක 3 ශුද්‍ධත විශ්ලේශණය....81
වගුව අංක 5.14: නගර සීමාවේ වර්ථමාන වනාන්තර හා පතන භූමි ප්‍රමාණයන්....82
වගුව අංක 5.15: වර්තමාන කුඹුරු ඉඩම් ප්‍රමාණය හා ඒවායේ භාවිතය ....83
වගුව අංක 5.16 : අරමුණු අංක 4 ශුද්‍ධත විශ්ලේශණය ....92
වගුව අංක 5.17 : බදුල්ල නගරයේ සංවර්ධන පීඩන විශ්ලේෂණ සාරාංශය ....97
වගුව අංක 6. 1 : යෝජිත ඒ 5 මාර්ගයේ දිශානතිය ....115
වගුව අංක 6.2 : පවත්නා ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත එළිමහන් කලාපයන්හි වර්ග ප්‍රමාණය....143
වගුව අංක 6.3 : යෝජිත පොදු එළිමහන් කලාපයන්හි වර්ග ප්‍රමාණය....144
වගුව අංක 6.4: ව්‍යාපෘති ලේඛනය....183
වගුව අංක 6.5 : ව්‍යාපෘති සංසංධනාත්මක විශ්ලේශණය .... Error! Bookmark not defined.
වගුව අංක 6.6: ව්‍යාපෘති සමාජීය හා පාරිසරික විශ්ලේෂණය .... Error! Bookmark not defined.
වගුව අංක 6.7 : ව්‍යාපෘති ප්‍රමුඛතා සාරාංශකරණය....153
වගුව අංක 6.8: ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය ....155

## VIII. රූප ලැයිස්තුව

රූපය අංක 2.1 : බදුල්ල නගරයේ පිහිටීම....12
රූපය අංක 2.2 : ඓතිහාසික විකාශය ....14
රූපය අංක 2.3 : බදුල්ල නගරයේ සේවා සැපයුම් වපසරිය ....16
රූපය අංක 2.4: බදුල්ල මහ රොහලේ පිහිටීම ....27
රූපය අංක 2.5 : පහළ රජ වීදිය හා බසාර් වීදිය වාණිජ කටයුතු ....30
රූපය අංක 2.6 : බදුල්ල නගරය....32
රූපය අංක 2.7 :බදුල්ල නගරයේ සේවා සැපයුම් වපසරිය ....33
රූපය අංක 3.1 : බදුල්ල කසළ අංගනය ....39
රූපය අංක 3.2 : බදුළු ඔයට එක්වන අප ජලය ....39
රූපය අංක 3.3: නගර මධ්‍යය ඌණ සංවර්ධන මට්ටමේ පුරාවිද්‍යා ස්මාරක....40
රූපය අංක 3.4 : කුඹුරු ඉඩම් ගොඩකර සිදුවන ඉදිකිරීම් ....42
රූපය අංක 3. 5 : කඳුකර ප්‍රදේශවල සිදු වන නේවාසික භාවිත ....42
රූපය අංක 5.1 : ප්‍රධාන පරිපාලන සංකීර්ණ ....51
රූපය අංක 5.2 : නගරයේ ඇති පරිපාලන සංකීර්ණ කිහිපයක් ....52
රූපය අංක 5.3 : දකුණු පටුමග හා බසාර් වීදිය වාණිජ ස්ථාන ....55

රූපය අංක 5.4 : සෞඛ්‍ය සේවා ආශ්‍රිත වාණිජ කටයුතු ........ 55
රූපය අංක 5.5 : බණ්ඩාරවෙල පාර දෙපස රෝහල කේන්ද්‍රකොට ගත් සේවා ස්ථාන අවිධිමත්ව පිහිටා තිබෙන අයුරු ........ 62
රූපය අංක 5.6 : වර්තමාන කසල අංගනය........ 70
රූපය අංක 5.7 : අපවිත්‍ර පොදු කාණු........ 71
රූපය අංක 5.8 : අපවිත්‍ර ජල කාණු බදුළු ඔයට හරවා ඇති ආකාරය ........ 74
රූපය අංක 5.9 : නගර මධ්‍යය ඌණ භාවිතයේ ඇති පුරාවිද්‍යා ස්මාරක........ 75
රූපය අංක 5.10 : අවිධිමත් විදුලි රැහැන් හා සන්නිවේදන රැහැන්........ 76
රූපය අංක 5.11: පදික වේදිකා හරස් කර කාණු හා නල ජල පද්ධතිවල අළුත්වැඩියා කිරීම් සිදු කිරීම........ 76
රූපය අංක 5.12 : නගරය වටා පිහිටි සංචාරක ආකර්ශණ ස්ථාන ........ 78
රූපය අංක 5.13: බදුළු ඔය........ 82
රූපය අංක 5.14: කඳුකර ප්‍රදේශවල සිදු වන නේවාසික භාවිත ........ 89
රූපය අංක 5.15 : මුතියංගණ රජ මහා විහාරය ........ 93
රූපය අංක 5.16 : බදුල්ල නගරයේ ඓතිහාසිකව වැදගත් ස්ථාන........ 94
රූපය අංක 5.17: බදුල්ල කතරගම මහා දේවාලයේ පෙරහැර ........ 95
රූපය අංක 5.18 : අත්හැර දමා ඇති පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන........ 96
රූපය අංක 5.19 : ඌණ සංවර්ධිත මට්ටමේ පවතින පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන ........ 96
රූපය අංක 6.1 : බදුල්ල මහ රෝහලේ සේවා සැපයුම් වපසරිය........ 107
රූපය අංක 6.2: පහළ වීදිය යෝජිත වීථි නියාමනය ........ 124
රූපය අංක 6.3: මැහෝගනී වෘක්ෂ තීරය ........ 138
රූපය අංක 6.4 : යෝජිත මැහෝගනී වෘක්ෂ තීරයේ හරිත උයන........ 138
රූපය අංක 6.5 : මැදිරිය පාර සිට සේනානායක උද්‍යානය දක්වා........ 139
රූපය අංක 6.6: යෝජිත බදුළු ඔය අශ්‍රිත හරිත උයන ........ 139
රූපය අංක 6.7 : අලිකුඹුර ඉඩම ........ 140
රූපය අංක 6.8 : යෝජිත අලිකුඹුර තෙත් බිම් උද්‍යානය........ 140
රූපය අංක 6.9 : බදුල්ල මහ රෝහල පිටුපස ඉඩම ........ 140
රූපය අංක 6.10 : යෝජිත බදුල්ල මහ රෝහල පිටුපස හරිත උයන........ 141
රූපය අංක 6.11 : .ග්‍රීන් ලේන් ඩ්‍රයිව් ගහ රක්ෂිත ඉඩම ........ 141
රූපය අංක 6.12 : .ග්‍රීන් ලේන් ඩ්‍රයිව් ගහ රක්ෂිත ඉඩමේ යෝජිත ඔසු උයන........ 141
රූපය අංක 6.13: මුතියංගණ රජ මහා විහාරය වටා වූ සංවර්ධන පාලන අවරෝධක ප්‍රදේශය (Buffer zone)... 147
රූපය අංක 6.14 : වර්තමාන වෙලේකඩේ පරිශ්‍රය හා යෝජිත මහජන විවේකී ස්ථාන........ 149
රූපය අංක 6.15 : වර්තමාන සළසල ගොඩනැගිල්ල හා යෝජිත මිශ්‍ර සංවර්ධනය........ 150
රූපය අංක 6.16 : වර්තමාන තල්දෙන වලව්ව හා යෝජිත අවන්හල් ව්‍යාපෘතිය ........ 150
රූපය අංක 6.17: වර්තමාන කොතලාවල වලව්ව හා යෝජිත අවන් හල් ව්‍යාපෘතිය........ 151

# 1. හැඳින්වීම

## 1.1 සංවර්ධන සැලසුමක පසුබිම

1978 අංක 41 දරණ ගැසට් පත්‍රය මගින් නාගරික බල ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීමට හා පාලනය කිරීම උදෙසා නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබේ. එම පනත හා එහි කලින් කලට ඇති කරන ලද සංශෝධන අනුව නාගරික සංවර්ධන අධිකාරියේ කාර්ය භාරය ලෙස නාගරික ප්‍රදේශ හඳුනා ගැනීම. එම ප්‍රදේශ නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම, සංවර්ධන සැලසුම් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම ආදී මූලික කටයුතු ඇතුලත් වේ.

ඒ අනුව 1979 ජුනි මස 01 වන දින අංක 38/16 දරණ ගැසට් පත්‍රය මගින් බදුල්ල මහ නගර සභාව ඌව පළාතේ ප්‍රථම නාගරික බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. 1982 අංක 04 දරණ පනතෙහි II ආ කොටස 8 අ (1) වගන්තියට අනුව නාගරික සංවර්ධන අධිකාරියට එසේ ප්‍රකාශයට පත්කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සැදීමේ බලතල හිමිව ඇති අතර, එකී බලතල ප්‍රකාරව 2010 මාර්තු මස 17 වන දින අංක 1645/22 දරණ ගැසට් පත්‍රය මගින් බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයට සංවර්ධන සැලැස්මක් ප්‍රකාශයට පත් කරන ලදි. නමුත් ආර්ථික හා සමාජීය වෙන්වීම් මත බදුල්ල සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

ඒ අනුව, 1982 අංක 04 දරණ සංශෝධන පනතෙහි 8ඌ(I) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 2017 අප්‍රේල් මස සිට බදුල්ල සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.

නගරයේ දෛනික සංක්‍රමණය වන ජනතාවත්, නේවාසික ප්‍රජාවත් සඳහා මනා යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් ඇතිකරලීම උදෙසා 2018-2030 කාල පරිච්ඡේදය ඉලක්ක කරගනිමින් බදුල්ල මහ නගර සභා සීමාව සඳහා ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සැලැස්මක් පිළියෙල කොට ඇත. මේ තුලින් බදුල්ල නගරයේ භෞතික සමාජයීය, ආර්ථික හා පාරිසරික ප්‍රගමනයක් අපේක්ෂිතය. එහිදී නගරයේ පවත්නා ප්‍රධාන ආයතන, සංක්‍රමනික ජනතාව හා නේවාසික ජනතාව, නගරයේ සේවා සැපයුම්කරුවන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගනු ලැබූ අතර, එසේ යෝජිත සංවර්ධන යෝජනා සංක්ෂිප්තව හා විස්තරාත්මකව මෙම වාර්තාව තුළ අන්තර්ගත කර ඇත.

## 1.2 සැලසුම් කණ්ඩායම

(2018-2030) බදුල්ල සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා දායක වූ ප්‍රධාන පාර්ශවකරුවන්

i. නාගරික සංවර්ධන අධිකාරිය ඌව පළාත් කාර්යාලය
ii. බදුල්ල මහ නගර සභාව

ප්‍රධාන උපදේශකත්වය ලබා දුන් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන

i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ii. බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
iii. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
iv. පළාත් මහ රෝහල
v. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
vi. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
vii. මාර්ග සංවර්ධන අධිකාරිය
viii. දුම්රිය දෙපාර්තමේන්තුව
ix. ආයෝජන මණ්ඩලය
x. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xi. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xii. බදුල්ල බන්ධනාගාරය
xiii. ලංකා විදුලිබල මණ්ඩලය
xiv. ක්‍රීඩා අමාත්‍යාංශය
xv. බදුල්ල ප්‍රාදේශීය සභාව

උපදේශකත්වය ලබා දුන් අනෙකුත් පාර්ශවකරුවන්

i. බදුල්ල ත්‍රිරෝද රථ සංගමය
ii. බදුල්ල වෙළඳ ප්‍රජාව
iii. නේවාසික ජනතාව

**නාගරික සංවර්ධන අධිකාරිය ඌව පළාත් කාර්යාලයේ** බදුල්ල සංවර්ධන සැලැස්ම සැදීමේ සැලසුම් කමටුවේ සමාජිකයන් පහත දැක්වේ.

| සාමාජිකයාගේ නම | තනතුර |
|---|---|
| අනුර මැදවෙල මහතා | අධ්‍යක්ෂ (ඌව) |
| ඩබ්.ඩී.ඩී.වමිලා මහතන්තිල මහත්මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඌව) |
| කේ.එම්.සි.එස් කුමාර මහතා | සැලසුම් නිලධාරි |
| ඊ.එම්. ඉන්ද්‍රසිරි මහතා | සැලසුම් නිලධාරි |
| ආර්.එම්.එස්. රාජපක්ෂ මහතා | සැලසුම් නිලධාරි |
| ඩබ්.කේ. රංගජීවනී මිය | සැලසුම් නිලධාරි |
| එස්.ජේ.කේ. ලේල්වල මහතා | සැලසුම් නිලධාරි |
| පී.එල්. සී.බී.ලියනගේ මෙනවිය | සහකාර සැලසුම් නිලධාරි |

(2018-2030) බදුල්ල සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා දායක වූ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශ

i. සභාපති - ආචාර්ය ජගත් මුණසිංහ මහතා
ii. නියොජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ඩී.එම්.බී.රණතුංග මහතා
iii. පර්යේෂණ හා සංවර්ධන ඒකකය
iv. සංවර්ධන සැලසුම් අංශය
v. භූගෝලීය තොරතුරු පද්ධති අංශය
vi. භූ දර්ශන හා පාරිසරික අංශය
vii. ඌව පළාත් කාර්යාලයේ සහායක නිලධාරීන්

(ඇමුණුම අංක 1.1)

## 1.3 විෂය පථය

බදුල්ල නගර සංවර්ධන සැලසුමෙහි විෂය පථය ලෙස අධ්‍යයනය කරනුයේ නගරයේ පවත්නා ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික විභවතාවයන්, ප්‍රාදේශීයමය පළාත්මය හා ජාතික වශයෙන් බදුල්ල නගරයට ඇති අවස්ථාවන් හදුනාගැනීම හා ඒවා ඒකාබද්ධ කොට සංවර්ධන සැලසුමක් සැදිය යුතු මට්ටම සහ සංවර්ධන සැලසුම තුලින් ආවරණය විය යුතු අංශ පිළිබදවයි.

ඌව පළාතේ ප්‍රධාන අගනගරය වන බදුල්ල, පළාතේ ප්‍රථම මහ නගර සභාව හා ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරී බලප්‍රදේශයයි. එසේම පළාතේ අග නගරය ලෙස ප්‍රාදේශීය දිස්ත්‍රික්කමය හා පළාත්මය වශයෙන් වැදගත් පරිපාලන ආයතන රැසක් නගරය පුරා ස්ථානගතව ඇත.

නගරයේ ස්ථානගත වීම සලකා බලන විට පේරාදෙණිය-චෙන්කලඩිA5 මාර්ගයේ ප්‍රධාන මංසන්ධියක් ලෙස බදුල්ල නගරය පවතී. නගරය වටා පවතින අනෙකුත් ප්‍රධාන නගර ලෙස බණ්ඩාරවෙල, හාලිඇල,මහියංගනය හා පස්සර හැදින්විය හැකිය. එසේම කොළඹ - බදුල්ල උඩරට දුම්රිය මාර්ගයේ අවසාන දුම්රිය ස්ථානය ලෙසද බදුල්ල නගරය පවතී. ඒ අනුව කලාපයේ දුම්රිය හා මාර්ගස්ථ මගී ප්‍රවාහනය යන දෙකම පවතින ප්‍රධානතම නගරයක් ලෙසද බදුල්ල හදුනාගත හැකිය.

2030 ජාතික භෞතික සැලසුමට අනුව බදුල්ල යනු මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට අයත් නගරයක් වේ.(සිතියම අංක 1.1) ඒ අනුව බදුල්ල නගරය තුළමහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතීන් කිසිවක් හදුනාගෙන නොමැත. නමුත් කෘෂිකාර්මික, අධ්‍යාපනික හා සංචාරක දියුණුවක් ළගාකරගත හැකි සංවර්ධන ව්‍යාපෘතීන් රැසක් නගරය වටා ප්‍රදේශය තුල හදුනා ගෙන ඇත.

2050 කෙටුම්පත් කර ඇති ජාතික භෞතික සැලැස්ම(සිතියම අංක 1.2) තුලින්ද බදුල්ල නගරය මධ්‍ය පාරිසරික සංවේදී කලාපයට අයත් වේ. ඒ අනුව, කලාපය තුල ජනගහනය පාලනය කිරිමත්, පවත්නා ජනගහනය ඒ ආකාරයෙන්ම පවත්වා ගත යුතු බවත්, හදුනාගෙන ඇත. එහිදීද රැකියා අවස්ථා මත ජනගහනය උත්පාදනය නොවන ආර්ථික ක්‍රියාකාරකම් බදුල්ල නගරය හා ඒ ආශ්‍රිත වූ මධ්‍යම පාරිසරික සංවේදී කලාපයේ ස්ථානගත යුතු බව හදුනාගෙන ඇත.

2010 මාර්තු මස 17වන දින ප්‍රකාශයට පත්කරන ලද බදුල්ල සංවර්ධන සැලැස්මෙහි (2010 -2024) අරමුණ පළාතේ ප්‍රධාන පරිපාලන අගනගරය ලෙස එහි සේවය අඛණ්ඩ හා ප්‍රශස්ත ආකාරයට පවත්වාගෙන යමින් සංවර්ධනය කිරීමයි. නමුත් එම සැලැස්මේ කලාපීයකරණ සැලැස්ම(සිතියම අංක 1.3), ගෙබිම් අනුපාත සැලැස්ම, බිම් කට්ටි පිරිවිතර, නගරයේ වාණිජ, නේවාසික හා පරිපාලන සේවයන් සිදුකරන ඉදිකිරීම් සදහා පවතින ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොමැත. ඒ අනුව නගරයේ සංවර්ධන උපනතීන්ගේ අක්ෂය ද වෙනස් වී ඇති අතර භෞතික සංවර්ධනය උදෙසා මග පෙන්වන යාවත්කාලීන කරන ලද සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය පවතී.

2030 ජාතික භෞතික සැලසුමට හා 2050 කෙටුම්පත් ජාතික භෞතික සැලසුමට අනුව බදුල්ල මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට අයත් නගරයක් බැවින්, සංචාරක කෘෂිකාර්මික සේවා වැනි පරිසරයට අවම

**සිතියම අංක 1.1 : 2030 ජාතික භෞතික සැලසුම**



සිතියම අංක 1.2: 2050 ජාතික භෞතික සැලසුම



**සිතියම අංක 1.3 : 2010-2024 බදුල්ල කලාපීයකරණ සැලැස්ම**



හානියක් සිදුවන ක්‍රියාකාරකම් පමණක් යෝජිතය. නමුත් බදුල්ල ඌව පළාතේ පරිපාලන අගනගරය බැවින්, සේවා සැපයුම් ස්ථාන රැසක් ස්ථානගත වී ඇති අතර, සේවා අංශයේ විශාල දියුණුවක් මේවන විටත් ලබාගෙන ඇත. ඒ අනුව, එම සේවා ස්ථානවල සේවය කරන ප්‍රජාවගේ නේවාසික ඉල්ලුම හා භාණ්ඩ ඉල්ලුම සම්බන්ධවත්, බදුල්ල නගර සංවර්ධන සැලැස්මෙන් අනිවාර්යය සැලකිල්ලට භාජනය කල යුතුව ඇත. මෙහිදී නගර මධ්‍යයේ වූ තැනිතලා ප්‍රදේශය තිරසාර වූ පාරිසරික තත්ත්වයන්ට අනුව සංවර්ධන කාර්යයට යොදා ගැනීම 2018 – 2030 සංවර්ධන සැලැස්ම තුලින් අපේක්ෂිතය.

එසේම ඌව පළාත තුල පවත්නා නගර අතරින් ස්වාභාවික ආපදා අවම මට්ටමක පැවතීම හේතුවෙන් නගරයට වාර්ෂිකව එක්වන පදිංචි ජනගහනය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. නමුත් මෙම හේතුව මත අනවශ්‍ය පාරිසරික හායනයක් ඇතිවීමේ ප්‍රවණතාවයක් පවතී. කුඹුරු ඉඩම් ගොඩකිරීමත්, කඳුකර බෑවුම් ප්‍රදේශ නේවාසික ඉල්ලුම සඳහා නතුවීමත්, එහි එහි ප්‍රතිඵලයයි. ඒ අනුව මෙකී සංවර්ධන සැලැස්ම හරහා පාරිසරික හායනය අවම කිරීමත් තිරසාර වූ සේවා නගරයක් ඇති කිරීමත් අපේක්ෂිතය.

උඩරට කඳුකර ප්‍රදේශයේ පවතින පාරිසරික සුන්දරත්වය මත සංචාරක ආකර්ශණයක් දිනාගත හැකි නගරයක් ලෙස බදුල්ල සංවර්ධනය කිරීමේ හැකියාව පැවතුනද බදුල්ල මහ නගර සීමාව සඳහා අයත් වන භූමි ප්‍රමාණයේ එවැනි සංචාරක ආකර්ෂණයට නතු වූ ස්ථාන පවතිනුයේ අතලොස්සකි. බදුල්ල මුතියංගණ රජමහා විහාරය, ළිඳමුල්ල පත්තිනි දේවාලය, කතරගම දේවාලය වැනි ආගමික පුදබිම් හැරුණුකොට මැදපතන වැනි පතන බිම් සංචාරක කර්මාන්තය අතින් දියුණුවට පත් කළ හැකි ස්ථාන වේ. නමුත් භූමි පරිහරණ රටාවෙන් හා පවත්නා සමාජයීය, ආර්ථික උපනතීන් සැලකිල්ලට ගත් විට සංචාරක ක්ෂේත්‍රය සඳහා බදුල්ල නගරය තුල ඇති තත්ත්වයන් අවම මට්ටමක පවතී. එහිදී සංචාරක දියුණුවට වඩා සේවා අංශය කේන්ද්‍රකොටගත් සංවර්ධනයක් දැනටමත් නගරය ආවරණය කර ඇත. එනිසා පවත්නා නගර ව්‍යූහය එම සේවා අංශය කෙරේ නැඹුරුව සංවර්ධන කාර්යය සඳහා යොදා ගන්නා අතර ප්‍රමුඛතාවයෙන් අඩු සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳ මේ තුලින් සාකච්ඡා නොකෙරේ.

ඒ අනුව බදුල්ල නගරය පවත්නා පාරිසරික සංවේදී භාවය ආරක්ෂා කර, ජාතික වශයෙන් හඳුනා ගෙන ඇති විෂය ක්ෂේත්‍රය මත විධිමත් යටිතල පහසුකම් වලින් සපිරි කලාපීය අගනගරයක් සෑදීම මෙම සංවර්ධන සැලැස්ම තුලින් සිදුවේ.

## 1.4 සැලසුම් ක්‍රියා පටිපාටිය

බදුල්ල සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අනුගමනය කරන ලද සැලසුම් ක්‍රියාවලිය පහත රූප සටහනෙන් දක්වා ඇත.



### I. පසුබිම් අධ්‍යයන කටයුතු

බදුල්ල සංවර්ධන සැලැස්ම සෑදීම සඳහා මූලිකව නගරයේ පවත්නා භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ ප්‍රාථමික හා ද්විතියික දත්ත මගින් විශ්ලේෂණය කරන ලදි. මේ සඳහා බදුල්ල මහ නගර සභාව, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බදුල්ල මහ රෝහල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය භාජාතික විදුලිබල මණ්ඩලය, ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානය, පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලය යනාදි ආයතනයන්ගෙන් ලබාගත් ප්‍රාථමික හා ද්විතීයික දත්ත විශ්ලේෂණය කිරීම සිදු කරන ලදි. ඒ අනුව ලබාගත් දත්ත විශ්ලේෂණය කොට සකස් කරන ලද සිතියම් හරහාද බදුල්ල නගරය පිළිබඳව මූලික අධ්‍යයන කටයුතු සිදු කරන ලදි. මීට අමතරව නගරයේ සැබෑ තත්ත්වය ක්ෂෙත්‍ර පරීක්ෂණ කටයුතු හරහාද හඳුනාගන්නා ලදි.

### II. විෂය පථය හඳුනා ගැනීම

ජාතික, කලාපීය වශයෙන් බදුල්ල නගරයේ පවත්නා ස්වභාවය මේ අදියරේදී හඳුනාගන්නා ලදි. එහිදී 2030 ජාතික භෞතික සැලසුම හා 2050 කෙටුම්පත් ජාතික භෞතික සැලසුම තුලින් මධ්‍යම පාරිසරික සංවේදී කලාපයේ පවත්නා බදුල්ල නගරයට ලබාදී ඇති සංවර්ධන තත්ත්වයන් හා ඌව කලාපීය සැලැස්ම හරහා යෝජිතව ඇති සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනාගන්නා ලදි. එසේම යටිතල පහසුකම් සපයන ඒ ඒ ආයතනයන්හි විෂය ක්ෂෙත්‍රයන් හරහා නගරයට යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් හා යෝජනා හඳුනා ගැනීමද මේ යටතේ සිදු කරන ලදි. පසුව පවත්නා තත්ත්වය විශ්ලේෂණය කර මැනවින් හඳුනාගන්නා ලදි.

#### ගැටළු හා විභවතා හඳුනා ගැනීම

ප්‍රාථමික හා ද්විතීයික දත්ත විශ්ලේෂණය කිරීමේදී හඳුනාගත් ගැටළු වලට අමතරව නාගරික පරිපාලන ආයතන, විවිධ සංවිධාන රැස්කොට පාර්ශවකරුවන්ගේ රැස්වීම (Stakeholder meeting) 2017 නොවැම්බර් මස 10 වෙනි දින පවත්වා නගරයේ ගැටළු හා විභවතා හඳුනාගන්නා ලදි. මීට අමතරව විධිමත් රැස්වීම් සේම හා ක්ෂෙත්‍ර පරීක්ෂණ කටයුතු වලදී නේවාසික හා සංක්‍රමණික ප්‍රජාව සමග අවිධිමත් ක්‍රමවේදය හරහා ද බදුල්ල නගරයේ පවත්නා ගැටළු හා විභවතා හඳුනාගන්නා ලදි.

### III. දැක්ම, අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම

හඳුනාගත් ගැටළු හා විභවතා සඳහා සංවර්ධන සැලසුම හරහා විසඳුම් සෙවීමට එම ගැටළු හා විභවතාවන්හි පවතින සුවිශේෂිතාවය (Significant) ඒවායේ සන්දර්භය (Context) අනෙකුත් ගැටළු හා විභවතා සමග ඒවායේ ප්‍රමාණාත්මක ස්වභාවය (Magnitude) මත විශ්ලේෂණය සිදු කර බදුල්ල නගරය සඳහා 2018-2030 කාල පරාසය සඳහා ළඟාකර ගැනීමට අපේක්ෂිත දැක්ම හා අරමුණු හා පරමාර්ථ සකස් කරන ලදි.

### IV. සවිස්තරාත්මක විශ්ලේෂණය

බදුල්ල සංවර්ධන සැලැස්ම 2030 දැක්මට අනුව සකස් කරන ලද අරමුණු අනුව ඒ ඒ අරමුණු ළඟා කර ගැනීමට පවත්නා ශක්තීන්, අවස්ථා හා දුර්වලතා බාධක හඳුනාගනිමින් ශඳුඅත විශ්ලේශණය(SWOT Analysis) ලදි. මීට අමතරව පාරිසරික සංවේදීතා අධ්‍යයනය (Sensitivity analysis), විභවතා අධ්‍යයනය (Potential analysis) ජීවත් වීමටසුදුසු පරිසර කලාප විශ්ලේෂණය(Livability analysis) සංවර්ධන පීඩන විශ්ලේෂණය (Development Pressure Analysis) දියබෙත්ම විශ්ලේෂණය (Watershed analysis) සිදු කරන ලදි.

### V. සැලසුම හා උපාය මාර්ග හඳුනා ගැනීම

හඳුනාගත් දැක්ම, අරමුණු හා පරමාර්ථ වලට අනුව කලාපීකරණ සැලැස්ම, යටිතල පහසුකම් සේවා සැලැස්ම, ආර්ථික සැලැස්ම, පාරිසරික තිරසාර සංවර්ධන සැලැස්ම පුරාවිද්‍යා හා උරුමයන් සංරක්ෂණය කිරීමේ සැලැස්ම හා යටිතල පහසුකම් සේවා සැලැස්ම තුලින් උපාය මාර්ගික සැලසුම් හා ව්‍යාපෘති සකස් කරන ලදි. එහිදි හඳුනාගත් ගැටළු හා විභවතාවයන්ගේ බලපෑමේ ප්‍රමුඛත්වය මත උපායමාර්ගික ව්‍යාපෘති පෙළ ගස්වන ලදි.

### VI. නිති රෙගුලාසි සකස් කිරිම

සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් පරිහරණයන් සඳහා වන නීති හා රෙගුලාසි සකස් කිරීම මෙහිදී සිදු කරන ලදි. මේ සඳහා දැනට පවත්නා සංවර්ධන සැලසුමෙහි භාවිතයේ යෙදවිය නොහැකි රෙගුලාසි වෙනස් කිරීමත්, තැනිතලා හා බෑවුම් ප්‍රදේශ වල ඉදිකිරීම් හා භූමි පරිහරණයන්හිදී විමසා බැලිය යුතු අත්‍යාවශ්‍ය තත්ත්වයන් සවිස්තරාත්මකව විශ්ලේෂණය කරමින් හා සාකච්ඡා කරමින් රෙගුලාසි සකස් කිරීම සිදු කරන ලදි.

### VII. අදහස් ලබා ගැනීම

සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර කෙටුම්පත් සැලැස්ම මහජන අදහස් දැක්වීම සඳහා යොමු කරනු ලැබේ. එහිදී පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමෙන් දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.

### VIII. දළ සැලසුම් වාර්තාව භාරදීම

අවසාන කෙටුම්පත් සංවර්ධන සැලැස්ම මහජන අදහස් විමසීමෙන් පසු එම යෝජනා හා අදහස්ද සහිතව සංශෝධනය කර ප්‍රධාන සැලසුම් කමිටුවට/සංවර්ධන සැලසුම් අංශය වෙත භාර දිය යුතුය.

### IX. අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම

ප්රධාන සැලසුම් කමිටුවෙහි අනුමැතියෙන් පසු ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබේ.

# 2. ප්‍රාථමික සමීක්ෂණ කටයුතු

## 2.1 අධ්‍යනය ප්‍රදේශ

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් අග නගරය ලෙස පරිපාලන සේවා කේන්ද්‍රකොට ගත් බදුල්ල හැදින්විය හැකිය. ග්‍රාමසේවා වසම් 29 කින් සැදුම්ලත් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටහිර කොටසට අයත් ග්‍රාම සේවා වසම් 13 කින් බදුල්ල මහ නගර සීමාව සමන්විත වේ. බදුල්ල නගරය උතුරු අක්ෂාංශ 6.5-7.1 ක් හා දේශාංශ 81.2-81.4 අතර පිහිටා ඇත.ඒ අනුව, බදුල්ල මහ නගර සීමාවට උතුරින් සොරණතොට ප්‍රාදේශීය සභාව , නගෙනහිරින් බදුල්ල ප්‍රාදේශීය සභාව, දකුණින් හා නැගෙනහිරින් හාලිඇල ප්‍රාදේශීය සභාව විසින් පාලනය සිදුවේ.

බදුල්ල මහ නගර සීමාව තුල නාගරික කොට්ඨාශ 15 ක් පවතින අතර, ග්‍රාම සේවා වසම් 13 කින් සමන්විත වර්ග කිලෝමීටර් 10.5 ක වපසරියක් මෙයට අදාල වේ.

*රූපය අංක 2.1 : බදුල්ල නගරයේ පිහිටීම*




මූලාශ්‍රය : Google Earth

## 2.2 සැලසුම් පසුතලය හා තත්ත්ව වාර්තාව

බදුල්ල සංවර්ධන සැලැස්ම සකස් වී ඇති අන්තර් ප්‍රාදේශීය සම්බන්ධතා කැටිකොටගත් සැලසුම් පසුතලය හා ප්‍රදේශය තුල පවත්නා භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික තත්ත්වයක් පිළිබඳ මේ යටතේ සාකච්ඡා කෙරේ.

2030 ජාතික භෞතික සැලැස්ම මගින් හඳුනාගෙන ඇති නාගරික ධූරාවලියට අනුව බදුල්ල යනු තුන්වන ගනයේ භාණ්ඩ හා සේවා සැපයෙන පළාත් අගනගරයකි. එසේම 2030 ඌව කලාපීය සැලැස්ම තුලින් කලාපයේ පළමු පෙල නගරයක් ලෙසත් හඳුනාගෙන ඇත. 2050 කෙටුම්පත් කර ඇති ජාතික භෞතික සැලැස්ම තුළද පළාත් අගනගරය ලෙස බදුල්ල හඳුනාගෙන ඇත.

ඒ අනුව 2010 මාර්තු මස 17 වන දින ප්‍රකාශයට පත් කරන ලද බදුල්ල සංවර්ධන සැලැස්ම කාලීන අවශ්‍යතාවන්ට අනුකූලව වෙනස් කර, තිරසාරවූ නාගරික ප්‍රදේශයක් බිහිකිරීමේ අරමුණින් බදුල්ල සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකර ඇත.

**දේශගුණික ලක්ෂණ හා භූ විෂමතාවය**

තෙත් හා වියළි අතරමැදි දේශගුණික කලාපයට අයත්වන බදුල්ල සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංක 24 ක පමණ අගයක් ගනී. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1885mm පමණ වේ. භූ විෂමතා ලක්‍ෂණ සැලකීමේදී බේසමක හැඩය ගත් නගර වඩා තැනිතලා ස්වරූපයක් ගනී. නගර මධ්‍ය උන්නතාංශය 680m ක් පමණ වන අතර, බෑවුම් ප්‍රදේශවලදී එය 800m දක්වා වූ උන්නතාංශයකට වෙනස් වේ.

**ඓතිහාසික විකාශය**

බදුල්ල පුරවරයේ ඓතිහාසික විකාශනය සලකා බැලීමේදී සියවස් ගණනාවකට එහා ගිය තොරතුරු හමුවේ. පුරාවිද්‍යාත්මක සාක්ෂි මත ලියවුණු ඌව වංශ කථාවට අනුව බදුල්ල නාමය මුලින්ම සඳහන් වනුයේ බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනේදීය. බුද්ධ වර්ෂ 18 වන සියවසේදී මණිඅක්ඛික නා රජුගේ ආරාධනයෙන් කැළණියට වැඩම කරන්නාවූ බුදුරජාණන් වහන්සේ ‘ඉන්දික’ නම් වූ ප්‍රාදේශීය පාලකවරයාගේ ආරාධනයෙන් බදුල්ලට වැඩම කරයි. එහිදී දැනට මුතියංගණ රජමහා විහාරය ආශ්‍රිතව සමවත් සුවයෙන් වැඩ සිටි බව කියවෙයි.

ඌව වංශ කථාවට අනුව බුද්ධ වර්ෂ 227 සිට ක්‍රිස්තු වර්ෂ 2017 එනම් දේවානම්පියතිස්ස රජ සමයේදී, බදුල්ල ආගමික නගරයක් ලෙස සලකා ඇත. එවකට උදයරාජ නම් ප්‍රාදේශීය පාලකවරයෙක් විසින් පාලනය කොට ඇත. එසේම, නගරය වටා ගලායන බදුළු ඔය ආශ්‍රිතව වැවද, වැවට ඔබ්බෙන් අද දක්වා පවතින මල්වත්තද පිහිටා තිබී ඇත.

මහනුවර රාජධානි සමයේදී බදුල්ල දෙවන අග නගරය ලෙස සලකා ඇත. ඌව විහාරවංශයේ සඳහන් වන පරිදි ක්‍රි.ව. 1548-1604 කාල සීමාවේදී ප්‍රාදේශීය පාලක වූ විමලධර්මසූරිය රජු කතරගම දේවාලය

ඉදිකරන ඇත. මෙම කාලයේදීම 32 ක ජනතාවක් නගරයට ආසන්නයේ කෝට්ටගොඩ නම් ග්‍රාමයේ පදිංචි වී ඇති බව ඌව වංශයේ සඳහන්ය.

*රූපය අංක 2.2 : ඓතිහාසික විකාශය*




*යටත්විජිත කාලයටපෙර (1505)*




*පෘතුගීසි හා ලංදේසි කාල සීමාව (1505-1815)*




*ඉංග්‍රීසි පාලන කාලය (1815-1948*




*නිදහසින් පසු කාලය (1948-1977)*




*වර්තමානය දක්වා(1977 ට පසු)*

මූලාශ්‍රය- එන්. රත්නායක(2009) සමාජයීය, භෞතික අංශ හා නගර සැලසුම් ව්‍යුහය අතර සහසම්බන්ධතා අධ්‍යනය

පෘතුගීසි හා ලන්දේසි පාලන තන්ත්‍රය මධ්‍යම කඳුකරය නතු නොවුවද, ප්‍රදේශයේ සමාජ හා ආර්ථික කටයුතු කෙරේ බලපෑමක් ඇති විය. එතෙක් බෞද්ධාගමික ජනගහනයක් සිටි නගරය ක්‍රිස්තියානි වැනි ආගමිකයන්ගේ සංක්‍රමණය සිදු වේ. ඒ හා සමානම නගරය තුල ඔවුන්ගේ ආගමික ස්ථාන ඇති කිරීමද සිදුවිය.

ප්‍රදෙශයේ සීඝ්‍ර ජනගහන වර්ධනයන් හා සේවා සුදුසුකම් ස්ථානයක් ලෙස බදුල්ල පත් වීමේ සුවිශේෂී කාල සීමාවක් ලෙස බ්‍රිතාන්‍ය පාලන කාලය හැඳින්විය හැකිය. 1815 න් පසු මුළු ලංකාද්වීපයම යටත් විජිත පාලන තන්ත්‍රයට යටත්විය. එහිදී බදුල්ල යනු ප්‍රදේශයේ ප්‍රධාන පරිපාලන නගරය ලෙසත්, ආර්ථික

මධ්‍යස්ථානයක් ලෙසත් වර්ධනය කර ඇත.කච්චේරිය, උසාවි සංකීර්ණය හා බදුල්ල මහ රෝහල වැනි රාජ්‍ය ආයතන හා සේවා ස්ථාන රැසක් පිහිටුවා ඒ හා සමානව ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කර ඇත. විශේෂයෙන්ම පස්සර ප්‍රදේශයේ තිබූ තේ ප්‍රවාහනය උදෙසා බදුල්ල-කොළඹ දුම්රිය මාර්ගයද බිහිවනුයේ මේ අවදියේදීය.

එවකට වෙළඳාම සම්බන්ධ කටයුතු සඳහා මුස්ලිම් හා මෝ ජනවාර්ගිකයින් වැඩි වශයෙන් දායක වී ඇත. ඔවුන්ගේ වාසස්ථාන බදුළුපිටිය ආශ්‍රය කරගෙන පිහිටුවා ගත්හ.එසේම ක්‍රිස්තියානි ජනතාව මහිංගනය මාර්ගය ආශ්‍රය කොට ගෙන වාසස්ථානද ඒ ආශ්‍රිතව ඔවුන් ආගමික ස්ථානද පිහිටුවා ගත්හ. ඒ හා සමානව මිෂනාරි පාසල්ද බිහි වේ.

නිදහසින් පසු කාල සීමාව තුළදී එතෙක් නගර මධ්‍යයට පමණක් වූ රාජ්‍ය ආයතන නගරය වටාද පිහිටුවන ලදි.ඉංගීසි පාලන කාලය තුල බිහිවූ මිෂනාරි පාසල් බෞද්ධ පුනරුදයේ බලපෑමෙන් බෞද්ධාගමික පාසල් බවට හැරවේ. එසේම හින්දු, මුස්ලිම් පාසල් ද ඇතිවේ.

නගරය ආශ්‍රය කොට සිටි දමිළ ජනතාවගෙන් වැඩි පිරිසක් සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම (1967) මත නැවත ඉන්දියාවට යැවීම නිසා නගරයේ ජනගහනය සැලකිය යුතු ලෙස අඩු විය. පසු කාලීනව නගරයේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනවල සේවය කරන බොහෝ පිරිසක් ආශ්‍රිතව පදිංචි විය. මෝ සහ මුස්ලිම් ප්‍රජාව බදුළුපිටියේද, ක්‍රිස්තියානි ප්‍රජාව මහියංගණ මාර්ගය දෙපසද, සිංහල ප්‍රජාව පිංඅරාව, කණුපැලැල්ල වැනි ග්‍රාම ආශ්‍රිතව ද නව වාසස්ථාන පිහිටුවා ගත්හ.

**ප්‍රාදේශීය හා අන්තර් සහ සම්බන්ධතාවය**

බදුල්ල නගරය පේරාදේණිය-බදුල්ල-චෙන්කල්ලඩි A5 ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන සංධිස්ථානයක් ලෙස පවතී. එසේම උඩරට දුම්රිය මාර්ගයේ අවසාන දුම්රිය ස්ථානය ලෙසද බදුල්ල දුම්රිය ස්ථානය පවතී. ඒ අනුව ප්‍රදේශයේ හා ප්‍රදේශයට පිටපතින් පවතින ප්‍රදේශ සමඟත් සබඳතාවය පවත්වා ගැනීමට මෙම ප්‍රවාහන මාධ්‍ය දෙකම උපයෝගී වී ඇත.බදුල්ල නගරය හරහා ප්‍රධාන මාර්ග හතරක් හඳුනාගත හැකිය.

- බදුල්ල - බණ්ඩාරවෙල මාර්ගය(A5)
- බදුල්ල - චෙච්චැල්හින්න මාර්ගය
- බදුල්ල - පස්සර මාර්ගය(A5)
- බදුල්ල - මහියංගණ මාර්ගය(B36)

දෛනිකව මෙම මාර්ග ඔස්සේ විශාල ජනගහනයක් නගරයට භාණ්ඩ හා සේවා සපයා ගැනීම උදෙසා පැමිණෙති.පළාත් අග නගරය ලෙස බදුල්ල සේවා හා භාණ්ඩ සැපයීම ඌව පළාතට පමණක් නොව අම්පාර මඩකලපුව දක්වාත්, බලංගොඩ දක්වාත් පුළුල් වේ. එහිදී බදුල්ල මහ රෝහල සුවිශේෂී සේවා සැපයුම් ස්ථානයක් වේ.

*රූපය අංක 2.3 : බදුල්ල නගරයේ සේවා සැපයුම් වපසරිය*




මූලාශ්‍රය : Google Earth

**ජනගහනය**

2016 බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩට අනුව මුළු ජනගහනය 48,641 කි. මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1,036 කි. ඒ අනුව නගර සීමාවේ ජන ඝණත්වය හෙක්ටයාර් එකකට දළ වශයෙන් 44.6 කි.ජනගහන වර්ධන වේගය සැලකීමේදී 2001-2012 දත්ත අනුව 0.25% ක වර්ධන වේගයක් පෙන්නුම් කරයි. නමුත් එය 2012-2016 හා සැසදීමේදී එය 3.8% ක අගයක් ගනී. ඒ අනුව මෙම කාලසීමාව තුළ නගරයට පිටතින් පැමිණ ස්ථිර පදිංචිකරුවන් වූ ප්‍රමාණය ඉහළ බව පෙනී යයි. නමුත් ජනගහන වර්ධන වේගය ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සලකන විට බදුල්ල නැගෙනහිර, බදුල්ල මධ්‍යම වසම්හි ඍණ වර්ධනයක් පෙන්නුම් කරයි. ආයතනික හා වාණිජ භාවිතාවන්ට මෙම වසම්හි පවත්නා නේවාසික භාවිත වෙනස් කිරීමේ ප්‍රවණතාවය එයට හේතුවයි.

එසේම ජන ඝනත්වය සැලකීමේදී (සම්පත් පැතිකඩ 2016 - බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) ඉහළ ජනඝනත්වයක් බදුල්ල උතුර, කනුපැලැල්ල හා බදුළුපිටිය යන වසම් ආශ්‍රිතව හඳුනාගත හැකිය. නමුත් බදුළුපිටිය හා කයිලගොඩ වසම්වල පවත්නා කුඩා භූමි ප්‍රමාණයන්හි ඇති කම්කරු නිවාස ආශ්‍රිත කොටස්වලද ඉහළ ජනඝනත්වයක් ඇත. (සිතියමඅංක 2.1)

සිතියම අංක 2.1 : බදුල්ල ජන ඝනත්වය



ස්ත්‍රී පුරුෂ ජනගහනය අනුව ජනගහනයේ පැතිරීම සලකන විට ස්ත්‍රී ජනගහනය 25840 ක්, එනම් 53% ක් හා පිරිමි ජනගහනය 22301 එනම් 47% වශයෙනි. එසේම රැකියා නියුක්තිය අනුව ජනගහනය සලකන විට 11% ක් රජයේ රැකියාවැති හා 13% පෞද්ගලික රැකියාවල සේවය කරයි. 37% ක ජනගහන ප්‍රතිශතයක් කෘෂිකාර්මික කටයුතුවලද 20% වාණිජ කටයුතු ආශ්‍රිතව සේවය කරයි.

ජන වර්ගය අනුව ජනගහනයේ පැතිරීම සලකන විට සිංහල, ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ වැනි සියලුම ජන වර්ගයන්ගෙන් සමන්විතය. බහුතර ජන වර්ගය වනුයේ 34,258 ක් වූ සිංහල වන අතර එය මුළු ජනගහනයෙන් 70% ක් වේ.දෙවනියට වැඩිම ජන වර්ගය වනුයේ 7,940 ක් වූ මුස්ලිම් යෝනක වන අතර එය ප්‍රතිශතාත්මකව 16.32% ක් වේ. එසේම ලංකා දෙමළ 3,603 ක් හා ඉන්දියානු දෙමළ 2,252 ක් වන අතර ප්‍රතිශතාත්මකව පිළිවෙලින් 7% ක් හා 4.6% ක් වේ.

**සංසරණ ජනගහනය**

නාගරික සංවර්ධන අධිකාරියේ ඌව පළාත් කාර්යාලය හා බදුල්ල ප්‍රවාහන අධිකාරිය විසින් 2017 වසරේදී සිදුකරන ලද සංසරණ ජනගහනය හැසිරීම හා ප්‍රමාණය සම්බන්ධ සමීක්ෂණවලට අනුව 100,000 ක පමණ ජනගහනයක් බදුල්ල නගරයට දෛනිකව සංක්‍රමණය සිදුවේ. එහිදී නගරයේ නේවාසික ප්‍රජාව සහ නගරයට පිටතින් සිටින ජනතාව ප්‍රධාන කරුණු 3 කේන්ද්‍ර කරගෙන පැමිණෙති.

*වගුව අංක 2.1 : නගරයට පැමිණෙන සංක්‍රමණික ජනගහනය වර්ගීකරණය*

| අනු අංකය | අංශය | සංක්‍රමණිකයන්ගේ ප්‍රතිශතාත්මක ප්‍රමාණය |
|---|---|---|
| 1 | අධ්‍යාපනය | 22% |
| 2 | සෞඛ්‍යතත්ව | 18% |
| 3 | ආයතන | 8% |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියඌව පළාත් කාර්යාලය,2017

**භූමි පරිහරණ රටාව**

බදුල්ල මහ නගර සභා සීමාවේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 10.5 කි. භූමි පරිහරණ රටාවට අනුව නේවාසික භාවිතය උදෙසා 62% ක භූමි ප්‍රතිශතයක් වෙන්ව ඇත. නගර මධ්‍යයේ භූමි කොටස් සෞඛ්‍ය, ආයතනික, විනෝද කටයුතු හා වාණිජ සේවා උදෙසා වෙන්ව ඇත.(සිතියම අංක 2.2)

නගරයේ පවත්නා භූමි පරිහරණ රටාව සැලකීමේදී 70% කට ආසන්න භූමි ප්‍රමාණයක් එනම් අක්කර 1876 ක් මේවන විට සංවර්ධිත මට්ටමේ පවතී. මීට අමතරව සංවර්ධන කාර්යයට යොදා ගැනීම සඳහා උචිත මට්ටමේ පවතින බිම් කොටස් අක්කර 278 ක් එනම් පවත්නා මුළු භූමි ප්‍රමාණයෙන් 10% ක බිම් කොටස් පවතී. නමුත් දැනට සංවර්ධිත මට්ටමේ පවතින අක්කර 1876 ක භූමි ප්‍රමාණයේද සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් රජයේ ඉඩම් වන අතර, එයිනුත් ඉඩම් කොටස් කිහිපයක්ම ඌණ සංවර්ධිත මට්ටමේ පවතී.

සිතියම අංක 2.2 : බදුල්ල භූමි පරිහරණ රටාව




එසේ ඌණ සංවර්ධිත මට්ටමේ පවතින රජයේ ඉඩම් ලෙස,

i. නිවාස සංවර්ධන අධිකාරියට අයත් නගර මධ්‍යයේ ඉඩම්
ii. ආණ්ඩුකාර කාර්යාලය පිටුපස කොටස
iii. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිටුපස කොටස
iv. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් කොටස්
v. නගර මධ්‍යයේ පවතින දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් (බන්ධනාගාරය පිටුපස, කණුපැලැල්ල පාර නිල නිවාස)
vi. බදුළුපිටිය පාර මහ නගර සභා නිල නිවාස ඉඩම් කොටස්
vii. පුරා විද්‍යාත්මක සංරක්ෂණ ගණයට වැටෙන මේවන විට භාවිතයේ නොමැති ඉඩම්.

**ඉඩම් හිමිකාරිත්වය**

බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දත්ත අනුව මහ නගර සීමාවේ ඉඩම් හිමිකාරිත්වය පහත ආකාරයට බෙදා වෙන් කල හැකිය.

*වගුව අංක 2.2 : බදුල්ල නගරයේ ඉඩම් හිමිකාරිත්වය*

| හිමිකාරිත්වය | ප්‍රතිශතාත්මක ප්‍රමාණය |
|---|---|
| රජය | 20% |
| බදුල්ල කතරගම දේවාලය | 11% |
| මුතියංගන රජමහා විහාරය | 0.1% |
| පෞද්ගලික | 62% |
| වෙනත් | 7% |

මූලාශ්‍රය :බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2017

මෙහිදී නගර මධ්‍යයේ පවත්නා බදුල්ල දකුණු වසමෙහි ඉඩම් වලින් 60% ක ප්‍රතිශතයක්ව බදුල්ල කතරගම දේවාලය සතුය. මෙම කලාපය තුල බදුල්ල වාණිජ සේවා වැඩි වශයෙන් ඒකරාශි වී ඇත.

**ජලවහන රටාව**

බදුල්ල නගර සීමාව තුල ඇති සුවිශේෂීතම අංගයක් ලෙස බදුළු ඔය හැඳින්විය හැකිය. මීට අමතරව කුඩා ඔය හා රඹුක්පොත ඔය බදුළු ඔයට බදුල්ල නගර සීමාව තුලදී එකතු වේ. එසේම නගරය වටා විහිද පවතින කඳු වැටි ආශ්‍රය කරගෙන බදුළු ඔයට වැටෙන වාරි ඇලවල් සහ ස්වභාවික කඳුරු රාශියකින් බදුල්ල මහ නගර සීමාව සමන්විතය. නගරය පුරාම නල ජලය හරහා ජල සම්පාදනය සිදුවුවද මෙම ස්වභාවික ජලධරයන් ආශ්‍රය කොටගෙන තම දෛනික කටයුතු සිදුකරන ජනතාවක්ද සිටී. (සිතියම අංක 2.3)

**ආර්ථික පදනම**

ඓතිහාසික විකාශනය සැලකීමේදී වුවද බදුල්ල යනු පරිපාලන සේවා කේන්ද්‍රකොටගත් සේවා නගරයකි. නමුත් ආර්ථිකය අතීතයේදී කෘෂිකර්මය මත රදා පැවතුනි. ජනප්‍රවාද වලට අනුව බදුල්ල අතීතයේදී වැවකින් සමන්විතවූ අතර, වැව ආශ්‍රය කරගෙන වී වගාවෙන් ස්වයංපෝෂිතව ජනාවාස පැවතුනි. නමුත් මේවන විට කුඹුරු ඉඩම් සඳහා පවතින ආර්ථික ඵලදායීතාව හීන වී ගොස් පරිපාලන ආයතන හා සෞඛ්‍ය

සිතියම අංක 2.3 : බදුල්ල ජලවහන රටාව



සේවා වෙත එම ශ්‍රම බලකාය ඇදී ගොස් ඇත. ඒ අනුව, කුඹුරු ඉඩම් සීඝ්‍රයෙන් ගොඩකිරීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව වාණිජ කලාපය තුල පවත්නා බහුතර වාණිජ කටයුතු පරිපාලන හා සෞඛ්‍ය

සේවයේ නියුක්ත ප්‍රජාවටත් එම සේවය ලබාගැනීමට පැමිණෙන ජනතාවටත් 62% ක් වූ භූමි පරිහරණයක් නියෝජන කරන නේවාසික ප්‍රජාවගේ දෛනික අවශ්‍යතා මත පදනම් වේ. නමුත් කෘෂිකර්මාන්තය පිළිබඳ සැලකීමේදී බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු කුඹුරු ඉඩම් වලින් 31.4% කට නියෝජනය වනුයේ බදුල්ල මහ නගර සීමාව තුලයි. නමුත් මේවන විට කෘෂිකාර්මික ආර්ථිකය අභිබවා සේවා සැපයුම් පදනම් වූ තෘතියික ආර්ථික රටාවක් බිහිවී ඇත.

**මාර්ග හා ප්‍රවාහනය**

මහ නගර සීමාව තුල පවත්නා මාර්ග ජාලය වගුව අංක 2.3 ආකාරයට වර්ගීකරණය කල හැකිය.

*වගුව අංක 2.3 : බදුල්ල නගරයේ මාර්ග වර්ගීකරණය*

| මාර්ග වර්ගය | මාර්ග සංඛ්‍යාව | මාර්ගයන්හි දිග |
|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය | 6 | 14.1km |
| පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 3 | 5.4km |
| බදුල්ල මහ නගර සභා මාර්ග | 129 | 84.7km |

මූලාශ්‍රය : මා.සං.අ. හා බදුල්ල මහ නගර සභාව

එසේම නගරයේ බෑවුම් ප්‍රදේශවල පවත්නා භූගෝලීය විෂමතාව හේතුවෙන් බහුතර මාර්ගයන් පඩිපේලි වීමද සුවිශේෂී ලක්ෂණයකි. (සිතියම අංක 2.4).

බදුල්ල ප්‍රවාහන අධිකාරියේ හා බදුල්ල ගමනා ගමන මණ්ඩලයේ 2016 දත්ත අනුව දිනකට නගරයට පැමිණෙන හා පිටවන පොදු බස්රථ ප්‍රමාණයක් පහත පරිදි වේ.

*වගුව අංක 2.4 : බදුල්ල නගරයට පැමිණෙන හා පිටවන පොදු බස්රථ ප්‍රමාණය*

| දිශාව | බස්රථ ගණන |
|---|---|
| නගරය තුලට | 789 |
| නගරයෙන් පිටතට | 810 |

මූලාශ්‍රය : ඌව පළාත් ප්‍රවාහන අධිකාරිය හා බදුල්ල ගමනා ගමන මණ්ඩලය, 2016

දුම්රිය සේවය සැලකීමේදී උඩරට දුම්රිය මාර්ගයේ අවසන් දුම්රිය ස්ථානය ලෙස දිනකට දුම්රිය වාර 5 ආරම්භ කිරීමත් දුම්රිය වාර 5 අවසන් වීමත් සිදුවේ.

**ජල සම්පාදනය**

බදුල්ල මහ නගර සීමාවේ ජීවත් වන මුළු පවුල් සංඛ්‍යාව 12,452 ක් වන අතර, එයින් 11,891 එනම් 40% ක්ම නල ජලය මත පදනම්ව ඇත. ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වනුයේ බදුළු ඔයයි. (සිතියම අංක 2.5)

**විදුලි සැපයුම**

බදුල්ල විදුලිබල මණ්ඩලයේ දත්ත විමසා බැලීමේදී බදුල්ල මහ නගර සීමාවේ 99.5% කට විදුලිබලය ලබාදී ඇත. මුළු සේවා සැලසුම් ලාභීන් ගණන 12, 385 ක් වේ. නගරය මධ්‍යයේ ග්‍රිඩ් උපපොලක් පිහිටා ඇති අතර, ට්‍රාන්ස්ෆෝමර් 51 ක් සහිතය. (සිතියම අංක 2.6)

සිතියම අංක 2.4 : බදුල්ල මාර්ග ව්‍යාප්තිය



සිතියම අංක 2.5 : බදුල්ල ජල සැපයුම




**Water Supply**
**Badulla Munucipal Council Area**

*Source : Water Supply & Drinage Board-Badulla*

Urban Development Authority
June 2017

*Uva Provincial Office*

*Badulla Developm ent Plan ( 2017-2030 )*

සිතියම අංක 2.6 : බදුල්ල විදුලිබල සැපයුම



**සෞඛ්‍ය සේවා**

බදුල්ල නගර සීමාව තුල පවත්නා සුවිශේෂීතම සේවා අංශය ලෙස සෞඛ්‍යසේවා හැදින්විය හැකිය. එහිදී රජයේ සෞඛ්‍ය සේවා ලෙස බදුල්ල පළාත් මහ රෝහල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සහ ආයුර්වේද සෞඛ්‍ය සේවා පවතී. මීට අමතරව පෞද්ගලික රෝහල්, රසායනාගාර, වෛද්‍ය උපදේශන මධ්‍යස්ථාන රැසක් බදුල්ල මහ රෝහල ආශ්‍රය කරගෙන ස්ථානගතව පවතී. (සිතියම අංක 2.7)

යටත්විජිත කාලය තුල එනම් 1891 තරම් වූ ඈත කාලයක සිට බදුල්ල රෝහල ප්‍රදේශයේ රෝග නිවාරණය උදෙසා සේවයක නිරත වෙයි. අක්කර 9 ක වපසරියක බදුල්ල මහ රෝහල පැතිර පවතී. මේ තුලින් බදුල්ල නගර සීමාවට පමණක් නොව ඌව පළාතටම සේවා සපයනු ලබයි. සේවා සැපයීමේ වපසරිය ඌව පළාත් මායිමටත් ඔබ්බෙන්වූ මඩකලපුව දක්වා විහිදී ඇත.

*රූපය අංක 2.4: බදුල්ල මහ රොහලේ පිහිටීම*




මූලාශ්‍රය : Google Earth

මේ හේතුව මත දෛනිකව නගරයට පැමිණෙන සංක්‍රමණික ජනගහනයෙන් 22% ක පමණ ප්‍රතිශතයක් බදුල්ල මහ රෝහල කේන්ද්‍ර කර පැමිණෙයි. බදුල්ල මහ රෝහල දැනට පවත්නා වෛද්‍ය සේවක සංයුතිය පහත පරිදි වේ.

***වගුව අංක 2.5 : බදුල්ල මහ රෝහලේ වෛද්‍ය සේවක සංයුතිය***

| කාර්යය මණ්ඩලය | ප්‍රමාණය |
|---|---|
| විශේෂඥ වෛද්‍ය | 41 |
| සාමාන්‍ය වෛද්‍ය | 201 |
| හෙදියන් | 604 |

මූලාශ්‍රය: බදුල්ල මහ රෝහල - 2016

බදුල්ල මහ රෝහලේ වාට්ටු 42 ක් දැනට ක්‍රියාත්මක වේ. දැනට පවත්නා ඇඳන් සංඛ්‍යාව 1,493 ක් වන අතර, සාමාන්‍ය ඇඳන් අත්පත් කර ගැනීමේ අනුපාතිකය 82% ක් වේ. නමුත් කායික රෝගී වාට්ටුවල පවත්නා ඉඩකඩ සෑම දිනකම සීමිත බව වාර්තා වී ඇත.

සිතියම අංක 2.7 :බදුල්ල සෞඛ්‍ය සේවා සැපයුම් ස්ථාන



**ඝන හා ද්‍රව කසල කළමනාකරණය**

මහ නගර සභාව 70 % ක පමණ ප්‍රදේශයක කුණු කසල එකතු කිරීම සිදු කරනු ලබයි. එනම් මහ නගර සභාව යටතේ පවතින කොට්ඨාශ 15 න් කටුපැලැල්ල සහ පිටවෙලගම කොට්ඨාශයේ කොටසක් හැර අනෙකුත් සෑම ප්‍රදේශයකම කසල එකතු කිරීම සිදු කරයි. බදුල්ල මහ නගර සභාව විසින් 1964 වසරේ සිටම කසල බැහැර කරනු ලබන්නේ රේස්කෝස් පිටිය ආසන්නයේ පහත් බිමකටය. අක්කර 5 ක පමණ වපසරියක පැතිරී ඇති මෙම භූමිය බදුල්ල උද්භිත උද්‍යානයටත් වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගණයටත් මැදිව පිහිටා ඇත. කසළ එකතු කිරීම දිරාපත් වන හා දිරාපත් නොවන ලෙස වර්ගීකරණයට ලක් කළද එය නියමාකාරයෙන් සිදු නොවේ. බදුල්ල මහ නගර සභාවේ දත්ත අනුව දිනකට කසළ ටොන් 25-28 අතර ප්‍රමාණයක් එකතු වේ. එම කසළ ප්‍රමාණය පහත ආකාරයට වර්ගීකරණය කළ හැකිය.

***වගුව අංක 2.6 : බදුල්ල නගරයේ කසළ වර්ගීකරණය***

| | **වර්ගය** | **ප්‍රමාණය (ටොන්)** |
|---|---|---|
| 1 | නේවාසික | 11 |
| 2 | වාණිජ | 10 |
| 3 | රෝහල (දිරාපත් වන) | 2 |
| 4 | කර්මාන්ත | 1 |
| 5 | වෙනත් (ආපනශාලා, රජයේ ආයතන...) | 1 |
| | **එකතුව** | 25 |

මූලාශ්‍රය: බදුල්ල මහ නගර සභාව,2017

බදුල්ල නගර සීමාව තුල අප ජලය කළමනාකරණ කිරීම සඳහා ක්‍රමවේදයක් නොමැත. බදුල්ල පළාත් මහ රෝහලින් නිකුත් කෙරෙන අප ජලය සඳහා ද්‍රව කළමනාකරණ පද්ධතියක් පැවතුනද එයද මේ වන විට ප්‍රමාණවත් නොමැත. බදුල්ල නගර මධ්‍යයේ පසෙහි ජලය උරා ගැනීමේ මට්ටම අඩු මට්ටමක් පැවතීම හේතුවෙන් අප ජලය කෙලින්ම බදුළු ඔයට එක්වීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව නගරයේ සීඝ්‍රයෙන් සිදුවන අවම ප්‍රමිතිගත ඉඩම් අනුබෙදුම් හරහා නගර මධ්‍යයේ එක්වන අප ජලය ප්‍රමාණය ගැටළුකාරි තත්ත්වයකට පත්ව ඇත.

ජී. කුමාරතිලක, වයි. ජයවර්ධන, ඩබ්. දිසානායක යන පර්යේෂකයන් විසින් 2015 ව්‍යුහාත්මක ඉංජිනේරු හා ඉදිකිරීම් කළමනාකරණ පිළිබඳ අන්තර්ජාතික සමුළුවේදී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ රෝහල් තුනකින් නිකුත්වන අප ජලය පිළිබඳ පර්යේෂණ වාර්තාවට අනුව බදුල්ල පළාත් මහ රෝහලින් නිකුත් කෙරෙන අප ජලයෙහි රසායනික හා අසාත්මිකභාවය ඉහළ මට්ටමක පවතී. ඒ අනුව බදුල්ල මහා රෝහලේ එකතු වන කසල අතරින් එසේ පිරිපහදු කිරීමට ලක් නොවන අප ජලය නගරයට ගැටළුකාරි තත්ත්වයකට පත්ව ඇත.

**අධ්‍යාපනය**

නගරය තුල දියුණු අධ්‍යාපනික ආයතන හා පාසල් පිහිටා ඇති අතර ජාතික පාසල් 4 ක් හා පළාත් මට්ටමේ පාසැල් 29 ස්ථානපිතව ඇත. එසේම පෞද්ගලික අමතර පංති සහ පිරිවෙන් අධ්‍යාපනය සඳහාදබදුල්ල නගරය ජනප්‍රිය වේ. ගුරු සිසු අනුපාතය 17.6 ක් වේ. මීට අමතරව, තෘතීයික අධ්‍යාපනික ආයතන ලෙස තාක්ෂණික ආයතන, විවෘත විශ්ව විද්‍යාල හා උසස් තාක්ෂණික විද්‍යාලද ඇත. බදුල්ල මහ නගර සීමාවට අයත් නොවුවද ඉතා ආසන්නයේම පිහිටා ඇති ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හේතුවෙන් ප්‍රදේශයේ අධ්‍යාපන ප්‍රගමණයකට එය හේතු විය.

**වාණිජ කටයුතු**

බදුල්ල නගරයේ නේවාසික ජනගහනයට සහ නගරයට පිටතින් පැමිණෙන ජනතාවගේ වාණිජ අවශ්‍යතා සපරාලනු වස් වාණිජ කලාප කිහිපයක්ම නගරයේ පිහිටා ඇත. මුළු වර්ග ප්‍රමාණයෙන් අක්කර 25ක භූමි ප්‍රමාණයක පැතිර පවතී.

ප්‍රධාන වශයෙන් වාණිජ කලාප ලෙස නගර මධ්‍යය පහළ වීදිය, බසාර් වීදිය, දකුණු පටුමඟ, රජ මාවත, කොකෝවත්ත මාර්ගය, දුම්රිය ස්ථාන මාර්ගය ආදිය හඳුනාගත හැකිය. එසේම බදුල්ල මහ රෝහල ආශ්‍රිතව වෙලේකඩේ වාණිජ කලාපයත්, පුවක්ගොඩමුල්ල වාණිජ කලාපයත් ස්ථානගතව ඇත. මේ හැරුණුකොට නේවාසික කලාප ආශ්‍රයෙන් කුඩා ප්‍රමාණයේ වාණිජ ස්ථාන පිහිටා ඇත. වාණිජ කලාප ආශ්‍රිතව හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණය වනුයේ, නගරය තුල හා නගරයට එදිනෙදා පැමිණෙන ජනගහනයට අවශ්‍ය වන භාණ්ඩ අලෙවිය සඳහා මූලික ස්ථානයක් ගනී. එහිදී විශාල පරිමාණයේ භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන නගරය තුල පිහිටා නොමැත. බදුල්ල නගරයට සාපේක්ෂව බණ්ඩාරවෙල නගරයට වාණිජ වශයෙන් ඒකරාශී වීමක් ඇත.

*රූපය අංක 2.5 : පහළ රජ වීදිය හා බසාර් වීදිය වාණිජ කටයුතු*







ග්‍රහණය : නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

නගර සීමාව තුල කර්මාන්ත ව්‍යාප්තියක් නොමැත. වේවැල්හින්න මාර්ගය දෙපස, තේ කර්මාන්ත ශාලාවක් සහ ශ්‍රී ලංකා මධ්‍යසාර සංගමයේ කර්මාන්ත ශාලාවක් පිහිටා ඇත. එසේම බදුල්ල උතුර ග්‍රාම සේවා වසම ආශ්‍රිතව බෙදා හැරීමේ මධ්‍යස්ථාන පිහිටා ඇත.

එසේම බදුල්ල සති පොල නගරයෙන් මදක් ඈත්ව දුම්රිය නැවතුම්පොල ආශ්‍රිතව පිහිටා ඇත. මේ හේතුවෙන් නගරයට පැමිණෙන බොහෝ දෙනෙක් සති පොලට නොගොස් නගර මධ්‍යයේ පොදු වෙළඳසලින් තම අවශ්‍යතා සපුරා ගැනීමට පෙළඹීමක් ඇත.

එසේම නගර මධ්‍යයේ ඇති වාණිජ ස්ථාන මිශ්‍රව පැවතීමක් ඇත. මේ හේතුවෙන් බසාර් වීදිය හා පහළ වීදිය ආශ්‍රිතව රථ වාහන තදබදයක් හඳුනාගත හැකිය. මීට අමතරව රාජ්‍ය හා පෞද්ගලික බැංකු, මූල්‍ය ආයතන කොකෝවත්ත හා බැංකු පාර ආශ්‍රිතව ස්ථානගතව ඇත.

### රාජ්‍ය හා පෞද්ගලික ආයතන

බදුල්ල නගරය තුල පවත්නා සුවිශේෂිතම භූමි පරිහරණ රටාව ආයතනයයි. රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික වශයෙන් හා පළාත්මය, දිස්ත්‍රික්කමය හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් යුත් ප්‍රධාන ආයතන රැසක් නගරය තුල ස්ථාපිත වී ඇත. එහිදී ඌව පළාත් සභාව, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සුවිශේෂී තැනක් ගනී. එසේම රජයේ හා පෞද්ගලික බැංකු ගණනාවක් බදුල්ල පහළ රජ වීදිය හා බැංකු පාර ආශ්‍රිතව ස්ථානගතව ඇත.

එසේම ආයතන කලාපය ආශ්‍රිතව හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණයක් වනුයේ, බොහෝ රාජ්‍ය ආයතන පුරාවිද්‍යාත්මකව වැදගත් සංරක්ෂිත ගොඩනැගිලි තුල පිහිටා ඇත. බදුල්ල කච්චේරිය, බදුල්ල මහ නගර සභාව, පුරාවිද්‍යා කාර්යාලය එහිදී සුවිශේෂී තැනක් ගනී. නමුත් රාජ්‍ය ආයතන මැවින් ස්ථානවල පිහිටා තිබීම හේතුවෙන් ආයතන සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවන මට්ටමක් ඇත.

### පාරිසරික තත්ත්වය

නගරය තුල පවතින පාරිසරික තත්ත්වය සැලකීමේදී ස්වභාවික මිනිසා විසින් නිර්මිත පාරිසරික තත්ත්වයන් හඳුනා ගත හැකි ස්වභාවික පරිසරය සැලකීමේදී ස්වභාවික ආපදා විශ්ලේෂණය කළ යුතු වෙයි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට අනුව බදුල්ල මහ නගර සීමාවේ භූමි ප්‍රතිශතයෙන් 30% ක් නාය යෑමේ ආපදාවට ලක්විය හැකි ප්‍රදේශ වේ. එසේම බදුල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුව බදුළු එය හා කුඩා ඔය ආශ්‍රිතව ගං වතුර ඇති විය හැකි ස්ථාන 16 ක් හඳුනාගෙන ඇත.

නිර්මිත ස්වභාවික පරිසර තත්ත්වයන් සැලකීමේදී බදුල්ල උද්භිද උද්‍යානය, සේනානායක උද්‍යානය සහ නගරය පුරා විසිර පවතින ක්‍රීඩා පිටි පිහිටා ඇත. දැනට විනෝද කටයුතු සඳහා වෙන්ව පවතින නිර්මිත පරිසර ප්‍රදේශ ප්‍රමාණය හෙක්ටයාර් 16.3 ක් පමණ වේ.

## 2.3 සැලසුම් සීමා නිර්ණය කිරීම

බදුල්ල සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් නගරයේ භූගෝලීය පිහිටීම (Geographical Boundary), ක්‍රියාකාරීත්වමය පිහිටීම (Functional Boundary) සහ පරිපාලනමය සීමාවන් (Administrative Boundary) සැලකිල්ලට ගන්නා ලදි.

### භූගෝලීය පිහිටීම - (Geographical Boundary)

භූගෝලීය පිහිටීම සැලකීමේදී බේසමක හැඩයගත් සුවිශේෂී භූ විෂමතාවයක් බදුල්ල නගරය සතුය. නගරය හරහා බදුළුඔය ගලායන අතර, නමුණුකුල හා තවත් කඳුවැටිකිහිපයකින් නගරය වටවී ඇත. නගර මධ්‍ය තැනිතලා මදරැලි සහිත ස්වභාවයක් ගන්නා අතර, එය 680m පමණ උන්නතාංශ අගයක පිහිටා ඇත. පවත්නා භූ විෂමතාවයනගරයේ ව්‍යාප්තිය සීමා කිරීම සඳහා දැඩි ලෙස හේතු සහගත වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස නගර මධ්‍යයේ සංවර්ධනය කල හැකි ඉඩම් සීමා සහිත වීමත්, එම ඉඩම්වල වාණිජමය වටිනාකම ඉහල අගයක් ගැනීමත් සිදුවී ඇත. එසේම මෙම ඉහල ඉඩම් වටිනාකම් මත නේවාසික භාවිතය සඳහා කඳු බෑවුම් ප්‍රදේශවල ඉඩම් යොදා ගැනීමේ ප්‍රවණතාවයක්ද ඇතිවී ඇත. නමුත් භූ විෂමතාවය මත නාගරික සීමාව මධ්‍යයට සංකේන්ද්‍රණය වූ ස්වභාවයක් ගනී.

*රූපය අංක 2.6 : බදුල්ල නගරය*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

### ක්‍රියාකාරීත්වමය පිහිටීම (Functional Boundary)

බදුල්ල නගරයේ ක්‍රියාකාරීත්වමය සීමාව සැලකීමේදී නගරය තුලින් ලබා දෙන සෞඛ්‍ය හා පරිපාලන සේවා කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කල යුතුය. පරිපාලන කටයුතු සිදුකරන ආයතනික ව්‍යුහය පළාත්මය, දිස්ත්‍රික්කමය හා ප්‍රාදේශීය යන තෙවැදෑරුම් මට්ටමේ සේවා සපයනු ලැබේ. මේනිසා මුළු ඌව පළාතේම ආයතනික සේවා උදෙසා දෛනිකව සංක්‍රමණය වන ජනගහනයක් සිට මීට අමතරව සෞඛ්‍ය සේවය පිළිබඳ සැලකීමේදී බදුල්ල පළාත් මහ රෝහල ඌව පළාතට පමණක් නොව නැගෙනහිර පළාතේ මඩකලපුව, අම්පාර වැනි ප්‍රදේශ කරාද සේවය ලබාදෙයි.

ඒ අනුව ක්‍රියාකාරිත්වමය සීමාව පුළුල් වපසරියක් දක්වා විහිද පවතී.

*රූපය අංක 2.7 :බදුල්ල නගරයේ සේවා සැපයුම් වපසරිය*




මූලාශ්‍රය : Google Earth

**පරිපාලන සීමාව (Administrative Boundary)**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බටහිර මායිමට වන්නට බදුල්ල මහ නගර සභාව ග්‍රාම නිලධාරී වසම් 13 කින් සමන්විතව පිහිටා ඇත. එම ග්‍රාමසේවා වසම් පහත පරිදි වේ. (සිතියම අංක 2.8)

1. බදුල්ල උතුර
2. බදුල්ල නැගෙනහිර
3. බදුල්ල බටහිර
4. බදුල්ල මධ්‍යම
5. බදුල්ල දකුණ
6. පිටවෙලගම
7. කටුපැලැල්ල
8. මැදපතන
9. හිඳගොඩ
10. බදුළුපිටිය
11. හිඟුරුගමුව
12. කණුපැලැල්ල
13. කයිලගොඩ

මෙම පරිපාලන සීමාව සඳහා වර්ග කිලෝමීටර් 10.5 ක් ඇතුලත් වන අතර, මෙම ප්‍රදේශය 1979 ජූලි 01 වන දින සිට නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලදි.

ඉහත සඳහන් කරුණු අධ්‍යයනය කිරීමෙන් පසු භූගෝලීය තොරතුරු විශලේෂණ පද්ධති(Geographic Information System) හරහා සංවර්ධන පීඩන විශලේෂණය(සිතියම අංක 2.9) හා ගොඩනැගිලි ඝනත්ව විශලේෂණය (සිතියමඅංක 2.10) සිදුකරන ලදි. මෙම විශ්ලේෂණයන් තුලින් ලබාගත් අවසන් නිගමනය වූයේ ක්‍රියාකාර්තවමය සීමාව ඌව පළාතට එහා ගිය සීමාවක් දක්වා පැතිර පැවතුනද සංවර්ධන නැඹුරුතාවය භූගෝලීය පිහිටීම හා පරිපාලන සීමාවට පමණක් සීමාවන බවයි. ඒ අනුව සැලසුම් සීමාව සඳහා පරිපාලන සීමාව වූ බදුල්ල මහ නගර සභා සීමාව තෝරා ගන්නා ලදි.

සිතියම අංක 2.8 : බදුල්ල නගර සීමාව



සිතියම අංක 2.9 : සංවර්ධන පීඩන විශලේෂණය



සිතියම අංක 2.10 : ගොඩනැගිලි ඝනත්ව විශලේෂණය




**Building Density- 2017**
**Badulla Municipal Council Area**

Urban Development Authority
September 2017

*Badulla Urban Development Plan ( 2017-2025 )*

*Uva Provincial Office*

## 3. නගර සංවර්ධන සැලැස්ම යාවත් කාලීන කිරීමේ අවශ්‍යතාවය

සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ඒ සඳහා පාදක කරගත් අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජයීය, ආර්ථික හා පාරිසරික තත්ත්වයන් පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකරන ලදි. පසුව එම අධ්‍යයනයෙන් සොයා ගන්නා ලද ගැටළු හා විභවතාවයන් අතරින් සංවර්ධන සැලසුමක් හරහා සංවර්ධන කල හැකි විභවතා හා මගහැරවිය හැකි ගැටළු හඳුනාගන්නා ලදී.

### I. රැකියා පදනම් කරගෙන සිදුවන සීඝ්‍ර ජනගහන වර්ධනය

ඌව පළාතේ ප්‍රධාන අගනගරය වීම හේතුවෙන් පළාත්මය, දිස්ත්‍රික්කමය හා ප්‍රාදේශීය වශයෙන් පවතින ආයතනවල සේවය ලබාගැනීමටත් හා තම දෛනික අවශ්‍යතා වෙනුවෙන් බදුල්ලට පැමිණෙන ජනගහනය 100,000 කට පමණ ආසන්නය.

2001 – 2012 දක්වා වූ ජනගහන වර්ධන වේගය සැලකීමේදී බදුල්ල නගරයේ ජන ගහන වර්ධන වේගය 0.4% ක් වේ. නමුත් 2012 සිට 2016 දක්වා අවුරුදු 4 ක කාල සීමාවේදී වර්ධන වේගය 3.2% ක පමණ ඉහල අගයක් ගනී. බදුල්ල දිස්ත්‍රික්කයේ සාමාන්‍ය ජනගහන වර්ධන වේගය 0.37% ක් වන අතර, ඒ හා සාපේක්ෂව බදුල්ල නගරය තුළට පදිංචිය සඳහා සිදුවන සංක්‍රමණික ජනගහනය සැලකිය යුතු මට්ටමක පවතී.

එහිදී සුවිශේෂී තත්ත්වයක් වනුයේ එලෙස පදිංචිය සඳහා පැමිණෙන බහුතරය රැකියා පදනම් කරගෙන සිදුවන සංක්‍රමණ වේ. එනම් මධ්‍යම හා ඉහල සමාජ තලවලට අයත් බහුතරය ඒ අතර වේ. වර්තමානය වන විට බදුල්ල නගරයේ නඩුකාරකන්ද, කටුපැලැල්ල, පිං ආරාව හා බදුල්ල බටහිර හිඟුරුගමුව වැනි ප්‍රදේශවලට එවැනි මධ්‍යම පාන්තික ජනගහනයේ පදිංචිය සඳහා වැඩි නැඹුරුතාවයක් පෙන්වයි. ඒ අනුව, එලෙස පදිංචි වී ඇති මධ්‍යම පාන්තික හා ඉහල සමාජ පාන්තික ජනගහනයේ ඉල්ලුමට සරිලන ආකාරයේ අධ්‍යාපනික, විනෝද කටයුතු, වාණිජ හා සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මීට අමතරව කනුපැලැල්ල , හිඳගොඩ වැනි ප්‍රදේශවලද මෙසේ රැකියා පදනම් කරගත් මධ්‍යම පාන්තික ජනගහනය බහුතරයක් සිටී. එසේම වාණිජ හා සෞඛ්‍ය සේවාවන්හි ප්‍රගමනය උදෙසා සේවය ලබා දෙන කම්කරු ප්‍රජාව බදුළුපිටිය හා කයිලගොඩ ආශ්‍රිතව තම පදිංචිය පිහිටුවා ගැනීමේ ප්‍රවණතාවයක් පවතී. කෙසේ වුවත් පවත්නා නගර සීමිත ඉඩකඩ සමග නගරය පුරාම විහිදුන මධ්‍යම පාන්තික ජනගහනයක් හඳුනා ගත හැකිය.

ඒ අනුව පරිපාලන හා සෞඛ්‍ය සේවා ලබාගැනීමට පැමිණෙන ජනගහනයටත්, ඒ ආශ්‍රිත රැකියාවේ නියුක්ත ප්‍රජාවටත්, නේවාසික ප්‍රජාවටත්, දෛනික කටයුතු සඳහා නගරයට සංක්‍රමණය වන සාමාන්‍ය ජනතාවටත් යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් ඇති කිරීමේ අවශ්‍යතාවය පවතී. 2010 ගැසට් කර ප්‍රකාශයට පත්කරන ලද බදුල්ල සංවර්ධන සැලැස්මෙහි දැක්ම වූයේ පරිපාලන ආයතන කේන්ද්‍ර කොටගත් සේවය අඛණ්ඩව පවත්වා ගෙන යමින් සේවා නගරයක් ඇති කිරීමයි. නමුත් සෞඛ්‍ය සේවා අංශයද නගරයේ ක්‍රියාකාරිත්වය උදෙසා එක් වී තිබීම හේතුවෙන් පවත්නා නගර සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කර, ප්‍රධාන පරිපාලන හා සෞඛ්‍ය සේවා යන අංශ දෙකෙන්ම සංවර්ධනය වන නගරයක් කරා මග පෙන්වන නගර සංවර්ධන සැලසුමක් අවශ්‍ය වී ඇත.

## II. නගරය තුල යටිතල පහසුකම්වල අවිධිමත්භාවය

### (අ) ඝන හා ද්‍රව කසල කළමනාකරණයේ පවතින දුර්වලතා

බදුල්ල මහ නගර සභාව විසින් සිදුකරන කසල කළමනාකරණ මේවන විට උග්‍ර ගැටළුකාරී තත්ත්ව කිහිපයකට පත්ව ඇත. දැනට එකතු කරන කසල ප්‍රමාණයෙන් 20% ක කොටසක් දිරාපත් වන දිරාපත් නොවන යන වෙන්කිරීමට භාජනය නොකර, එකතු කරනු ලබයි. ඒ අනුව දිනකට එසේ එක්වන කසල ප්‍රමාණය කිසිදු වර්ගීකරණයට ලක් නොවී කසල අංගනය තුලම පවතී.

*රූපය අංක 3.1 : බදුල්ල කසළ අංගනය*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

එසේම 2014 සිට මේ දක්වා කසල අංගනය තුල ගොඩ ගසා පවතින විකිණීමට හෝ ප්‍රතිචක්‍රීකරණයට භාජනය කල නොහැකි ශේෂ කසල ගොඩ ගසා ඇත. මේ අනුව ප්‍රදේශය පුරා අධික දුරගන්ධයක් හමා යැමටද මෙය හේතු වී ඇත. කසල අංගනය බදුල්ල ප්‍රධාන ක්‍රීඩා කටයුතු සිදුකරන වින්සන්ඩ් ඩයස් ක්‍රීඩාංගන පරිශ්‍රයට හා බදුල්ල උද්භිද උද්‍යානයට මැදිව පිහිටා තිබීම හේතුවෙන් එම ස්ථානයන්ගේද කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය හීන වීමට මෙය හේතු වී ඇත.

එසේම දැනට නගරයේ උත්පාදන වන අප ජලය කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් නොමැත. එම හේතුව මත පොදු ජල කාණුවලට අපජලය කෙලින්ම හරවා යැමත්, එම ජලය බදුළු ඔයට එක් වීමත් දක්නට හැකිය. ඒ අනුව බදුළු ඔය දැඩි දූෂිත ජල ධරයකට මේවන විට හිමිකම් කියයි. නමුත් ප්‍රධාන ජල මූලාශ්‍රයක් ලෙස පවතින බදුළු ඔය ආශ්‍රය කරගෙන බොහෝ ප්‍රජාවක් තම දෛනික සේදුම් කටයුතු සිදුකිරීම රෝග ව්‍යාප්තිය වැඩිකර ඇත.

*රූපය අංක 3.2 : බදුළු ඔයට එක්වන අප ජලය*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

**(ආ) පදිකයන් සඳහා පවතින ප්‍රවේශ මාර්ගයන්හි ඇති දුර්වලතා.**

නගරය පරිපාලන අගනගරය නිසාවෙන් නගරය පුරා විසිරි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය හා පෞද්ගලික කාර්යාල රැසක් ස්ථානගතව ඇත. දිනකට 100,000 ක පමණ සංක්‍රමණික ජනගහනයක් නගරයට පැමිණෙන අතර, මෙම ජනගහනයෙන් බහුතරයක් ආයතන වලින් සේවා ලබාගැනීමටත්, සෞඛ්‍ය සේවා ලබාගැනීමටත් පැමිණෙන පිරිස වේ. එසේම නගරයට පැමිණෙන බහුතරයක් පොදු ප්‍රවාහන සේවය භාවිතා කිරීමත්, පරිපාලන ආයතන නගරය පුරා විසිර පැවතීමත් හේතුවෙන් පදිකයන් සඳහා මාර්ගවල පවතින පහසුකම් වැඩිදි කිරීමට අවශ්‍ය වී ඇත.

## III. නගර මධ්‍යයේ පවත්නා ඉඩම්වල ඌණ භාවිතය.

දීර්ඝ ඓතිහාසික විකාශනයකට උරුමකම් කියන බදුලු පුරවරයේ නගර මධ්‍යයේ බොහෝ පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන පවතී. බදුල්ල පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලයේ දත්ත අනුව බදුල්ල මහ නගර සීමාව තුල පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන 30 ක් පවතී. එම බොහෝ පුරාවිද්‍යා ගොඩනැගිලිවල රාජ්‍ය ආයතන පිහිටුවා ඇත. අනෙකුත් ගොඩනැගිලි කිසිදු මැදිහත්වීමකින් තොරව ගරා වැටෙමින් පවතී. එසේ ගරා වැටෙන බොහෝ ගොඩනැගිලි නගර මධ්‍යයේ පවත්නා ඉඩම්මිල අධික භූමි භාගයන්හි ස්ථානගතව ඇත. නමුත් ඉඩම් හිමිකාරිත්වය හා පුරාවිද්‍යාත්මක තත්ත්වයන් මත එම ගොඩනැගිලිවලට කිසිදු මැදිහත්වීමක් නොමැත.

*රූපය අංක 3.3: නගර මධ්‍යය ඌණ සංවර්ධන මට්ටමේ පුරාවිද්‍යා ස්මාරක*



*තල්දෙන වලව්ව*



*කොතලාවල වලව්ව*



*සළු සල ගොඩනැගිල්ල*




*වෙලේ කඩේ බලකොටුව*

ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය හා අන්තර්ජාලය ඇසුරිනි

මීට අමතරව රාජ්‍ය ආයතන හා පාසල් රැසක් නගර මධ්‍යයේ පිහිටා ඇත. ඒවායින් බොහොමයක් ඌණ සංවර්ධිත මට්ටමේ අත්හැර දැමූ රාජ්‍ය දේපල ලෙස පවතී. උදාහරණ ලෙස: බදුළුපිටිය නිල නිවාස, බන්ධනාගාරය පිටුපස දුම්රිය දෙපාර්තමේන්තු ඉඩම, කණුපැලැල්ල පාර දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල නිවාස, ග්‍රීන් ලේන් ඩ්‍රයිව් පිහිනුම් තටාක අසල ගොඩනැගිල්ල, බදුල්ල තානායම් පරිශ්‍රය හැදින්විය හැකිය.

එසේම නගරයේ වාණිජ වටිනාකමින් ඉහල අගයක් සහිත ඉඩම්වල බන්ධනාගාරය, පාසල් වැනි ආයතන පිහිටා ඇත. එම හේතුවෙන් නගරයේ අනවශ්‍ය වාහන තදබදයක් ඇති වීමටද හේතු වී ඇත. ඒ අනුව, නගරයේ පවත්නා සීමිත ඉඩකඩ සාර්ථකව සංවර්ධන කාර්යයට යොදා ගැනීමේ අවශ්‍යතාව මතු වී ඇත.

## IV. නගරයේ පවතින අනවසර ඉදිකිරීම්.

නගරයේ සංවර්ධනය උදෙසා මග පෙන්වීමක් සිදුකරන නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් බදුල්ල නගරයේ ඇති අනවසර ඉදිකිරීම් ඉහල මට්ටමක පවතී. එම අනවසර ඉදිකිරීම් දැනට පවත්නා සංවර්ධන සැලසුමෙහි පිරිවිතර වලට අනුව නීත්‍යානුකූල කිරීමේ හැකියාවක්ද නොමැත. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතුව වනුයේ නගර මධ්‍ය ඉඩම්වලට පවතින ඉල්ලුම ඉහල වීමත් බොහෝ ඉඩම්වල හිමිකම මුතියංගන රජමහා විහාරස්ථානය හා කතරගම දේවාලය සතුවීමත්ය. ඒ අනුව අනුමත අවම කට්ටිවලට ප්‍රමාණයට වඩා අඩුවෙන් බිම් කට්ටි වීමේ ඉහල ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව, අනාගත නිවැරදි දැක්මට අනුව යමින් අනවසර ඉදිකිරීම් සඳහා මූල හේතූන් මග හරවමින් විධිමත් භෞතික සැලසුමක අවශ්‍යතාවය පවතී.

## V. සීඝ්‍රයෙන් සිදුවන පාරිසරික හායනය.

මෙහිදී නගරයේ භූ විෂමතාව පිළිබද වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වේ. බේසමක හැඩය ගත් නගර සීමාවේ නගර මධ්‍ය තැනිතලා ස්වභාවයක් ගනී. ඈත අතීතයේ සිටම වී වගාව ප්‍රචලිතව පැවති බදුළු ඔය හා වර්තමාන රේස්කෝස් පරිශ්‍රය වැවකින් සමන්විත විය. එහිදී කදුකර ප්‍රදේශය සිට ගලා එන ජලය බදුළු ඔයට එක්වීමට මත්තෙන් ජල රදවන ස්ථාන ලෙස පවතින කුඹුරු ඉඩම්වලට ගොස් පසුව බදුළු ඔයට එක් විය. නමුත් සීඝ්‍රයෙන් සිදුවන කුඹුරු ඉඩම් ගොඩකිරීම නිසා එසේ පැවතුන ජල රදවන ස්ථාන රැසක් නගරයට අහිමි වී ඇත. ඒ අනුව, ගංවතුර තත්ත්වයක් ඇතිවීමටත් මෙය හේතු වී ඇත. 2000 වසරේදී මහා නගර සභා සීමාව තුළ කුඹුරු ඉඩම් අක්කර 332 පැවති අතර, වර්තමානයේදී එය අක්කර 247 දක්වා අඩු වී ඇත. එම කුඹුරු ඉඩම් වලිනුත් අක්කර 63 ක ප්‍රමාණයක් මේවන විට අත්හැර දමා ඇත.

මීට අමතරව ස්වභාවික කඳුරු හා වාරි ඇලවල් හරස් කරමින් සිදුකරන අක්‍රමවත් ඉදිකිරීම් නිසාවෙන්ද වර්ෂා කාල වලදී ක්ෂණික ගංවතුර තත්ත්ව ඇතිවීමට හේතු වී ඇත.

*රූපය අංක 3.4 : කුඹුරු ඉඩම් ගොඩකර සිදුවන ඉදිකිරීම්*



*2000* *2010* *2017*

මූලාශ්‍රය : Google Earth

නගර මධ්‍යයේ ඉඩම් මිල ඉහල වීමත්, වාණිජ භාවිතයට ඒවා යොදා ගැනීමත් නිසාවෙන් කඳුකර ප්‍රදේශවල නේවාසික භාවිතය සඳහා ඇති ඉල්ලුම වැඩි වී ඇත. මේ වන විට බොහෝ කඳුකර බෑවුම් ප්‍රදේශවල අක්‍රමවත් ලෙස ඉදිකිරීම් සිදුකිරීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව නා යෑම් ඇතිවීමේ ආපදා තත්ත්වයකටද පත්ව ඇත.

*රූපය අංක 3. 5 : කඳුකර ප්‍රදේශවල සිදු වන නේවාසික භාවිත*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

ඉහත සඳහන් කල පාරිසරික හායනයන් මත නගරයට මේ දක්වා පැවති පාරිසරික තිරසාරභාවය හීන වී ගොස් ඇත. ශ්‍රී ලංකාවේ මධ්‍යම පාරිසරික තිරසාරභාවය හීන වී ගොස් ඇත. ශ්‍රී ලංකාවේ මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට අයත් නගරයක් ලෙස පාරිසරික තිරසරභාවය ඇතිකිරීමේ අවශ්‍යතාවය

# දෙවන කොටස

## අමාත්‍යවරයාගේ අනුමැතිය

## ගැසට් නිවේදනය

# 4. සංවර්ධන සැලසුම් රාමුව

## 4.1 දැක්ම

*ඌව නීල හරිත මිටියාවතේ පරිපාලන හා සුව සේවා නගරය*

## 4.2 දැක්මෙහි ප්‍රකාශනය

*ඌව නීල හරිත මිටියාවත*

කඳුකර ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදී තත්ත්වය මත පවතින්නාවූ ඌවේ ජල ධරයන් හා කඳුවැටි වලින් වට වූ බේසමක හැඩය ගත් තැනිතලා භූමි ප්‍රදේශය මෙයින් අදහස් වේ. එනම් බදුල්ල නගරයේ බදුළු ඔය ආශ්‍රිත පාරිසරික තත්ත්වයන් හා ඒ වටකර පිහිටියාවූ නමුණුකුල ඇතුළු කඳුවැටියත් අන්තර්ගත භූ විෂමතාවය මෙයින් නිරූපිතය.

*පරිපාලන හා සුව සේවා නගරය*

බදුල්ල නගරයට ඇති වැදගත්ම අංශ හා නගරයේ ක්‍රියාකාරිත්වයේ පදනම ලෙස සැලකෙන පරිපාලන, සෞඛ්‍ය සේවා කටයුතු හා නගරයේ අපේක්ෂිත සපිරිමත් ජීවන පරිසරය මෙයින් අදහස් කෙරේ. බදුල්ල පළාත් මහ රෝහල හා ඒ ආශ්‍රිත සෞඛ්‍ය කටයුතුත්, ඌව පළාතේ පරිපාලන කටයුතු වල නියැලෙන සියළුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන මෙයට අදාල වේ. මීට අමතරව පවත්නා හා අපේක්ෂිත නේවාසික ජනගහනයට යටිතල පහසුකම්වලින් සපිරි නේවාසික පරිසරයත් නිරූපණය කෙරේ.

ඌව පළාතේ පරිපාලන සේවා හා සෞඛ්‍ය සේවා අතර අග නගරය ලෙස සැලකෙන බදුල්ල මේ වන විටත් සේවා අංශයෙන් ඉහල සංවර්ධනයක් ලබා ඇත. ඒ අනුව අවශ්‍යතා අතර අත්‍යාවශ්‍ය සේවා ලෙස සැලකෙන සෞඛ්‍ය සේවා හා පරිපාලන සේවා ලබාදෙන බදුල්ල නගරය තුල නේවාසික හා වාණිජ ඉල්ලුම සීග්‍රයෙන් ඉහල ගොස් ඇත. මේ නිසා ඉල්ලුමට අනුව සිදුවන සංවර්ධන කටයතු වල සැපයුමේදී පාරිසරික තිරසරභාවය ගැටළුකාරි තත්ත්වයකට පත්ව ඇත. ඒ අනුව පාරිසරික සංවේදී කලාප තිරසාර ලෙස ආරක්ෂා කරමින් හා සංරක්ෂණය කරමින් පරිපාලන සේවා හා සෞඛ්‍ය සේවා සඳහා පවතින සංවර්ධනය ගුණාත්මක හා ප්‍රමණාත්මක ලෙස වැඩි දියුණු කළ, පවතින හා අපේක්ෂිත ජනගහනයට සරිලන යටිතල පහසුකම්වලින් සපිරි බදුල්ල නගරයක් 2030 දී අපේක්ෂිතය.

## 4.3 අරමුණු

අරමුණු 1: කලාපයේ පරිපාලන හා සෞඛ්‍ය සේවා කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම

අරමුණු 2: මනා යටිතල පහසුකම්වලින් සපිරි නගරයක් බවට පත්කිරීම

අරමුණු 3: පාරිසරික තිරසාර සංවර්ධනය

අරමුණු 4 : බදුල්ල උරුමයන්ගේ අනන්‍යතාවය සුරැකීම

## 4.4 පරමාර්ථ

**අරමුණු 1 : කලාපයේ පරිපාලන හා සෞඛ්‍ය සේවා කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම**

i. 2030 වන විට වෙලේකඩේ හන්දිය සිට බදුළුපිටිය දක්වාත්, තානායම් හන්දිය සිට මහියංගන පාර දෙපස වාණිජ හා ආයතනික භාවිතයන් මිශ්‍ර තීරයන් දෙකක් ප්‍රවර්ධනය කිරීම තුළින් ආයතන අතර පවත්නා සහ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම.

ii. 2030 වන විට බදුල්ල මහ රෝහල් පරිශ්‍රය හා ඒ අවට, කැප්පෙටිපොල මාර්ගය, මැදිරිය මාර්ගය ආශ්‍රිතව සෞඛ්‍ය සේවා පහසුකම් කලාපයක් ප්‍රවර්ධනය තුලින් බදුල්ල කලාපයේ සෞඛ්‍ය සේවා සැපයුම්කරු බවට පත් කිරීම.

iii. 2030 වන විට අංශක 30 ට වැඩි බෑවුම් භූමි ප්‍රදේශ තුල පරිපාලන සේවා ස්ථාන ඇතිකිරීම පාලනය කිරීම තුලින් නගර මධ්‍යයට සංකේන්ද්‍රණය වූ සංවර්ධනයක් ඇති කිරීම.

iv. 2030 වන විට තනායම් හන්දිය සිට පහළ වීදිය- බැංකු පාර - රජ වීදිය අතර වූ වපසරිය නගරයේ ප්‍රධාන වාණිජ භාවිතය සඳහා වූ මධ්‍යගත ප්‍රදේශය බවට පත් කිරීම

v. 2030 වන විට බදුළුපිටිය සිට වෙලගෙදර- දයාගුණසේකර මාවත දක්වා වූ තීරයට සංකේන්ද්‍රිත අධ්‍යාපන ආයතන හා සෞඛ්‍ය හා පර්යේෂණ අංශයේ සංවර්ධනයක් ඇති කිරීම.

**අරමුණු 2 : මනා යටිතල පහසුකම්වලින් සපිරි නගරයක් බවට පත්කිරීම**

i. 2025 වන විට ආයතනික, සෞඛ්‍ය, විවේකී ස්ථාන හා නේවාසික කලාප අතර පවත්නා සංචලතාවය සැහැල්ලු දුම්රිය ප්‍රවාහනයෙන්(LRT), පටුමග හා මාර්ග සංවර්ධනය තුලින් සම්බන්ධ කිරීම හා වැඩි දියුණු කිරීම.

ii. 2025 වන විට පහළ විදිය වාණිජ සේවා මාර්ගය ආශ්‍රිතව වීථි නියාමයක් (Streetscape guideline) සිදු කිරීම තුලින් නගර අලංකරණය හා පදික පහසුව වැඩි කිරීම

iii. 2025 වන විට තානායම් හන්දිය සිට රජ වීදිය තැපැල්හල මාර්ගය- රේස් කෝස් පාර දක්වාත්, තානායම් හන්දිය සිට රේස් කෝස් පාර- කොස්ගස් හන්දිය දක්වාත්, බැංකු පාර සිට කොස්ගස් හන්දිය දක්වාත් හරිත පදික මංතීරු ඇති කර නගරයේ පදික සංචලනය වර්ධනය කිරීම

iv. 2025 වන විට බදුළුපිටිය නාගරික නිවාස කලාපය සඳහා නාගරික පුනර්ජීව සංවර්ධන වැඩපිළිවෙලක් ඇති කිරීම.

v. 2020 වන විට නගර මධ්‍ය ප්‍රදේශය සඳහා අඛණ්ඩව හා දියුණු කළ අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.

vi. 2020 වන විට බදුල්ල නගරයේ අප ජලය බැහැර කිරීම හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ භෞතික යටිතල පහසුකම් 100%කින් ප්‍රවර්ධනය කිරීම.

vii. 2025 වන විට නගර මධ්‍යය පවත්නා වෙලේකඩේ පැරණි බලකොටුව, සළුසල ගොඩනැගිල්ල, තල්දෙන වලව්ව, කොතලාවල වලව්ව යන පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථානයන්හි භාවිතයන්ට අනුකූල ලෙස භාවිතයන් වෙනස් කර සංවර්ධනය කිරීම

viii. 2025 වන විට නගරය තුළට හා නගරයෙන් පිටතට ඒකාබද්ධ වූ කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම

ix. 2025 වන විට නගරය තුළ පිහිටි ඒ හා බී ශ්‍රේණියේ මාර්ග ආශ්‍රිතව විදුලි බල හා සංනිවේදන සේවා සඳහා සේවා තීර ඇති කිරීමෙන් යටිතල පහසුකම්වල විධිමත්භාවය ඇති කිරීම.

**අරමුණු 3 : පාරිසරික තිරසාර සංවර්ධනය**

i. 2030 වන විට ගහ රක්ෂිතය, කුඹුරු ඉඩම් සංරක්ෂණය හරහා බදුළු ඔය හා එහි ජල ධාරය ආරක්ෂා කිරීම.

ii. 2030 වන විට අංශක 30 ඉහල භූමියන්හි සංවර්ධන කටයුතු සීමා කිරීම හා පහළ බෑවුම් ප්‍රදේශයන්හි පවත්නා සංවර්ධනය පාලනය කිරීම තුලින් ස්වභාවික අවදානම් කලාප ආරක්ෂා කිරීම

iii. 2025 විනෝද හා විවේකී පහසුකම් අවශයතාවය 80% ක් ඇති කිරීම තුලින් නේවාසික හා සංක්‍රමණික ජනතාවගේ විවේකී පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

**අරමුණු 4 : බදුල්ල උරුමයන්ගේ අනන්‍යතාවය සුරැකීම**

i. 2030 වන විට ආගමික හා සංස්කෘතිමය වටිනාකමින් යුත් ස්ථාන සංරක්ෂණය කිරීම.

ii. 2030 මුතියංගණ රජ මහා විහාරය ආශ්‍රිතව භූ දර්ශනය නියාමනය තුළින් අනන්‍යතාවය සුරුකීම.

iii. 2025 වන විට පවත්නා භාවිතයන්ට අනුකූල ලෙස හඳුනාගත් පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථානයන්හි භාවිතයන් වෙනස් කර සංවර්ධනය කිරීම.

- වෙලේකඩේ පැරණි බලකොටුව
- සළුසල ගොඩනැගිල්ල
- තල්දෙන වලව්ව
- කොතලාවල වලව්ව

## 5. සවිස්තරාත්මක විශ්ලේශණ සාරාංශය

බදුල්ල නගර සංවර්ධන සැලසුමෙහි දැක්ම ළඟා කර ගැනීම සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා ක්‍රම දෙකක් උපයෝගී කර ගන්නා ලදි. එනම්,

- ශදුඅත විශ්ලේශන ක්‍රම වේදය (SWOT Analysis)
- සංවර්ධන පීඩන විශ්ලේශන ක්‍රම වේදය (Development Pressure Analysis)

## 5.1 ශුදුඅත විශ්ලේශන ක්‍රම වේදය (SWOT Analysis)

**අරමුණු 1 : කලාපයේ පරිපාලන හාසෞඛ්‍ය සේවා කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම**

*වගුව අංක 5.1: අරමුණු අංක 1 ශුදුඅත විශ්ලේශණය*

| | | | |
|---|---|---|---|
| **ශක්තීන්** | I. ඌව පළාතේ ප්‍රධාන අගනගරය වීම.<br>II. පරිපාලන සංකීර්ණ පැවතීම.<br>III. සේවා අංශයේ නියුක්ත නේවාසික ජනගහනයක් පැවතීම<br>IV. බදුල්ල පළාත් මහ රෝහල ඇතුළු සෞඛ්‍ය ආයතන රැසක් පිහිටා තිබීම<br>V. ජාතික හෙද පුහුණු ආයතනය පිහිටා තිබීම<br>VI. දේශීය වෛද්‍ය සේවා ස්ථාන පැවතීම<br>VII. දියුණු වාණිජ සේවා ස්ථාන පිහිටා තිබීම<br>VIII. සෞඛ්‍ය සේවා අංශය පුළුල් කිරීමට අවශ්‍ය ඉඩකඩ පැවතීම<br>IX. සංවර්ධනය කළ හැකි ඉඩම් ව්‍යාප්තිය<br>X. නගරය තුළ පිහිටා ඇති අධ්‍යාපනික ආයතන | **දුර්වලතා** | I. රජයේ ආයතන පවත්නා ස්ථාන දුරස්ථව පැවතීම<br>II. ආයතන පවත්නා ස්ථාන සම්බන්ධව නිවැරදි මග පෙන්වීමක් නොමැති වීම<br>III. බදුල්ල මහ රෝහලට පවත්නා ඉඩකඩ සීමිත වීම<br>IV. රෝහලට පැමිණෙන රෝගීන්ට හා ජනතාවට අවශ්‍ය විවේකි ස්ථාන නොමැති වීම<br>V. රෝගීන්ට හා ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට ඒකාබද්ධ ස්ථානයක් නොමැති වීම |
| **අවස්ථා** | i. බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් දක්වා වර්ධනය කිරීමට රජයේ පවත්නා යෝජනා<br>ii. රැකියා පදනම් කරගෙන සේවා අංශයේ රැකියාවල ඉහළ හා මධ්‍යම පාන්තික ජනතාව පදිංචිය සඳහා බදුල්ලට සංක්‍රමණය වීම | **බාධක** | |

## ශක්තීන්

### i. ඌව පළාතේ ප්‍රධාන පරිපාලන අග නගරය වීම

ඉතිහාසයේ පටන්ම ඌව පළාතේ ප්‍රධාන පරිපාලන කටයුතු සිදු වූයේ බදුල්ල නගරය ආශ්‍රය කරගෙනය. එකී ඓතිහාසික ස්ථානය අද දක්වාම බදුල්ල නගරය සතුව පවතී. ඒ අනුව පළාත් වශයෙන්, දිස්ත්‍රික් වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් ආයතන 57ක් පිහිටා ඇත. බදුල්ල පළාත් සභාව, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය ඌව පළාත් කාර්යාලය, භූ විද්‍යා හා පතල් කාර්යාංශය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන එහි ලා ප්‍රධාන වේ.

**රූපය අංක 5.1 : ප්‍රධාන පරිපාලන සංකීර්ණ**



ඌව පළාත් සභාව



කච්චේරි සංකීර්ණය

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

බදුල්ල නගරයක් ලෙස ක්‍රියාකාරි වීම සඳහා පවතින්නා වූ සුවිශේෂිතම හේතුව පරිපාලන කටයුතු වේ. දෛනිකව නගරයට පැමිණෙන සංක්‍රමණික ජනගහනය 100,000 ක් පමණ වන අතර එයිනුත් 30% ක්ම නියෝජනය වනුයේ ආයතන සඳහා සේවා සැපයීමට හා සේවා ලබාගැනීමට පැමිණෙන ප්‍රජාවගෙනි. ඒ අනුව, බදුල්ල නගරයේ ප්‍රධානතම ශක්තියක් ලෙස ප්‍රධාන පරිපාලන අග නගරය වීම හැඳින්විය හැකිය.

මීට අමතරව ප්‍රධාන ගණයේ පාසැල් රැසක් පිහිටා ඇත. බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය, ධර්මදූත පිරිමි විද්‍යාලය, විහාරමහාදේවී බාලිකා විද්‍යාලය වැනි සිංහල මාධ්‍ය පාසල්, දෙමළ බාලිකා මහා විද්‍යාලය, සරස්වතී දෙමළ මහා විද්‍යාලය හා අල් අදාන් මධ්‍ය මහා විද්‍යාලයද පාසැල් අතරින් සුවිශේෂී වෙයි.

### ii. පරිපාලන සංකීර්ණ පැවතීම (Administrative Complexes)

පළාත් අග නගරය ලෙස පවතින බදුල්ලේ රාජ්‍ය ආයතන බොහොමයක් ආයතන සංකීර්ණ ලෙස පවතී.ඌව පළාත් සභාව සංකීර්ණ දෙකකටත්, බදුල්ල කච්චේරි පරිශ්‍රයත් එහි ලා ප්‍රධාන වේ. මීට අමතරව පළාත්මය, දිස්ත්‍රික්කමය හා ප්‍රාදේශීය වශයෙන් කටයුතු කරන්නාවූ විවිධ දෙපාර්තමේන්තු එක් පරිශ්‍රයක ඒවායේ සියළු අංග අනුබද්ධවද පවතී එහිදී ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැපැල්හල සංකීර්ණය, සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහාන මණ්ඩලය හැඳින්විය හැකිය.

*රූපය අංක 5.2 : නගරයේ ඇති පරිපාලන සංකීර්ණ කිහිපයක්*



තැපැල් කාර්යාල පරිශ්‍රය



ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරෙන්

### iii. සේවා අංශයේ නියුක්ත නේවාසික ජනගහනයක් පැවතීම

බදුල්ල නගර සහා සීමාව තුළ මුළු නේවාසික ජනගහනය 2017 සම්පත් පැතිකඩට අනුව 48,641 කි. මෙම මුළු ජනගහනයෙන් 40% ක පමණ ජනතාවක් කිසියම් හෝ රැකියාවක නියුක්ත වේ. ඒ අනුව ග්‍රාම සේවා වසම් අනුව රැකියාවල නියුක්ත නේවාසික ජනගහනය වගු අංක 5.2 දැක්වේ.

*වගුව අංක 5. 2: ග්‍රාම සේවා වසම් අනුව රැකියාවල නියුක්ත නේවාසික ජනගහනවර්ගීකරණය*

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | රාජ්‍ය | පුද්ගලික | කෘෂිකාර්මික | වෙළද හා සේවා | නිෂ්පාදන ආයතන | වෙනත් | විශ්‍රාමික |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | බදුල්ල දකුණ | 906 | 405 | 10 | 18 | 5 | 0 | 207 |
| 2 | බදුල්ල උතුර | 546 | 160 | 49 | 219 | 0 | 830 | 364 |
| 3 | බදුල්ල නැගෙනහිර | 858 | 734 | 12 | 80 | 71 | 0 | 277 |
| 4 | බදුල්ල බටහිර | 81 | 300 | 15 | 183 | 35 | 88 | 299 |
| 5 | බදුල්ල මධ්‍යම | 253 | 460 | 105 | 118 | 183 | 141 | 297 |
| 6 | හිඟුරුගමුව | 692 | 855 | 86 | 550 | 106 | 0 | 398 |
| 7 | කණුපැලැල්ල | 142 | 302 | 77 | 98 | 66 | 71 | 319 |
| 8 | කයිලගොඩ | 283 | 670 | 62 | 277 | 57 | 0 | 314 |
| 9 | කටුපැලැල්ල | 160 | 514 | 73 | 285 | 121 | 0 | 270 |
| 10 | බදුලුපිටිය | 546 | 697 | 50 | 181 | 1 | 553 | 214 |
| 11 | හිඳගොඩ | 358 | 187 | 30 | 39 | 6 | 272 | 241 |
| 12 | පිටවෙලගම | 169 | 743 | 23 | 61 | 24 | 0 | 391 |
| 13 | මැදපතන | 335 | 385 | 66 | 129 | 100 | 0 | 300 |
| | | 5329 | 6412 | 658 | 2238 | 775 | 1955 | 3891 |

මූලාශ්‍රය : බදුල්ල සම්පත් පැතිකඩ,2016 බ.ප්‍රා.ලේ.කා.

ඒ ඒ රැකියා අනුව ජනගහනයේ ප්‍රතිශතාත්මක වර්ගීකරණය ප්‍රස්ථාර අංක 5.1 දැක්වේ.

*ප්‍රස්ථාර අංක 5.1. රැකියා අනුව ජනගහනයේ ප්‍රතිශතාත්මක වර්ගීකරණය*




මූලාශ්‍රය : බදුල්ල සම්පත් පැතිකඩ,2016 බ.ප්‍රා.ලේ.කා.

ඒ අනුව රැකියාවල නියුක්ත මුළු ජනගහනයක් 50% කට වැඩි ප්‍රමාණයක් සේවා අංශයේ නියුක්ත රැකියා වැනි පුද්ගලයන් වේ. ඒ අනුව, නගරය තුල පවත්නා බොහෝ රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථානයන්හි රැකියාවල නිරත බහුතරයක් ලෙස මෙම ප්‍රජාව සැලකිය හැකිය.

### iv. බදුල්ල පළාත් මහ රෝහල ඇතුළු සෞඛ්‍ය ආයතන රැසක් පිහිටා තිබීම

බදුල්ල මහ රෝහලේ දැනට පවත්නා සෞඛ්‍ය පහසුකම් සලකන විට ඇඳන් සංඛ්‍යාව 2016 දත්ත අනුව1,493 ක් වේ. බදුල්ල මහ රෝහලේ වාට්ටු 42 ක් දැනට ක්‍රියාත්මක වේ. දැනට පවත්නා ඇඳන් සංඛ්‍යාව 1,493 ක් වන අතර, සාමාන්‍ය ඇඳන් අත්පත් කර ගැනීමේ අනුපාතිකය 82% ක් වේ.

*වගුව අංක 5.3 : වාර්ෂික රෝගී තොරතුරු*

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| බාහිර රෝගීන් | 307,888 | 292,087 | 319,732 | 335,383 | 363,128 | 323,006 | 295076 |
| සායන රෝගීන් | 349,802 | 369616 | 357882 | 358352 | 423338 | 424024 | 405459 |
| රෝගීන් ඇතුලත් කිරීම | 78% | 78% | 80% | 96% | 71% | 73% | 70% |

මූලාශ්‍රය: බදුල්ල මහ රෝහල - 2016

*වගුව අංක 5.4: දෛනික රෝගී තොරතුරු*

| | |
|---|---|
| දෛනික සාමාන්‍ය බාහිර රෝගීන් ප්‍රමාණය | 799 |
| දෛනික සාමාන්‍ය සායන රොගීන් ප්‍රමාණය | 1,161 |
| දෛනික සාමාන්‍ය දන්ත රෝගීන් ප්‍රමාණය | 85 |

මූලාශ්‍රය: බදුල්ල මහ රෝහල - 2016

රෝග වැලැක්වීම සඳහා බදුල්ල මහ නගර සීමාවේ ක්‍රියාකාරි අංශ ලෙස බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය හා බදුල්ල මහ නගර සභාවේ සෞඛ්‍ය අංශය හැඳින්විය හැකිය. රෝග වැලැක්වීම සඳහා පහත වැඩසටහන් මහ නගර සීමාව තුල ක්‍රියාත්මකය.

ගර්භනී හා ළමා සායන මධ්‍යස්ථාන

- කටුපැලැල්ල - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
- පිංඅරාව- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
- මයිලගස්තැන්න ප්‍රජා ශාලාව
- සුවිනීතගම - ප්‍රජා ශාලාව
- රොක්හිල් - ප්‍රජා ශාලාව
- බදුලුපිටිය - ප්‍රජා ශාලාව
- කයිලගොඩ - ප්‍රජා ශාලාව

වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ සෞඛ්‍ය ආරක්ෂණයටත්, ගර්භනී කාන්තාවන් සඳහා සෑම මසකම සායන දෙක බැගින් පවත්වනු ලැබේ. මෙයට අමතරව පහත වැඩසටහන් ද රෝග නිවාරණ ඒකකය තුලින් ක්‍රියාත්මකය.

- පවුල් සැලසුම් සායන
- සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්
- ආහාර සෞඛ්‍ය වැඩසටහන්
- රෝග නිවාරණ වැඩසටහන්

### v. ජාතික භෙද පුහුණු ආයතනය පිහිටා තිබීම(*NTS*)

බදුල්ල මහ රෝහලේ සේවයට අනුයුක්තව පවත්තා ජාතික ජාතික හෙද පුහුණු ආයතනය බදුල්ල නගරයට ඇති සුවිශේෂී අවස්ථාවකි. එහි 300 ට ආසන්න හෙදියන් සංඛ්‍යාවක් පුහුණුව ලබයි.

### vi. දේශීය වෛද්‍ය සේවා ස්ථාන පැවතීම

නගර සීමාව තුල ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටා ඇත. ඒ තුළින් ද බදුල්ල නගරය හා ඒ අවට බොහෝ පිරිසක් සේවා ලබා ගනී.මීට අමතරව නගරයේ වාණිජ ස්ථාන අතර ආයුර්වේද ඔසුසල් හා පෞද්ගලික ඖෂධ මධ්‍යස්ථාන කිහිපයක්ද පවතී.

### vii. දියුණු වාණිජ සේවා ස්ථාන පිහිටා තිබීම

නගරයේ වාණිජ ස්ථාන සැලකීමේදී ජනගහනය ඇඳා ගන්නා පළාත් මහ රෝහල, පරිපාලන ආයතන වල සේවා අනුපූරක ලෙසත්, සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට හා නේවාසික ප්‍රජාවට අවශ්‍ය එදිනෙදා භාණ්ඩ හා සේවා ලබාගැනීමට හැකිවන අයුරින් ස්ථානගතව ඇත. ඒ අනුව රජයේ හා පෞද්ගලික බැංකු, භාණ්ඩ හා දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වාණිජ ස්ථාන පරිපූර්ණව පවතී. නමුත් රෙදිපිළි අලෙවියේදී බදුල්ල නගරයට වඩා බණ්ඩාරවෙල ඉහල මට්ටමකට පවතී.

**රූපය අංක *5.3* : දකුණු පටුමග හා බසාර් වීදිය වාණිජ ස්ථාන**





මූලාශ්‍රය : *නා.සං.අ. ඌව පළාත් කාර්යාලය*

මීට අමතරව බදුල්ල මහ රෝහල කේන්ද්‍ර කොටගෙන ඒ වටා ස්ථානගතව ඇති වාණිජ සේවා ස්ථාන රැසකි. ඔසුසල්, ඖෂධ අලෙවි සල්, රසායනාගාර, පුද්ගලික සායනාගාර, පුද්ගලික රෝහල්, විශේෂඥ වෛද්‍ය සේවා පහසුකම් ස්ථාන පිහිටා ඇත. එහිදී බදුල්ල-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගය, දයා ගුණසේකර මාවත, මැදිරිය පාර, වෙලේකඩේ වෙළඳ සංකීර්ණය තුල සේවා ස්ථාන කේන්ද්‍රස්ථාන වී ඇත. එසේම මීට අමතරව මැදිරිය පාර අවට පවත්නා බොහෝ නේවාසික භාවිත වාණිජමය සෞඛ්‍ය සේවා සැපයුම් ස්ථාන ලෙස වෙනස් කිරීමේ ප්‍රවණතාවයක්ද පවතී.

**රූපය අංක *5.4* : සෞඛ්‍ය සේවා ආශ්‍රිත වාණිජ කටයුතු**



දයාගුණසේකර මාවත



බණ්ඩාරවෙල පාර

### viii. සෞඛ්‍යසේවා අංශය පුළුල් කිරීමට අවශ්‍ය ඉඩකඩ පැවතීම

නගරය සීමිත භූමි ප්‍රමාණයක පැතිර පැවතුණද සංවර්ධනය කළ හැකි ඉඩම් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරිව පවතී. එහිදී ප්‍රධාන වශයෙන්ම බදුල්ල මහ රෝහල අවට පවත්නා නේවාසික කලාපය හා කුඹුරු ඉඩම් හඳුනාගත හැකිය. බොහෝ නේවාසික ඉඩම් සෞඛ්‍ය සේවය සඳහා මාරු වීමේ ප්‍රවණතාවයක් හා කුඹුරු ඉඩම් ඌණ සංවර්ධිත මට්ටමේ පවතී. ඒ අනුව සෞඛ්‍ය සේවය සඳහා ගැලපෙන ආකාරයට හා පැමිණෙන රෝගීන්ගේ හා අමුත්තන්ගේ පහසුකම් සැලසීමට සේවාස්ථාන පිහිටුවීමට හා පවත්නා ස්ථාන වැඩි දියුණු කිරීමට අවශ්‍ය තරම් ඉඩකඩ පවතී.

### ix. සංවර්ධනය කළ හැකි ඉඩම් ව්‍යාප්තිය

බදුල්ල නගරය යනු සුවිශේෂී භූමි පිහිටීමක් ඇති නගරයකි. නමුණුකුල ඇතුළු කඳු වළල්ලකින් වට වී නගර මධ්‍ය තැනිතලා ස්වභාවයකින් යුක්ත වේ. මේ නිසා නගර මධ්‍යයේ පවතින භූමියන්හි සංවර්ධනය කිරීමට ඇති හැකියාව ඉහල වේ. නගරයේ උන්නතාංශය මීටර් 680 පමණ වන අතර එය කඳුකරයේ අනෙකුත් නගර හා සංසන්ධනයේදී ඉතා පහළ අගයක් වේ. මෙහිදී නගරයේ මධ්‍යය සිරස් පෙස සංවර්ධනය කිරීමේ හැකියාවද ඇත.

නගරයේ භූමි පරිහරණ රටාව සේවා ව්‍යාප්තිය, පාරිසරික සංවේදී කලාප ආශ්‍රයෙන් කරන ලද ජීවත් වීමට සුදුසු පරිසර කලාප විශ්ලේෂණය (සිතියම අංක 5.1) හා එහි සාරාංශය වගුව අංක 1.5 පරිදි වේ.

*වගුව අංක 5.5: බදුල්ල නගරයේ ජීවත් වීමට සුදුසු පරිසර කලාප සිතියමේ සාරාංශය*

| කාණ්ඩය | භූමි ප්‍රමාණය (ව.කි.මී.) | විස්තරය |
|---|---|---|
| i. | 0.0111 | දැඩි අවදානම් |
| ii. | 0.9995 | අවදානම් කලාප |
| iii. | 3.9556 | ජීවත් වීමට සුදුසු |
| iv. | 5.6249 | ජීවත් වීමට ඉතා සුදුසු |
| එකතුව | 10 . 56 | |

මූලාශ්‍රය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

මෙම සාරාංශයට අනුව භූමි ප්‍රමාණයෙන් බහුතර ප්‍රමාණයක් එනම් ව.කි.මී. 9 පමණ ජීවත් වීම සඳහා සුදුසු වේ.

නගරයේ භූමි පරිහරණ රටාව, පාරිසරික සංවේදී කලාප, ආශ්‍රයෙන් කරන ලද සංවේදී කලාප විශ්ලේෂණය (සිතියම අංක 5.2) හා සාරාංශය වගුව අංක 2.6 පරිදි වේ.

සිතියම අංක 5.1 : බදුල්ල නගරයේ ජීවත් වීමට සුදුස් පරිසර කලාප විශ්ලේෂණය




Livability Analysis- 2017
Badulla Municipal Council Area

Urban Development Authority
September 2017

Uva Provincial Office

Badulla Urban Development Plan ( 2017-2025 )

**සිතියම අංක 5.2 : බදුල්ල නගරයේ සංවේදි පරිසර කලාප විශ්ලේෂණය**



*වගුව අංක 5.6 : බදුල්ල නගරයේ පාරිසරික සංවේදී කලාප සිතියමේ සාරාංශය*

| කාණ්ඩය | භූමි ප්‍රමාණය (ව.කි.මී.) | විස්තරය |
|---|---|---|
| 1. | 6.016 | ඉතා අවම සංවේදී කලාප |
| 2. | 4.157 | අවම සංවේදී කලාප |
| 3. | 0.409 | මධ්‍ය සංවේදී කලාප |
| 4. | 0.002 | ඉතා සංවේදී කලාප |
| එකතුව | 10.56 | |

මූලාශ්‍රය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

මෙම සංවේදී කලාප විශ්ලේෂණයේ සාරාංශයට අනුවද නගරය තුල පවත්නා භූමි පරිභෝජනයෙන් වැඩි ප්‍රමාණය සංවර්ධනය සඳහා යොදා ගත හැකි ඉඩම් වේ. එසේම භූමි පරිභෝජනයෙන් 62% ක ප්‍රමාණයක් නේවාසික පැවැත්මෙන්ද එය සනාථ වේ.

### x. නගරය තුළ පිහිටා ඇති අධ්‍යාපනික ආයතන

බදුල්ල මහා නගර සීමා බල ප්‍රදේශයේ අධ්‍යාපනික ආයතනික වර්ග කිහිපයකින්ම හඳුනාගත හැකිය. ප්‍රාථමික අධ්‍යාපන, ද්විතීයික අධ්‍යාපනය හා උසස් අධ්‍යාපන, කාර්මික අධ්‍යාපන වශයෙන් නගරය තුල ඇති අධ්‍යාපනික ආයතන පහත ආකාරයට වර්ගීකරණය කළ හැකිය.

i. අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරන ලද මුල් ළමා විය සංවර්ධන පෙර පාසල් 43 කි.

ii. ද්විතීයික අධ්‍යාපනික ආයතන ලෙස සිංහල, දෙමළ හා මුස්ලිම් පාසල් 33 ක් ඌව පළාත් සභාවට අයත් වන පාසල් වේ.

*වගුව අංක 5.7 : ද්විතීයික අධ්‍යාපනික ආයතන*

| මාධ්‍ය | වසර | | | එකතුව | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | 1-13 | 1-11 | 1-5 | | | |
| සිංහල | 8 | 3 | | 11 | 932 | 15742 |
| දෙමළ | 2 | | 1 | 3 | 132 | 2854 |
| මුස්ලිම් | 1 | | 2 | 3 | 86 | 1200 |
| එකතුව | | | | 33 | 1150 | 19796 |

මූලාශ්‍රය : බදුල්ල සම්පත් පැතිකඩ,2016 බ.ප්‍රා.ලේ.කා.

iii. උසස් අධ්‍යාපනික ආයතන

*වගුව අංක 5.8 : බදුල්ල නගර සීමාවේ උසස් අධ්‍යාපනික ආයතන*

| ආයතනය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| විවෘත විශ්ව විද්‍යාලය | 700 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 814 |
| කාර්මික විද්‍යාලය | 700 |
| උසස් තාක්ෂණ ආයතනය | 750 |

මූලාශ්‍රය : බදුල්ල සම්පත් පැතිකඩ,2016 බ.ප්‍රා.ලේ.කා.

iv. විවිධ ආගමික මධ්‍යස්ථාන මගින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා හා ජාතික තරුණ සේවා සභාව මැදිහත් වීමෙන් පවත්නා අධ්‍යාපනික පාඨමාලාව.

v. පිරිවෙන් අධ්‍යාපනික ආයතන

vi. පෞද්ගලික අධ්‍යාපන ආයතන

නගර සීමාව තුල ද්විතීයික අධ්‍යාපනික වයසේ පසුවන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 11,935 ක් වන අතර ඒ අනුව නගරයෙන් පිටත ප්‍රදේශ වල සිට ද්විතියික අධ්‍යාපනය සඳහා පැමිණෙන පිරිස 9,249 ක් පමණ වේ. ද්විතියික අධ්‍යාපන සඳහා පවතින ගුරු සිසු අනුපාතය 1:17 ක් වේ. ඒ අනුව නගරය තුල සේවා අංශයේ නියුක්ත ප්‍රජාවගේත්, අනෙකුත් නේවාසික ප්‍රජාවගේත් දරුවන්ට අවශ්‍ය කරන අධ්‍යාපන සේවා ප්‍රශස්ත මට්ටමක පවතී.

## දුර්වලතා

### i. රජයේ ආයතන පවත්නා ස්ථාන දුරස්ථව පැවතීම

ඌව පළාත් පරිපාලන අගනගරය ලෙස බදුල්ල පැවතුණද පවත්නා රජයේ හා පෞද්ගලික ආයතන බොහෝමයක් අතර පවත්නා පරතරය වැඩිය. මේ හේතුව මත එක් ආයතනයක සේවය ලබාගෙන අනෙක් සේවා ස්ථානය වෙත කි.මී. 1 – 1.5 අතර දුරක් යාමට සිදුව ඇත. පවත්නා මාර්ග පදිකයන්ට පහසුකම් සපයන මාර්ග නොවීමද ප්‍රධන ගැටළුවක් වේ.

### ii. ආයතන පවත්නා ස්ථාන සම්බන්ධව නිවැරදි මග පෙන්වීමක් නොමැති වීම

පරිපාලන ස්ථාන නගරය පුරා විසිර පවතින බැවින් නගරයේ පරිපාලන ආයතන සම්බන්ධ සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට ඒ ඒ ස්ථාන පවත්නා ස්ථාන සම්බන්ධව නිවැරදි මග පෙන්වීමක් නොමැත. මේ හේතුව මත සේවා ස්ථාන සොයා ගැනීම උදෙසා විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුව ඇත.

### iii. බදුල්ල මහ රෝහලට පවත්නා ඉඩකඩ සීමිත වීම

බදුල්ල මහ රෝහල අක්කර 9 ක් පමණ වූ වපසරියක පැතිර පැවතුනද සේවා සැපයීමේදී මෙහි වපසරිය ප්‍රමාණවත් නොමැත. මෙයට ප්‍රධාන හේතුව වශයෙන් වර්තමාන සේවාලාභීගේ අවශ්‍යතා සහ අනාගත රෝහල සංවර්ධන කටයුතු මත ඇතිවන අවශ්‍යතා හඳුනාගත හැකිය.

එහිදී රෝහල මධ්‍යය පවත්නා පුරාවිද්‍යාත්මකව වැදගත් ගොඩනැගිල්ල හේතුවෙන් එහි කිසිදු ගොඩනැගිලි එකතු කිරීමට හැකියාවක් නොමැත. එසේම සාමාන්‍ය රෝගීන් ඇතුලත් කිරීමේ ප්‍රතිශතය 80% ක පමණ පැවතුණද කායික රෝග වාට්ටුවල පවත්නා ඉඩකඩ සීමිතය. එසේම අනාගත රජයේ යෝජනා මත මෙය ශික්ෂණ රෝහලක් දක්වා වර්ධනය කිරීමේදී පවත්නා භූමි ප්‍රමාණය තුල ඒ සියලු පහසුකම් ඇති කිරීමේ අපහසුවක්ද පවතී.

### iv. රෝහලට පැමිණෙන රෝගීන්ට හා ජනතාවට අවශ්‍ය විවේකි ස්ථාන නොමැති වීම

පළාත් මහ රෝහල පිහිටා තිබීම හේතුවෙන් පළාතේම ජීවත්වන ජනතාව හා මඩකලපුව වැනි ප්‍රදේශ වලින් එන ජනතාවට සරිලන ආකාරයට බදුල්ල නගරය තුළ විවේකි යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් ප්‍රමාණවත් නොමැත.

මහ රෝහලට පැමිණෙන ජනතාව බාහිර අංශයට පැමිණෙන රෝගීන් ප්‍රතිකාර සඳහා නතර කර ඇති රෝගීන් බැලීමට එන අමුත්තන්, සායන සඳහා පැමිණෙන රෝගීන් යනාදි ලෙස වර්ගීකරණ වෙයි. ඒ අනුව දිනකට 18,000 ක් පමණ පිරිසක් පැමිණෙන මුළු සංක්‍රමණ ජනතාවගෙන් 18% ක් පමණ වූ ප්‍රතිශතයකි.

නමුත් මෙම ජනතාවට ප්‍රමාණවත් වූ වාහන නැවතුම් ස්ථාන, විවේකී ස්ථාන රෝහල ආසන්නයේ නගරය තුල සපයා දී ඇත්තේ අවම ප්‍රමාණයකිනි. වාහන නැවතුම් ස්ථාන ලෙස ආසන්න පාරවල් දෙපස භාවිතා කරනු ලබයි. එය පදිකයන්ට සහ ගමන් කරන වාහන සඳහා විශාල අපහසුවක්ද වෙයි.

මීට අමතරව සායන සඳහා පැමිණෙන දුරබැහැර සිට පැමිණෙන රෝගීන් පෙරදින සිට පැමිණ රෝහල පරිශ්‍රයේ නතර වී සායන සඳහා සහභාගි වෙති. එම රෝගීන්ට අවශ්‍ය මූලික පහසුකම්වත් රෝහල වටා හෝ ස්ථානගතව නොමැත. එසේම උදැසන රෝගීන් බැලීම සඳහා පැමිණෙන බොහෝ පිරිසක් සවස් වන තුරුම සිට නැවත රෝගීන් බලා යන බැවින් ඔවුන්ට අවශ්‍ය විවේක ගැනීමේ ස්ථාන නගරය තුල සපයා නොමැත.

### v. රෝගීන්ට හා ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට ඒකාබද්ධ ස්ථානයක් නොමැති වීම

රෝහලට පැමිණෙන රෝගීන්ට හා බැලීමට පැමිණෙන පිරිස් සඳහා අවශ්‍ය වන රසායනාගාර පහසුකම්, රෝහල වටා පැතිර පැවතුණද සියළු පහසුකම් ඒකාබද්ධ කර ඇති ස්ථානයක් නොමැත. එසේම රෝගීන්ට අවශ්‍ය කොට්ට, රෙදි, තුවා ආදි දෛනික සේවා ලබාගැනීමට අවශ්‍ය ස්ථානද ඇත්තේ සුළු ප්‍රමාණයකි. ඒවැනි බොහෝ ස්ථාන පදික මංතීරු වල පැවතීම හේතුවෙන් පදික ගමනටද අපහසු වී ඇත.

*රූපය අංක 5.5 : බණ්ඩාරවෙල පාර දෙපස රෝහල කේන්ද්‍රකොට ගත් සේවා ස්ථාන අවිධිමත්ව පිහිටා තිබෙන අයුරු*





ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

මීට අමතරව රසායනාගාර පහසුකම් ඒ ඒ අවශ්‍යතා මත විවිධ ස්ථාන කරා යාමට සිදුවීම මත රෝගී ජනතාව අපහසුතා රැසකට මුහුණ දෙති.

**අවස්ථා**

### i. බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් දක්වා වර්ධනය කිරීමට රජයේ පවත්නා යෝජනා

1891 වසරේදී ආරම්භ කරන ලද බදුල්ල මහ රෝහල පළාත් මහ රෝහල දක්වා මේ වන විට වර්ධනය වී ඇත. ඒ අනුව රෝහලේ සේවාව හා සෞඛ්‍ය සේවා ලබාගන්නා ජනතාව මත මෙය ශික්ෂණ රෝහලක් දක්වා වර්ධනය කිරීමට රජයේ යෝජනාවක් පවතී. එහිදී ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධ කොට නව වෛද්‍ය පීඨයක් ආරම්භ කර බදුල්ල රෝහල සෞඛ්‍ය පුහුණුව සඳහා යොදාගනු ඇත.

ඒ අනුව දැනට පවත්නා හෙද පුහුණු විදුහලත් සමඟ බදුල්ල සෞඛ්‍ය සේවයේ සුවිශේෂී ස්ථානයකට පත්වනු ඇත.

### ii. රැකියා පදනම් කරගෙන සේවා අංශයේ රැකියාවල ඉහළ හා මධ්‍යම පාන්තික ජනතාව පදිංචිය සඳහා බදුල්ලට සංක්‍රමණය වීම

බදුල්ල මහ නගර සීමාව තුල රැකියාවල වයස අවුරුදු 18-60 ත් අතර සේවා අංශයේ නියුක්ත ජනතාව 43% ක ප්‍රතිශතාත්මක අගයක් පවතී. එසේම කුමන හෝ රැකියාවක නියුක්ත ජනගහනයෙන් සේවා අංශයේ රැකියාවක සිටින ජනතාව 63% ක් වෙයි.

ඒ අනුව නගරයට අළුතින් පදිංචිය සඳහා පැමිණෙන ජනතාවගෙන් බහුතරය රැකියාව මත සංක්‍රමණය වූ පිරිස වෙයි. මෙහිදී විශේෂයෙන්ම කටුපැලැල්ල , බදුල්ල බටහිර, හිඟුරුගමුව යනාදි ප්‍රදේශ වැදගත් වෙයි.

## අරමුණු 2 : ප්‍රශස්ත යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් බවට පත් කිරීම

*වගුව අංක 5.9 : අරමුණු අංක 2 ශඳුඅත විශ්ලේශණය*

| | | | |
|---|---|---|---|
| ශක්තීන් | i. නගරයේ මධ්‍යය එකිනෙකට සම්බන්ධ වූ මාර්ග ජාලයක් පැවතීම<br>ii. කලාපයේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වීම<br>iii. නගරයේ නේවාසික ජනගහනයෙන් 96% ක්ම නල ජලය මත පදනම්ව සිටීම.<br>iv. ජල මූලාශ්‍ර පැවතීම<br>v. 100% ක්ම විදුලි බලයෙන් සංතෘප්ත නගරයක් වීම | දුර්වලතා | i. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ පවතින ගැටළු<br>ii. නගරයට අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම<br>iii. වාහන තදබදයක් ඇතිවීමේ ප්‍රවණතාවය<br>iv. නගර මධ්‍යයේ පවත්නා ඉඩම් වල උණ සංවර්ධිත තත්ත්වය<br>v. බඳුළු ඔය දූෂණය<br>vi. නගර මධ්‍යයේ පවතින ඌණ සංවර්ධිත පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන හා පැරණි ගොඩනැගිලි<br>vii. නගරයේ අවිධිමත් සංවර්ධන කටයුතු |
| අවස්ථා | i. යෝජිත කවශිමා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය<br>ii. බදුල්ල, හාලි ඇල, ඇල්ල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය<br>iii. යෝජිත බදුල්ල නාගරික ප්‍රදේශය සඳහා වූ අප ජල එකතු කිරීමේ හා පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය<br>iv. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය පිහිටා තිබීම<br>v. නගරය වටා ඇති සංචාරක ආකර්ශණ ස්ථාන | බාධක | i. භූ විෂමතාවහේතුවෙන් කඳු හා නිම්න ප්‍රදේශ වලට පහසුකම් සැපයීමට ඇති දුෂ්කරතා |

## ශක්තීන්

### i. නගරයේ මධ්‍යය එකිනෙකට සම්බන්ධ වූ මාර්ග ජාලයක් පැවතීම

නගර මධ්‍යයේ මාර්ග ජාලරූපී (Grid) අනුව පැවතීම සුවිශේෂී ලක්ෂණයක් වේ.

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපස සිට බැංකු පාර ඇති සියළු මාර්ග ජාල ආකාරයට සම්බන්ධ වී ඇත. බදුළුපිටිය නේවාසික කලාපය තුල පවත්නා මාර්ගද එකිනෙකට සම්බන්ධ වී මාර්ග අතර පවත්නා සම්බන්ධතාවය ඉහල මට්ටමක පවතී. අවකාශ වින්‍යාසය(Space syntax) සිතියම අංක 5.3 විශ්ලේෂණය අනුවද නගර මධ්‍යයේ පවත්නා ජාලගත මාර්ග රටාවේ සම්බන්ධතාවය පෙන්නුම් කරයි.

**සිතියම අංක 5.3 : අවකාශ වින්‍යාසය(*Space syntax*)**



### ii. කලාපයේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වීම

බදුල්ල නගරය හා සම්බන්ධ වූ බස්රථ මගින් මගී ප්‍රවාහන සේවයක් හා දුම්රිය ප්‍රවාහන සේවයක් පවතී.

බස් රථ මගී ප්‍රවාහනය සලකන විට දිනකට බස් රථ 720-750 අතර ප්‍රමාණයක් නගරය තුළටත් 800-820 අතර ප්‍රමාණයක් නගරයෙන් පිටතටත් ධාවනය වේ.

මීට අමතරව දුම්රිය ප්‍රවාහන සේවය හරහාද නගරයට මගී හා භාණ්ඩ ප්‍රවාහන අවස්ථාව උදා වී ඇත. උඩරට දුම්රිය මාර්ගයේ අවසන් දුම්රිය පොල වන හෙයින් දිනක දුම්රිය වාර 5 පටන් ගැනීමත්, ගමන් වාර 5 අවසන් වීමත් සිදු වේ. ඓතිහාසික විශ්ලේෂණය සලකා බැලීමේදී යටත්විජිත පාලන කාලය තුල නිර්මිතවන දුම්රිය මාර්ගය හරහා පස්සර, මඩොල්සිම, ආදි ප්‍රදේශ වල තේ ප්‍රවාහනය සඳහා බදුල්ල දුම්රිය ස්ථානය භාවිතා කොට ඇත.

### iii. නගරයේ නේවාසික ජනගහනයෙන් 96% ක්ම නල ජලය මත පදනම්ව සිටීම.

බදුල්ල මහ නගර සීමාව තුල ජීවත් වන මුළුපවුල් සංඛ්‍යාව 12,452 කි. මෙම මුළු පවුල් සංඛ්‍යාවෙන් 11,891 ක් එනම් 96% ක්ම නල ජලය සපයා ඇත.

බදුල්ල ජල සම්පාදන මණ්ඩලය විසින් සපයා ඇති නල ජලසම්බන්ධතා පහත පරිදි වේ.

***වගුව අංක 5.10 : බදුල්ල මහ නගර සභා සීමාවේ නල ජලසම්බන්ධතා***

| | | |
|---|---|---|
| 1 | නේවාසික | 13010 |
| 2 | වාණිජ | 1034 |
| | **මුළු එකතුව** | 14405 |

මූලාශ්‍රය : ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , බදුල්ල

වර්තමාන දෛනික ජල පරිභෝජනය ඝණ මීටර් 8,409වන අතර පවුල් ඒකක ප්‍රමාණයක්, සංක්‍රමණික ජනගහනයක් සලකා බලන විට දෛනික ජල අවශ්‍යතාවය ඝණ මීටර් 8,688 පමණ වේ. ඒ අනුව ඝණ මීටර් 278 පමණ ජල හිඟයක් පවතී. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත අනුව බදුළු එය ආශ්‍රිතව ජලය පොම්ප කරන ස්ථාන දෙකකි. ඒවායේ ජල ධාරිතාවයක් හා ජලය ලබා ගන්නා ස්ථාන වගුව 5.11 පරිදි වේ.

***වගුව අංක 5.11 : බදුල්ල නගර සීමාව තුළ ජල පොම්පාගාර හා ඒවායේ ජල ධාරිතාවයන්***

| | පොම්පාරගාරය | ජලය ලබා ගන්නා ස්ථානය |
|---|---|---|
| 01 | ඝණ මීටර් 9000 | කුමාරසිංහ මාවත |
| | | මැදිරිය |
| | | වෙස් මෝලන් |
| 02 | ඝණ මීටර් 4000 | කුමාරසිංහ මාවත |
| | | වෙස් මෝලන් |

මූලාශ්‍රය : ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , බදුල්ල

### iv. ජල මූලාශ්‍ර පැවතීම

බදුල්ල මහ නගර සීමාව සඳහා පානීය ජලය සපයා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය ලෙස බදුළු ඔය හැඳින්විය හැකිය. මීට අමතරව නගර සීමාව තුල පවත්නා කුඹුරු හා කෘෂිකාර්මික ගොඩ ඉඩම් සඳහා ජලය සපයාගන්නා ජල මූලාශ්‍ර ලෙස රඹුක්පොත ඔය, කුඩා ඔය, බදුළු පිටිය ඇල, අලුත් ඇල, ආගරේ කඳුර යන කඳුරු වැදගත් වේ.

### v. 100% ක්ම විදුලි බලයෙන් සංතෘප්ත නගරයක් වීම

ශ්‍රී ලංකාවේ විදුලිබලය ලබා දීමේ අංශයන්ගෙන් තුන්වන අංශයට අයත් වන බදුල්ල මහ නගර සීමාව තුල සිටින මුළු විදුලි පාරිභෝජක සංඛ්‍යාව 12,385 කි.

2016 බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩට අනුව නගර සීමාවේ සිටින පවුල් ඒකක හා වාණිජ මධ්‍යස්ථාන 99.5% කට විදුලි බලය ලබා දී ඇත. බදුල්ල මහ නගර සීමාව තුල කි.වො. 132 ග්‍රිඩ් උප පොලක් පිහිටා ඇති අතර කි.වො. 33 ට්‍රාන්ස්ෆෝමර් 51 ක් පිහිටා ඇත. නගරයේ විදුලි රැහැන් ව්‍යාප්තිය සිතියම අංක 5.4 දැක්වේ.

**සිතියම අංක 5.4 : බදුල්ල නගරයේ විදුලි රැහැන් ව්‍යාප්තිය**



## දුර්වලතා

### i. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ පවතින ගැටළු

බදුල්ල නගරයේ ඝණ අපද්‍රව්‍ය එකතු වන මූලාශ්‍ර ලෙස ගෘහාශ්‍රිත, වාණිජ, වෙළඳපොල හා සාප්පුකාගාර ආයතන, කර්මාන්ත හා වෙනත් ලෙස වර්ග කළ හැක. ඉහත අංශ මගින් එකතු කර ගන්නා කසල ප්‍රමාණය ටොන් 25-28 ත් අතර ප්‍රමාණයක් ගනී. එයිනුත් 50% ක් ම වෙන් වන්නේ ගෘහාශ්‍රිත කසල වලටය. මෙම එකතු කරන ලද කසළයන්හි අන්තර්ගතය ප්‍රස්ථාර අංක 5.2 පරිදි වේ.

***ප්‍රස්ථාර අංක 5.2. නාගරික කසළ වර්ගීකරණය***




මූලාශ්‍රය : බදුල්ල මහ නගර සභාව, 2017

මහ නගර සභාව 70 % ක පමණ ප්‍රදේශයක කුණු කසල එකතු කිරීම සිදු කරනු ලබයි. එනම් මහ නගර සභාව යටතේ පවතින කොට්ඨාශ 15 න් කටුපැලැල්ල සහ පිටවෙලගම කොට්ඨාශයේ කොටසක් හැර අනෙකුත් සෑම ප්‍රදේශයකම කසල එකතු කිරීම සිදු කරයි. වැඩිම කසල ප්‍රමාණයක් එකතු වනුයේ නගර මධ්‍යයේ වූ බසාර් වීදිය හා රජ වීදියේ ය. ට්‍රැක්ටර් සහ ලොරි රථ මගින් පෙරවරු සහ පස්වරු ලෙස සේවා මුර දෙකක් යටතේ දිරාපත් වන කසල සහ දිරාපත් නොවන කසල ලෙස වර්ගීකරණය කොට කසල එකතු කිරීම සිදු කරයි. මෙලෙස එකතු කර ගන්නා කසල පළමුව බදුල්ල මහ නගර සභා කසල අංගනයට ගෙන එනු ලබයි.

එකතු කර ගන්නා කසල දිරාපත් නොවන කසල, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල හා නොහැකි ලෙස වර්ගීකරණය කරයි. දිරාපත් වන කසල තුලින් Open Dumping ක්‍රමවේදයට අනුකූලව කොම්පෝස්ට් නිපදවනු ලැබේ. ඒ අනුව දිරාපත් වන කසල අට්ටි කර සතියකට වරක් සති 6 ක් පෙරලීමෙන් පසු සති දෙකක කාල සීමාවක් ස්ථායි වීමට තැබීමෙන් පසු හැලීම සිදු කරයි. පසුව ඇසුරුම් කර වෙළඳපොල වෙත

නිකුත් කරයි. මේ අනුව මසකට කි.ග්‍රෑ. 40,000 ක ප්‍රමාණයක් වෙළඳපොල වෙත නිකුත් කරයි.දිරාපත් නොවන අතරින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල සුදුසු ගැනුම්කරුවන්ට අංගනය තුලදීම විකුණනු ලැබේ. එසේ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි දිරාපත් නොවන කසල ශේෂ කසල ලෙස අංගනය තුලම ගොඩ ගසා ඇත.

*රූපය අංක 5.6 : වර්තමාන කසල අංගනය*





ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

මේ හේතුවෙන් 2016 අග කාර්තුවේදී බදුල්ල කුණු කන්දේ ගින්නක් ඇති වූයේද මෙම කසල ශේෂ කසල ගොඩෙහි තිබූ මීතේන් ප්‍රමාණය වැඩි වී බව පරීක්ෂණ වලින් සනාථ වී ඇත. එනිසා දැනට ශේෂ කසල නගරයට හා එහි වෙසෙන වැසියන්ට පීඩාවක් වී ඇත. පහත ගැටළු මෙම කසළ අංගනය තුල පවතී.

- මුළු කසළ ප්‍රමාණයෙන් 20% ක් වෙන් කිරීමකින් තොරව එකතු කිරීම.
- 2014 සිට මේ දක්වා කසළ අංගනය තුල ගොඩ ගසා පවතින විකිණීමට නොහැකි නොදිරන කසළ
- අවට ප්‍රදේශය පුරා පැතිරයන දුර්ගන්ධනය
- කසළ අංගනයෙන් බැහැරට ගලා යන අපවිත්‍ර ජලය.

### ii. නගරයට අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම

බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුල මලාපවහන පද්ධතියක් නොමැත. නගර මධ්‍යයේ පස ජලය උරා නොගන්නා ස්වරූපයකින් ඇති නිසාවෙන් බොහෝ වැසිකිළිවල අපද්‍රව්‍ය උතුරා යාමක් දක්නට ලැබේ. නගරයේ ඇති පොදු වැසිකිළි ලෙස බදුල්ල මහ රෝහල සේනානායක පිටිය, බස් නැවතුම්පොල, දකුණු පටුමඟ, මුතියංගණ පන්සල, දුම්රිය ස්ථානය අසල, වෙලේ කඩේ වෙළඳ සංකීර්ණය යන ස්ථාන හැදින්විය හැකිය.

බදුල්ල මහ රෝහල් පරිශ්‍රය තුළ මල පවිත්‍රාගාරයක් පිහිටා ඇති අතර එයද ඉතා පැරණි තත්ත්වයේ ඇත. බදුල්ල පාරිසරික හේතූන් මත ගැටළුවට තුඩු දී ඇති මල අපවහනයට පිළියමක් ලෙස ජීව වායු ජනක පද්ධති පහත ස්ථානයන් වල පවතින වැසිකිළි පද්ධති වලට අනුබද්ධව හඳුන්වා දුන්නද පසු කාලීනව සෑම ජීව වායු පද්ධතියකම නිවැරදිව ප්‍රයෝජනයට නොගනී.

- සේනානායක පිටියෙහි ජීව වායු පද්ධතිය
- බදුලුපිටිය ගවසාථකාගාරය ආශ්‍රිත ජීව වායු පද්ධතිය
- බදුල්ල කසල අංගනයේ ඇති ජීව වායු පද්ධතිය
- නගර ශාලා පරිශ්‍රයේ ජීව වායු පද්ධතිය
- බදුල්ල පොල පරිශ්‍රයේ ජීව වායු පද්ධතිය

මලාපවහනයේ ඇති ප්‍රධානතම ගැටළුවක් වී ඇත්තේ බදුල්ල නගරයේ පස ජලය උරා නොගන්නා ස්වභාවයක් ගන්නා හෙයින් ගලිසක යොදා ගෙන ඒ වළවල් හිස් කිරීම සිදු කළ යුතු විය. එසේම මෙසේ එකතු කර ගන්නා මල ද්‍රව්‍ය නගරයේ ජීව වායු පද්ධති වලට බැහැර කරන අතර සමහර කාල වලදී එයද ප්‍රමාණවත් නොවේ.

තවද, බොහෝ පිරිසක් තම වැසිකිළි වළවල් පොදු කාණු පද්ධතියට අනවසරයෙන් හරවා තිබීමත් නිසා ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වී ඇත.

*රූපය අංක 5.7 : අපවිත්‍ර පොදු කාණු*





ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

### iii. වාහන තදබදයක් ඇතිවීමේ ප්‍රවණතාවය

බදුල්ල නගර මධ්‍යයේ ක්‍රියාකාරිත්වය සඳහා රථ වාහන තදබදයේ බලපෑම බරපතලව නොමැති වුවත්, නුදුරු දිනකදීම එවන් තදබදයක් ඇතිවීමේ හැකියාවක් පවතී. ඒ නගරය සීමිත ඉඩකඩක ප්‍රමාණයකට සීමා වීමත් නිසාවෙනි. ඒ නිසා නගර මධ්‍යයේ රථ වාහන නැවතුම් ස්ථාන ලෙස පවත්නා ඉඩ අඩු වීමත්, පාර දෙපස රථ වාහන නවතා තැබීමටත් සිදු ව ඇත.

නගර මධ්‍යයේ රථ වාහන නැවතුම් ස්ථාන ලෙස වෙන් කර ඇති ස්ථාන දෙකකි. ඒ බදුල්ල වාණිජ මධ්‍යස්ථානයේ හා සේනානායක භූගත රථ ගාලයි. නමුත් දෛනිකව නගරයට පැමිණෙන ජනගහනයෙන් බහුතරය ආයතනයන්හි සේවය සඳහාත්, සේවා ලබා ගැනීමටත් නිසාවෙන් නගරය තුල සංසරණය වන වාහන සංඛ්‍යාව ඉහළ ප්‍රමාණයක් ගනී. එසේම උදෑසන සිට සවස් වරුව දක්වා එම වාහන නවතා තැබීමටද සිදුව ඇත.

නමුත් දැනට පවත්නා රථ වාහන නැවතුම් ස්ථානවල ඉඩකඩ සහ ආයතනයන්හි වෙන් කර ඇති ඉඩකඩ ප්‍රමාණයන් ප්‍රමාණවත් නොමැත. එසේම පහළ රජ වීදිය, බදුල්ල-බණ්ඩාරවෙල මාර්ගය, මැදිරිය මාර්ගය, බසාර් වීදිය යන මාර්ගයන්හි දෙපස වාහන නවතා තැබීම සුලභ දසුනකි. විශේෂයෙන්ම පහළ රජ වීදිය එක් පසකට පමණක් රථ වාහන ධාවනය කර වුවත්, දිවා කාලයේ වාණිජ ස්ථාන සඳහා බඩු බෙදා හැරීම නිසා වාහන තදබදයක් ඇති වී ඇත. ඒ අනුව හඳුනාගත් මාර්ග කොටස් වල පවත්නා වේග සීමාවන් වගුව අංක 5.12 දැක්වේ.

***වගුව අංක 5.12: හඳුනාගත් මාර්ග කොටස් වල පවත්නා වේග සීමාවන්***

| මාර්ග කොටස | දුර මීටර් | වේගය පැ.කි.මී |
|---|---|---|
| මහරෝහල ඉදිරිපස සිට තානායම් හන්දිය දක්වා | 500 | 10 |
| බන්ධනාගාර හන්දිය සිට විහාරගොඩ හන්දිය දක්වා | 650 | 10 |

*මූලාශ්‍රය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය,2017*

නගරය තුල පදික මංතීරු පවතින්නේ මාර්ග කිහිපයක පමණකි. බොහෝ පරිපාලන සේවා ස්ථාන දුරස්ථව පැවතීමත් ඒ ස්ථාන කරා යන මාර්ග පදියන් සඳහා හිතකර නොවීමත් හේතුව මත ජනතාව පුද්ගලික ප්‍රවාහන සේවය සේවය හරහා තම ගමන්පහසුකම් ලබා ගනිති. ඒ ප්‍රවාහන සේවා වලදී පොදු ප්‍රවාහන සේවය නගරය තුල වර්ධනය වී නොමැතිකම මතය. මේ සඳහා වැඩි වශයෙන් භාවිතා වනුයේ ත්‍රී රෝද රථ සේවයයි. නගරයටම සුවිශේෂී වූ රු. 25.00 ත්‍රී රෝද රථසේවය නගරයට විශාල සේවයක් කළද නගරයේ වාහන තදබදයක් ඇතිවීමට ප්‍රධාන හේතුවක් වී ඇත.

නගරයෙන් පිටත ඇති නේවාසික කලාප හා නගර වලට යන වාහන සඳහා ඇති ගමන් පථයද නගරය හරහාම වැටී හෙයින්ද රථ වාහන තදබදය වැඩි වී ඇත.

### iv. නගර මධ්‍යයේ පවත්නා ඉඩම් වල උණ සංවර්ධිත තත්ත්වය

නගරයට පවත්නා ඉඩකඩ සීමිත වුවද බොහෝ ඉඩම් උණ සංවර්ධිත මට්ටමේ පවතී. මෙලෙස ඌණ සංවර්ධිත තත්ත්වයේ පවතින ඉඩම් අතර රජයේ කාර්යාල පවතින ඉඩම්, රජයේ නිලනිවාස, පවතින ඉඩම්,පොදු ගොඩනැගිලි ඇතුලත් වේ.

නමුත් බදුල්ල නගරය තුල ඉඩම් මිල සලකා බැලීමේදී (සිතියම අංක 5.5) මෙලෙස ඌණ සංවර්ධිත මට්ටමේ පවතින නගර මධ්‍යය බොහෝ ඉඩම්වල වටිනාකමද ඉහල මට්ටමක් ගනී. මෙහිදී ඉඩ කඩ සීමිත වුවත් නගරය සිරස් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව පවතී. ඒ අනුව හඳුනාගත් ඌණ සංවර්ධිත ඉඩම් ලෙස පහත ස්ථාන හැඳින්විය හැකිය

1. ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය පිටුපස ඉඩම
2. නිවාස සංවර්ධන අධිකාරිය අසල ඉඩම
3. කච්චේරිය පිටුපස ඉඩම
4. දුම්රිය දෙපාර්තමේන්තුව ඉඩම

**සිතියම අංක 5.5 : බදුල්ල නගරයේ ඉඩම් වටිනාකම්**



මීට අමතරව පරිපාලන හා සුව සේවා යන දැක්ම කරා යන සැලසුමේදී නගරයේ පවත්නා සීමිත ඉඩකඩ තුළ ඉඩම් මිලට නොගැලපෙන භාවිතයන් පැවතීමහේතුවෙන් නරගයේ අනවශ්‍ය තදබදයක්ද ඇති වී ඇත. එලෙස නොගැලපෙන භාවිතයන් පවතින ස්ථාන ලෙස

1. බදුල්ල බන්ධනාගාරය
2. පාසැල් (බදුල්ල විශාකා බාලිකා, උසස් බාලිකා විදුහල, අල් අදාන් මහ විදුහල, සරස්වතී කණිෂ්ඨ දෙමළ විදුහල)

මෙම පාසල් පවතින භූමියන් සීමිත ඉඩකඩකට සීමා වී ඇති අතර පාසැල් සඳහා පවතින ක්‍රීඩා පහසුකම් රසායනාගාර සුදුසුකම් ලබාදීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොමැත.

### v. බදුළු ඔය දූෂණය

බදුල්ල නගරයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන බදුළු ඔය දූෂණය වීම ගැටළුකාරි තත්ත්වයකට පත්ව ඇත. පානීය ජලය ලබා ගන්නා ස්ථාන වන මැදිරිය, වෙස්මෝලන් හා කුමාරසිංහ යන ස්ථාන වලින් ගන්නා ජලය පිරිපහදුවට මේ හේතුවෙන් බලපෑමක් නොවූවත්, බදුල්ල බොහෝ නගර වැසියන් තම සේදුම් කටයුතු ගඟ කේන්ද්‍රකරගෙන සිදු කිරීම නිසා එය නගරයට පවත්නා දුර්වලතාවයකි.
 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට. බාහිර තත්ත්වය, රසායනික තත්ත්වය, ක්ෂුද්‍ර ක්‍රියාකාරිත්වය අනුව ආකාරයට ජලයේ පිරිපහදුභාවය මනිනු ලැබේ. බදුළු ඔය ආශ්‍රිතව හඳුනාගත් ස්ථානයන්ගේ සාමාන්‍ය තත්ත්වය මැදිරිය , කුමාරසිංහ මාවත, අංදෙණිය පාලම යන ස්ථානයන්ගෙන් ලබා ගත් සාම්පල පරිකෂා කිරීමේදී බදුළු ඔය නගර සීමාවේ ආරම්භක අවස්ථාවේ ඇති මැදිරිය ස්ථානයේදී පමණක් ජලය පිළිගත හැකි මටටමේ පවතී. ඒ අනුව නගරය තුළදී බදළු ඔය දූෂණයට පත් වන බව පැහැදිලිය.

*රූපය අංක 5.8 : අපවිත්‍ර ජල කාණු බදුළු ඔයට හරවා ඇති ආකාරය*




ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

## iv. නගර මධ්‍යයේ පවතින ඌණ සංවර්ධිත පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන හා පැරණි ගොඩනැගිලි

පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන රාශියක් නගරය පුරා විසිර පැවතීම නගරයට සුවිශේෂී ස්ථානයක් ලබා දුන්නද ඒවායේ නිවැරදි යාවත්කාලීන කිරීම හෝ සංරක්ෂණය කිරීමට නොහැකි වීම නගරයට ඇති තවත් එක් දුර්වලතාවයකි. මෙය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, බොහෝ පුරාවිද්‍යාත්මක වැදගත් සේ සලකන ගොඩනැගිලි සඳහා පෞද්ගලික හිමිකරුවන් සිටීමය. විශේෂයෙන්ම තල්දෙන වලව්ව, සළුසල ගොඩනැගිල්ල, කොතලාවල වලව්ව යැනි ගොඩනැගිලි අතහැර දැමූ තත්ත්වයකට පත්ව ඇත. පෞද්ගලික ඉඩම් හිමිකාරිත්වය හේතුවෙන් බදුල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට මැදිහත් වීමට නොහැකි තත්ත්වයක ඇත.

*රූපය අංක 5.9 : නගර මධ්‍යය ඌණ භාවිතයේ ඇති පුරාවිද්‍යා ස්මාරක*




වෙලේ කඩේ බලකොටුව



තල්දෙන වලව්ව



සළු සල ගොඩනැගිල්ල



කොතලාවල වලව්ව

ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය හා අන්තර්ජාලය ඇසුරිනි

කෙසේ වෙතත් පුරාවිද්‍යා ගොඩනැගිලි හැරුණුකොට, නගරයේ පවත්නා බොහෝ ගොඩනැගිලි නගරයේ අලංකාරය සඳහා අනුබල දීමක් සිදු වන්නේද නැත. නගරය ඓතිහාසිකව ක්‍රමයෙන් ඇති වූ හෙයින් නගරය පුරා විසිර පවත්නා පැරණි ගොඩනැගිලි ප්‍රමාණය ඉහළ අගයක් ගනී.

### v. නගරයේ අවිධිමත් සංවර්ධන කටයුතු

නගරය ව්‍යාප්තව පවතින්නේ සීමිත බිම් ප්‍රදේශයක වුවද එහි විධිමත් භාවයක් නොමැත.

- අනවසර ගොඩනැගිලි ව්‍යාප්තිය

නගරයේ පවතින බොහෝ ගොඩනැගිලිඅනවසර ගොඩනැගිලි ගණයට අයත් වේ. මෙයට ප්‍රධානතම හේතුව වනුයේ පැරණි ගොඩනැගිලි කාලාන්තරයක් තිස්සේ වෙනස් කරමින්, අළුතින් කොටස් එකතු කරමින් පවත්වාගෙන යාමය. එසේම ගඟ රක්ෂිත, මාර්ග රක්ෂිත නොතකමින් ගොඩනැගිලි ඉදිකිරිම සුලභව දක්නට ලැබේ.

- යටිතල පහසුකම් සංවර්ධන කටයුතු

බදුල්ල නගරය තුල විදුලි රැහැන් හා සන්නිවේදන රැහැන් සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැත. නගරයේ සිට දිස්වෙන අලංකාර කඳු පන්තිවලින් වටවුණු දර්ශන පථ වැසී යාමට මෙම විදුලි රැහැන් හේතුවී ඇත.

***රූපය අංක 5.10 : අවිධිමත් විදුලි රැහැන් හා සන්නිවේදන රැහැන්***



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

මීට අමතරව නගරයේ පවත්නා කාණු පද්ධති හා නල ජල පද්ධතිවල අළුත්වැඩියා කිරීම් වලදී, නඩත්තු කිරීම් වලදී බොහෝ විට පදික වේදිකා හරස් කර කටයුතු සිදු කරයි. පදික පහසුව ඇති වන ආකාරයෙන් එම යටිතල පහසුකම් ඇති කිරීමේ අවශ්‍යතා පවතී.

***රූපය අංක 5.11: පදික වේදිකා හරස් කර කාණු හා නල ජල පද්ධතිවල අළුත්වැඩියා කිරීම් සිදු කිරීම***



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

**අවස්ථා**

### i. යොජිත කවශිමා ඝන අපද්‍රව්‍ය කසළ කළමණාකරණ ව්‍යාපෘතිය

බදුල්ල නගරයේ කසළ කළමණාකරණය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුමක් ලෙස පළාත් පාලන අමාත්‍යාංශයේ මැදිහත් වීම මත කවශිමා ව්‍යාපෘතිය දියත් කර ඇත. මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රධාන වශයෙන් බදුල්ල නගර සීමාවේ කසළ සඳහා පුමුඛත්වය ලබා දෙනු ලැබේ. ඒ අනුව බදුල්ල නගරයේ සිට 4ක් පමණ පස්සර මාර්ගයේ 2 කණුව ප්‍රදෙශයේ, එනම් බදුල්ල නගර සීමාවෙන් පිටත වූ ප්‍රදේශයක මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට යොජිතය.

ව්‍යාපෘතිය ධාරිතාවය සලකන විට දිනකට දිරන කසළ ටොන් 50ක් ප්‍රතිචක්‍රිකරණ ක්‍රියාවලියට යෙදවීමට අවශ්‍ය අතර මාසයක කාල සීමාවෙන් පසු කාබනික පොහොර ටොන් 20ක ධාරිතාවයක් නිමවුම ලෙස ලබා ගත හැකිය. ඒ අනුව ව්‍යාපෘතිය හරහා බදුල්ල නගර සීමාවට පමණක් නොව බදුල්ල ආශ්‍රිතව පවත්නා ප්‍රධාන නගරවලද කසළ ගැටළුවට විසඳුම් ලබා දිය හැකි වේ.

### ii. බදුල්ල, හාලි ඇල, ඇල්ල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය

බදුල්ල නගරයේ සිට බණ්ඩාරවෙල දිශාවට කි.මී. 14 ක් පමණ ගිය පසු හමුවන දෙමෝදර ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදි දොමෝදර ජල ව්‍යාපෘතියේ ධාරිතාවය ඝණ මීටර් 15,000කි. මෙම ව්‍යාපෘතියේ බදුල්ල නගරය සහ නගරය දිශාවට පවත්නා ප්‍රදේශයට ඝණ මීටර් 8,500 ක ධාරිතාවයක් සපයනු ලබයි. නගරය පුරා පවත්නා ජල නල පද්ධතියද මෙම ව්‍යාපෘතිය යටතේ පොලිඑතිලින් (Polyethylene) ජල නල එළීමද සිදුවේ. ඒ අනුව පවත්නා ජනගනයට හා 2035 දක්වා වූ කාල පරාසයකට පුරෝකථනය කරන ලද ජනගහනයට අවශ්‍ය ජල සැපයුම මෙමගින් සිදු වේ.

### iii. යෝජිත බදුල්ල නාගරික ප්‍රදේශය සඳහා වූ අප ජල එකතු කිරීමේ හා පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය හරහා බදුල්ල මධ්‍යම, බදුල්ල නැගෙනහිර හා බදුළුපිටිය යන ග්‍රාම සේවා වසම් පාදක කොට ගෙන අප ජලය එකතු කිරීම හා පිරිපහදු කිරීමේ කටයුතු සිදු වෙයි. මේ වන විට ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ අවදියේ පසුවන අතර යෝජිත අප ජලය එකතු කිරීමේ ස්ථානය පොම්ප කිරීමේ ස්ථානය හා බැහැර කරන ස්ථාන හඳුනාගෙන ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත අනුව හිඳගොඩ ආශ්‍රිතව පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයත් පොම්ප කිරීමේ ස්ථාන 11 ක් පෙරකී ග්‍රාම සේවා වසම් ආශ්‍රිතවත් ස්ථානගත කිරීමට ඉඩම් හඳුනාගෙන ඇත.

ඒ අනුව, අදාල ග්‍රාම සේවා වසම්හි අප ජලය එකතු කිරිමට යෝජිත ගුරුත්වාකර්ෂණය මත ක්‍රියාකාරි අප ජල නලයන්ගේ දිග මීටර් 26902 ක් වන අතර පොම්ප කිරීම මත ක්‍රියාකාරි අප ජල නලයන්ගේ දිග මීටර් 5,315 වේ. යෝජිත පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයේ දෛනික ධාරිතාවය ඝනමීටර් 4,000 ක් වේ.

### iv. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය පිහිටා තිබීම.

බදුල්ල නගර සීමාවට අයත් නොවූ නමුත් කි.මී. 5 ක පමණ නගර මධ්‍යයෙන් පස්සර දෙසට ස්ථාපිත කරන ලද ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය නගරයට පවත්නා සුවිශේෂී අවස්ථාවකි. 2005 වසරේදී මෙම විශ්ව විද්‍යාලය පිහිටුවීමත් සමඟ නගරයේ සංවර්ධන පීඩනය පස්සර මාර්ගය දිසාවට ව්‍යාප්ත විය. එසේම පෞද්ගලික අධ්‍යාපන ආයතන රැසක් පස්සර මාර්ගය දෙපස ඇති වීමටද මෙය බලපෑවේය.

ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨ 03 කි.

1. සත්ත්ව විද්‍යාව හා අපනයන කෘෂිකර්මාන්තය
2. කළමනාකරණ
3. විද්‍යාව හා තාක්ෂණවේදය

වර්තමානය වන විට මෙම අධ්‍යාපන පීඨ 03 ට අමතරව බාහිර අධ්‍යාපන මධ්‍යස්ථානයන්ද මෙහි විවෘතය. අධ්‍යාපනයේ නියුක්ත මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව 1,911 කි.

### v. නගරය වටා ඇති සංචාරක ආකර්ශණ ස්ථාන

නගරය වටා ඇති සංචාරක ආකර්ශණ ස්ථාන නගර සීමාවට අදාල නොවූවත් නගරය වටා සංචාරක ආකර්ශණය දිනාගත් ස්ථාන රැසකි. බෝගොඩ පාලම, ඇල්ල, දෙමෝදර පාලම, ලිප්ටන් සීට්, දූන්හිඳ දිය ඇල්ල, රාවණා ගුහාව ආදි සුවිශේෂී ස්ථාන රැසකි. මෙම සංචාරක ස්ථාන වලට යටන බොහෝ සංචාරකයන් බදුල්ල නගරය හරහා ගමන් කරයි. එසේම නගරය වටා පිහිටා ඇති තරු පන්තියේ හෝටල් නිසාවෙන්ද නගරයට අර්ථික වාසි ලබාගත හැකිය.

*රූපය අංක 5.12 : නගරය වටා පිහිටි සංචාරක ආකර්ශණ ස්ථාන*



බෝගොඩ පාලම දූන්හිඳ දිය ඇල්ල රාවණා කන්ද

ග්‍රහණය: අන්තර්ජාලය ඇසුරිනි

**බාධක**

**i. භූ විෂමතාවහේතුවෙන් කඳු හා නිම්න ප්‍රදේශ වලට පහසුකම් සැපයීමට ඇති දුෂ්කරතා**

නගර සීමා බල ප්‍රදේශය තුල පවත්නා බේසමක හැඩය ගත් භූ විෂමතාව හේතුවෙන් කඳු හා නිම්න ප්‍රදේශ වලට පහසුකම් සැපයීමේදී දුෂ්කරතා මතු වී ඇත.

ඒ අනුව, මාර්ග සංවර්ධනයේදී අවම පළල පවත්වාගෙන යාමට නොහැකි වී ඇත. එහිදී බොහෝ නේවාසික භාවිතයන් සඳහා පවත්නා මාර්ග මීටර් 2-3 ක අතර ප්‍රමාණයෙන් හඳුනාගත හැකිය. මීට අමතරව සන්නිවේදන ජාලයන්ද උදාහරණ ලෙස ඩයලොග්, මොබිටෙල් වැනි ජංගම සන්නිවේදන ජාලයන්හි ආවරණයද මෙවැනි නිම්න ප්‍රදේශ වලට නොමැත. නගරයේ පවත්නා බෑවුම් කලාප සිතියම 5.6 න් දැක්වේ.

**සිතියම අංක 5.6 : බදුල්ල නගරයේ බෑවුම් කලාප විශ්ලේෂණය**



## අරමුණු 3 : තිරසාර පාරිසරික සුරක්ෂිතතාවය ඇති කිරීම

*වගුව අංක 5.13 : අරමුණු අංක 3 ශදඅත විශ්ලේශණය*

| | | | |
|---|---|---|---|
| ශක්තීන් | i. බදුළු ඔය හා කුඩා ඔය වැනි ගංගා නගරය හරහා ගලා යාම<br>ii. ජල රඳවන ස්ථාන පැවතීම<br>iii. ඉහල කඳු ප්‍රදේශ වල ස්වභාවික වනාන්තර හා පතන පැවතීම | දුර්වලතා | i. කුඹුරු ඉඩම් ගොඩවීම<br>ii. බදුළුඔය ඇතුළු ජල මූලාශ්‍ර දූෂණය<br>iii. නේවාසික හා මගී ජනතාවගේ පහසුවට පවතින විවේකී ස්ථාන අවම මට්ටමක පැවතීම<br>iv. බැවුම් ප්‍රදේශ වල නේවාසික භාවිතය සඳහා වන ඉල්ලුම ඉහල වීම |
| අවස්ථා | i. කුඹුරු ඉඩම් ගොඩකිරීමට එරෙහිව පවත්නා රජයේ විශේෂ නිවේදනය | බාධක | i. නගර මධ්‍යයේ ජලය උරා ගන්නා ප්‍රමාණය අවම මට්ටමක පැවතිම |

## ශක්තීන්

### i. බදුළු ඔය හා කුඩා ඔය වැනි ගංගා නගරය හරහා ගලා යාම

නගරය හරහා වැටී ඇති බදුළු ඔය,කුඩා ඔය වැනි ජලධරයන් හේතුවෙන් නගරයට ජල මූලාශ්‍ර ලෙසත්, නගරයට අලංකරණයක් එක් කිරීමටත් හේතු වී ඇත. ඒ අනුව, ජල මූලාශ්‍රයක් ලෙස ප්‍රධාන වශයෙන් බදුළු ඔයෙහි ස්ථාන තුනකදී ජලය ලබාගන්නා ස්ථාන පිහිටුවා ඇත.

මීට අමතරව නගරය අලංකරණය කිරීම සඳහා පවත්නා සුවිශේෂී අංගයක් ලෙසද හැඳින්විය හැකිය.

*රූපය අංක 5.13: බදුළු ඔය*





ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

### ii. ජල රඳවන ස්ථාන පැවතීම

බේසමක හැඩය ගත් බදුල්ල මහ නගර සභා සීමාවෙහි ජලය ගාල යාම නගර මධ්‍යයේදී මන්දගාමී වෙයි. මේ හේතුව මත අධික වාර්ෂා කාලවලදී නගරයේ ස්ථාන කිහිපයක් ගං වතුර තත්වයටද පත් වේ. නමුත් ජල රඳවන ස්ථාන ලෙස පවත්නා අලි කුඹුර වැනි කුඹුරු ඉඩම් හේතුවෙන් නගරයේ දෛනික රාජකාරීන්ට බලපෑමක් නොවී කටයුතු කිරීමේ හැකියාවක් ඇත.

### iii. ඉහල කඳු ප්‍රදේශ වල ස්වභාවික වනාන්තර හා පතන පැවතීම

ඉහල කඳු ප්‍රදේශ ආශ්‍රිතව වනාන්තර හා පතන දැකගත හැකිය. මෙලෙස පවත්නා බොහෝ භූමි ප්‍රදේශ නාය යාමේ දැඩි අවදානම් ප්‍රදේශ හේතුවෙන් එවැනි ආපදා ඇතිවීමේ අවදානම අවම වී ඇත. පවත්නා වනාන්තර හා පතන භූමි ප්‍රමාණය වගුව අංක 5.14න් දැක්වේ.

*වගුව අංක 5.14: නගර සීමාවේ වර්ථමාන වනාන්තර හා පතන භූමි ප්‍රමාණයන්*

| භාවිතය | භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|
| වනාන්තර | 128 |
| පතන | 256 |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,බදුල්ල

## දුර්වලතා

### i. කුඹුරු ඉඩම් සීඝ්‍රයෙන් ගොඩවීමේ ප්‍රවණතාවය

නගර සීමාව තුල පවත්නා සංවේදී කලාප ලෙස නඩුකාර කන්ද වන රක්ෂිතය, බදුළු ඔය හා කුඹුරු ඉඩම් හැඳින්විය හැකිය. නගරයේ බේසමක හැඩය ගත් භූ වින්‍යාසය හේතුවෙන් ජලය ගලාගෙන බදුළු ඔය එක්වීම සිදු වේ. එහෙත් නගර මධ්‍යයේ පවතින සමතලා භූමි රටාව නිසා ජල ධාරක ස්ථාන ලෙස කුඹුරු ඉඩම් වලට සුවිශේෂී ස්ථානයක් හිමි වෙ.

නමුත් පරිපාලන අග නගරයක් ලෙස සංවර්ධනය වන බදුල්ලේ කුඹුරු ඉඩම් වලට පවත්නා ආර්ථික ඵලදායිතාවය හීන වී ගොස් ඇත. එසේම සේවා නගරයක් ලෙසට සංවර්ධනය වීමේදී කුඹුරු සඳහා පවත්නා ශ්‍රම විභේදනයද අඩු වී ඇත. අනෙක් අතට නේවාසික නගරයක් ලෙස නේවාසික භාවිතය සඳහා පවතින ඉඩම් ඉල්ලුම වැඩිය.

මෙම හේතූන් මත බදුල්ල නගරයේ කුඹුරු ඉඩම් ගොඩ ඉඩම් වලට පරිවර්තනය වීමටත්, ඒවා නේවාසික හෝ වාණිජ භාවිතය සඳහා යොදා ගැනීමේ ප්‍රවණතාවයක් ඇත. වර්තමාන කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 247 පර්චස් 18 වන අතර එම භූමි ප්‍රමාණය ආශ්‍රිත තොරතුරු වගුව අංක 5.15 දැක්වේ.

*වගුව අංක 5.15: වර්තමාන කුඹුරු ඉඩම් ප්‍රමාණය හා ඒවායේ භාවිතය*

| කාණ්ඩය | | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|---|
| වගා කරන කුඹුරු ඉඩම් | | 158 | 0 | 0 |
| වගා නොකරන කුඹුරු ඉඩම් | | 63 | 0 | 24 |
| | වගා කිරීමට හැකි | 42 | 2 | |
| | වගා කිරීමට නොහැකි | 20 | 2 | 24 |

මූලාශ්‍රය: ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,බදුල්ල

### ii. බදුළුඔය ඇතුළු ජල මූලාශ්‍ර දූෂණය

බදුල්ල නගරයේ සුවිශේෂීතම අංගයක් වන බදුළු ඔය ඇතුළු ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම උග්‍ර ගැටළුකට පත්ව ඇත. නගරයේ අපවිත්‍ර ජලය ජලය කළමනාකරණය කිරීම සඳහා ක්‍රමවේදයක් නොපැවතීමත් සීඝ්‍රයෙන් සිදුවන ඉඩම් කට්ටි වීමත් ඒ හා සමානව පදිංචි සහ සංක්‍රමණික ජනගහනය වැඩිවීමත් හේතු කොට ගෙන ජල මූලාශ්‍රවලට අපවිත්‍ර ජලය ඍජුවම එකතුවීමේ ප්‍රවණතාවයක් පවතී. එසේම නගරය තුළ පවතින වාරි ඇල සහ වැසිජල කාණු යන දෙවර්ගයම එකක් ලෙස පැවතීම හේතු කොට ගෙන කුඹුරු ඉඩම් සඳහා පවතින ජල සැපයුම අපවිත්‍ර තත්ත්වයක පවතී. නේවාසික, රෝහල්, වාණිජ හා ආයතන වලින් පිටවන අපවිත්‍ර ජලය මෙම කාණු හරහා කුඹුරු ඉඩම් සඳහා සපයනු ලැබීම එයට හේතුවයි. නගර සීමාව තුල ස්වාභාවික බෑස්ම අනුව ඇති ජල වහන රටාව සිතියම අංක 5.7 හා පවත්නා ප්‍රධාන කාණු පද්ධතිය සිතියම අංක 5.8 දැක්වේ.

**සිතියම අංක 5.7 : බදුල්ල නගරයේ ස්වාභාවික බෑවුම අනුව ජල බැස්ම**



**සිතියම අංක 5.8 : බදුල්ල නගරයේ ප්‍රධාන කාණු පද්ධතිය**



### iii. නේවාසික හා මගී ජනතාවගේ පහසුවට පවතින විවේකී ස්ථාන අවම මට්ටමක පැවතීම

දෛනිකව නගරයට පැමිණෙන ජනගහනය 100,000 කට ආසන්න ප්‍රමාණයක් වුවත් ප්‍රමාණයට ගැලපෙන හා ප්‍රවේශකත්වය ලබා ගත හැකි විවේකී ස්ථාන අවම මට්ටමක පවතී. ඒ අනුව, පවත්නා විවේකී ස්ථාන සිතියම 5.9 පරිදි වේ. මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 16.3 ක ඉඩම් ප්‍රමාණයක් වෙන් ව ඇත.

නමුත් ප්‍රධාන වශයෙන් නගරයට පැමිණෙන ජනතාවගෙන් බහුතරයක් රෝහල හා පරිපාලන ආයතන පදනම් කරගෙන පැමිණෙති. එනිසා පැමිණෙන ජනතාවගෙන් වැඩි පිරිසක් වැඩිහිටි වයස් කාණ්ඩයට අයත් වේ. ඔවුන්ට ගැලපෙන භාපහසුකම් සඳහා පහසු ප්‍රවේශකත්වය ඇති අයුරින් පවත්වාගෙන යනු නොලබයි. බදුල්ල උද්භිද උද්‍යානය බොහෝ විට තරුණ වයස් කාණ්ඩයේ විවේකී ස්ථානයක් වන අතර අසල පවත්නා කසල අංගනය නිසා එයට පැමිණෙන ජනතාවද අවම මට්ටමක පවතී.

විවේකී ස්ථාන සම්බන්ධ සම්මතයන් සැලකීමේදී ජනගහන්ය 1000කට හෙක්ටයාර 1.4 තිබිය යුතුය. නමුත් මුළු ජනගහනය හා සැසඳීමේදී නගරයේ පවත්නා විවේකී ස්ථාන ප්‍රමාණය ප්‍රමාණවත් නොමැත. මීට අමතරව සේවා වෘත්තීන්ගේ නියැලී සිටින බහුතරය නේවාසික ප්‍රජාවක් සිටින නගරයකට අවශ්‍ය වන ඇවිදින මංතීරු පහසුකම් නගරය තුල ස්ථානගතව නොමැත.

**සිතියම අංක 5.9: පවත්නා විවේකී හා විනෝද ස්ථාන**



### iv. බැවුම් ප්‍රදේශ වල නේවාසික භාවිතය සඳහා වන ඉල්ලුම ඉහල වීම

නගර මධ්‍යයේ පවත්නා ඉඩකඩ සීමා වීම මත නේවාසික භාවිතය සඳහා ඉහල කඳුකර ප්‍රදේශ තෝරා ගැනීමේ ප්‍රවනතාවයක් පවතී. මේ වන විට කටුපැලැල්ල, මැදපතන වැනි කඳු ආශ්‍රිතව ඇති නේවාසික භාවිතය ඉහල මට්ටමක පවතී. ඒ අනුව නාය යාම් අවදානමද ඉහල ගොස් ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට අනුව නාය යැම් ආවානම් කලාප සිතියම 5.10 දැක්වේ.

*රූපය අංක 5.14: කඳුකර ප්‍රදේශවල සිදු වන නේවාසික භාවිත*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

**සිතියම අංක 5.10 : බදුල්ල නගරයේ නාය යෑම් අවදානම් කලාප**




මූලාශ්‍රය : ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

## අවස්ථා

### i. කුඹුරු ඉඩම් ගොඩකිරීමට එරෙහිව පවත්නා රජයේ විශේෂ නිවේදනය

බදුල්ල නගරයේ හිස් ඉඩම් ලෙස පවතින බහුතරය කුඹුරු ඉඩම් වේ. නගරයට විවෘත ප්‍රදේශ ලෙසද, ජල රඳවන ප්‍රදේශ ලෙසද පවත්නා කුඹුරු ඉඩම් සීඝ්‍රයෙන් වෙනත් භාවිතයන් ලෙස වෙනස් කිරීමේ ප්‍රවණතාවයක් ඇත.

2016 නොවැම්බර් මස 03 වන දින කෘෂිකර්ම දෙපාර්තමේන්තු කොමසාරිස්වරයා විසින් දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස් වෙත යැවෙන කුඹුරු ගොඩකිරීමේ ක්‍රියා පිළිවෙත් නතර කිරීමේ නිවේදනය මත බදුල්ල නගරයේත් කුඹුරු ඉඩම් ගොඩකිරීම සීමා වී ඇත.

## දුර්වලතා

### i. නගර මධ්‍යයේ ජලය උරා ගන්නා ප්‍රමාණය අවම මට්ටමක පැවතිම

ඓතිහාසික විකාශනය සලකා බැලීමේදී බදුල්ල නගර මධ්‍යය වැවකි. වැව හා සබැඳුණු කුඹුරු ඉඩම් ඒ වටා පැවතුණි. එනිසා වර්තමානය වන විටත් නගරයේ ජල රඳවන ස්ථාන ලෙස පවත්නා කුඹුරුවල ජලය උරා ගැනීමේ ස්වභාවය අවම මට්ටමක පවතී.

ඒ අනුව වැසි සමයන්හිදී ගලා එන ජලය බොහෝ විට පසට උරා නොගෙන බදුලුඔය ඇතුළුජල ධරයන්ට එකතු වේ. එනිසා බොහෝ ගං වතුර තත්ත්වයන් ඇති වීමටද මෙය හේතු වී ඇත. එසේ ගං වතුර ඇතිවන ස්ථාන සිතියම 5.11 අනුව වේ.

**සිතියම අංක 5.11 : බදුල්ල නගර සීමාවේ ගංවතුර හානි සිදුවන ස්ථාන**




*මූලාශ්‍රය- ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය-බදුල්ල*

**අරමුණු 4 : බදුල්ල උරුමයන්ගේ අනන්‍යතාවය සුරැකීම**

*වගුව අංක 5.16 : අරමුණු අංක 4 ශක්‍යතා විශ්ලේෂණය*

| | | | |
|---|---|---|---|
| ශක්තීන් | i. බදුල්ල මුතියංගණ රජ මහා විහාරස්ථානය පිහිටා තිබීම<br>ii. බදුල්ල කතරගම දේවාලය ඇතුළු ඓතිහාසිකව වැදගත් ස්ථාන පිහිටා තිබීම<br>iii. ආගමික වැදගත් ස්ථාන ආශ්‍රිතව ඇති සංස්කෘතිමය උත්සව | දුර්වලතා | i. පුරාවිද්‍යාත්මක ස්ථාන රැසක් අත්හැර දමා තිබීම<br>ii. පුරාවිද්‍යාත්මකව වැදගත් ස්ථාන ඌණ සංවර්ධිත මට්ටමේ පැවතීම |
| අවස්ථා | i. ආගමික ස්ථාන ආශ්‍රය කරගෙන පැමිණෙන සංක්‍රමණික ප්‍රජාව | බාධක | |

## ශක්තීන්

i. බදුල්ල මුතියංගණ රජ මහා විහාරස්ථානය පිහිටා තිබීම

බදුලු ඉතිහාසයට අනුව බදුල්ල නගරය ඇතිවීමට මූලිකවම හේතු වි ඇත්තේ ආගමික පරිසරයයි. එහිදී මුතියංගණ රජමහා විහාරස්ථානයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි.

ගෞතම බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනයේදී ඉන්දික නැමති ප්‍රාදේශිය පාලකයෙකුගේ ආරාධනයෙන් බදුල්ල ප්‍රදේශයට වැඩම කර ඇත. එහිදී මුතියංගණ චෛත්‍යය පිහිටා ඇති ස්ථානයේ සමවත් සුවයෙන් වැඩසිටි බවත් මහාවංශයේ සඳහන් වේ.

මුතියංගණ සෑ ගර්භයේ බුදුරදුන්ගේ මුක්තක ධාතූන් වහන්සේ හා කේෂ ධාතූන් වහන්සේ වැඩ සිටිති. බුදුරදුන්ගේ සෘධියෙන් ධාතූන් වහන්සේලා බවට පත් කළ දාඩිය බිඳු වැඩ සිටින ලොව එකම දාගැබ ලෙස මුතියංගණ සෑ රදුන් සලකනු ලැබේ. මීට අමතරව කේෂ ධාතූන්ද තැන්පත් කර ඇති බව සඳහන්ය. එසේම සොලොස්මස්ථාන අතරින් එකක් ලෙසද මෙම පුදබිම සලකනු ලැබේ.

නගර සීමාවෙන් අක්කර 8 ක පමණ ප්‍රදේශයක් පුරා පැතිර පවතින මුතියංගණ රජ මහා විහාරය ආශ්‍රිතව පූජා භාණ්ඩ වෙළඳ සැල් කිහිපයක්ද පවතී. දෛනිකව 300 ක පමණ බැතිමතුන් ප්‍රමාණයක්ද, සති අන්තවලදී 1000 ක පමණ බැතිමතුන් ප්‍රමාණයක්ද පැමිණෙති. එසේම මුතියංගණ රජමහා විහාරයේ වෙසක් පොහොය ආශ්‍රය කරගෙන පවත්නා ආගමික උත්සනව සහා 10000 ක ආසන්න ප්‍රමාණයක් පැමිණෙති. මුතියංගණ රජ මහා විහාරස්ථානයට ඉතිහාසයේ පටන්ම ඇති වැදගත් ස්ථානය අද දක්වා නොවෙනස්ව පවතී. නගරයේ නගරයේ ඓතිහාසික වැදගත්කමක් , අනන්‍යතාවයක් ලෙස මුතියංගණය විහාරය හැඳින්විය හැකිය.

*රූපය අංක 5.15 : මුතියංගණ රජ මහා විහාරය*



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

ii. බදුල්ල කතරගම දේවාලය ඇතුළු ඓතිහාසිකව වැදගත් ස්ථාන පිහිටා තිබීම

මුතියංගණ රජමහා විහරස්ථානය හැරුණුකොට නගරයේ ඓතිහාසික වැදගත්කමක් හිමි ස්ථානය ලෙස බදුල්ල කතරගම දේවාලය හැඳින්විය හැකිය. මහනුවර රාජධානි සමයේදී විමලධර්මසූරිය රජු (1548-

1604) විසින් කතරගම දේවාලය ඉදිකර ඇත. ඌව විහාරවංශයට අනුව කතරගම දේවාලයේ දැල්වෙන පහන පෙනෙන පරිදි දේවාල භූමියට ඉදිරිපසින් රජු පෙරහැර නරඹන සිංහාසනය නිමවා ඇත.

පෘතුගීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය පාලනය කළ අවධිය තුලදී බදුල්ල නගරය ආශ්‍රයකරගෙන විමලධර්මසූරිය රජු විසින් පාලනය ගෙන ගොස් ඇත. රජුගේ මාලිගාව දැනට පරණ කච්චේරිය නමින් හඳුන්වන පරිශ්‍රයේ පැවති බව සඳහන්ය. පසුව ඉංග්‍රීසි පාලන කාලය තුලදී නගරයේ කතෝලික පූජා භූමියද ඉදිවී ඇත. ශාන්ත මාක්ස් දේවස්ථානය, වෙලේකඩේ මෙතෝදිස්ත පල්ලිය එලෙස ඉදිවුන ආගමික ස්ථාන වේ.

මීට අමතරව නගරයේ ඉතිහාසයේ පටන්ම පදිංචිව සිටි වලව් පැලැන්තියේ නිවාසද දක්නට ඇත. තල්දෙන වලව්ව, කොතලාවල වලව්ව, රත්වත්ත වලව්ව, දිඹුලන වලව්ව ඒ අතරින් කිහිපයකි.

ඓතිහාසිකව නගරයට හිමිව තිබූ සුවිශේෂීතාවය හේතුවෙන් පරිපාලන නගරය ලෙසද සලකා ඇත. මේ හේතුව මත ඉංග්‍රීසි පාලන කාලය තුල භාවිතා කළ ගොඩනැගිලි රැසක් අද දක්වාම ශේෂ වී පවතී. මෙම ගොඩනැගිලි වලින් බහුතරය දැනට පුරාවිද්‍යා සංරක්ෂණ ස්ථාන ලෙස පවතී.

*රූපය අංක 5.16 : බදුල්ල නගරයේ ඓතිහාසිකව වැදගත් ස්ථාන*



රාජ සිංහාසනය



කතරගම දේවාලය



ළිඳ මුල්ල පත්තිනි දේවාලය



පරණ කච්චේරිය

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

iii. ආගමික වැදගත් ස්ථාන ආශ්‍රිතව ඇති සංස්කෘතිමය උත්සව

සංස්කෘතිකාංග ලෙස බදුලු නගරයේ පවත්නා විශේෂාංග කිහිපයකි. බදුල්ල මුතියංගණ වෙසක් මහා පෙරහැර, කම්මානන්කඩ විහාර පෙරහැර, කයිලගොඩ ශ්‍රී සද්ධර්මානන්ද විහාර පෙරහැර, බදුල්ල කතරගම දේවාල පෙරහැර හා රොක්හිල් කෝවිල් රදම් පෙරහැර හැඳින්විය හැකිය. මෙම පෙරහැර ආශ්‍රය කරගෙන නගරයේ ඒ ඒ කාල සීමාවන්හිදී රථ වාහන සැලසුම් ඇති කරනු ලැබේ.නගරයේ අනන්‍යතාවය පෙන්වන සුවිශේෂී අංගයක් ලෙස මෙම සංස්කෘතිමය උත්සව හැඳින්විය හැකිය.

*රූපය අංක 5.17: බදුල්ල කතරගම මහා දේවාලයේ පෙරහැර*



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

**දුර්වලතා**

i. පුරාවිද්‍යාත්මක ස්ථාන රැසක් අත්හැර දමා තිබීම

දැනට බදුල්ල නගරයේ පවත්නා පුරාවිද්‍යා වැදගත් ලෙස සලකා ස්ථාන රැසක් අත්හැර දමා ඇත. උදාහරණ ලෙස කොතලාවල වලව්ව, තල්දෙන වලව්ව, සළුසල ගොඩනැගිල්ල හැඳින්විය හැකිය. මෙම ස්ථාන නගරයේ ඉතා වටිනා භූමි ප්‍රදේශ ආශ්‍රය කරගෙන පැවතීමද ගැටළුකාරි තත්ත්වයකි. මෙම ස්ථාන සහිතව නිවැරදි කළමනාකාරිත්වයක් නොමැති වීම මෙයට හේතුවයි. පුරාවිද්‍යා ගොඩනැගිලිවල පවත්වා සීමා සහිත සංවර්ධන නියමතාවයන් හේතුවෙන් බොහෝ පෞද්ගලික හිමිකරුවන් මෙම ගොඩනැගිලි අතහැර දමා ඇත. නමුත් ඒ තුලින් නගරයේ අනන්‍යතාවය හා උරුමය විදහා දක්වන ස්මාරක විනාශ වී යමින් පවතී.

*රූපය අංක 5.18 : අත්හැර දමා ඇති පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන*




මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

ii. පුරාවිද්‍යාත්මකව වැදගත් ස්ථාන ඌණ සංවර්ධිත මට්ටමේ පැවතීම

නිවැරදි හිමිකරුවන් සිටියත් බොහෝ පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන ඌණ සංවර්ධිත මට්ටමේ පවතී. උදාහරණ ලෙස වෙලේකඩේ විවෘත වෙළඳසැල වැනි ස්ථාන හැඳින්විය හැකිය. මෙම ස්ථාන මහජන ප්‍රවේශයට දිය හැකි නමුත් එසේ නොපවතින හුදකලාවූ ගොඩනැගිලි ලෙස නගරයේ පවතී.

*රූපය අංක 5.19 : ඌණ සංවර්ධිත මට්ටමේ පවතින පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන*



වෙලේකඩේ විවෘත වෙළඳසැල

## අවස්ථා

i. ආගමික ස්ථාන ආශ්‍රය කරගෙන පැමිණෙන සංක්‍රමණික ප්‍රජාව

නගරයේ නේවාසික ප්‍රජාව හැරුණුකොට නගරයට උරුමයක් ලෙස පවත්නා මුතියංගණ රජමහා විහාරය වැනි ස්ථාන සඳහා නගරයට පිටතින්ද සංක්‍රමණිකයන් පැමිණෙයි. මේ තුලින් නගරයට සංක්‍රමණිකයන් පැමිණීමට මෙම පූජා භූමියද හේතු වී ඇත. මුතියංගණ රජ මහා විහාරයට පෙරහැර කාල සීමාව දෛනිකව 10,000 පමණ බැතිමතුන් ප්‍රමාණයක් පැමිණෙති.

## 5.2 සංවර්ධන පීඩන විශ්ලේශන ක්‍රම වේදය (Development Pressure Analysis)

බදුල්ල නගර සීමාව තුල පවත්නා භූමි පරිභෝජනය, ජන ඝණත්වය, ජනගහන වර්ධන වේගය, මාර්ග ඝනත්වය මත සංවර්ධන පීඩන විශ්ලේෂණය සිදු කරන ලදි. ඒ අනුව සිතියම 5.12 පරිදි සංවර්ධන පීඩන විශ්ලේෂණය හඳුනාගත හැකිය.

*වගුව අංක 5.17 : බදුල්ල නගරයේ සංවර්ධන පීඩන විශ්ලේෂණ සාරාංශය*

| කලාප වර්ගය | විස්තරය | ප්‍රදේශය කි.මී. |
|---|---|---|
| 1 | අඩු සංවර්ධිත | 0.33 |
| 2 | මධ්‍ය සංවර්ධිත | 3.24 |
| 3 | සංවර්ධිත | 5.74 |
| 4 | ඉතා සංවර්ධිත | 1.2 |
| එකතුව | | 10.06 |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය- ඌව පළාත් කාර්යාලය, 2017

සංවර්ධන පීඩනය විශ්ලේෂණය අනුව නගර මධ්‍යයේ තැනිතලා භූමි ප්‍රදේශයට ඇති ඉල්ලුම ඉහල මට්ටමක පවතී. එසේම නේවාසික කලාප ලෙස දැනටමත් සංවර්ධිතව පවතින බදුළුපිටිය, කණුපැලැල්ල වැනි ප්‍රදේශවලද ඉහල ඝණත්වයක් පෙන්නුම් කරයි. සාමාන්‍ය බෑවුම් කලාප වලට මධ්‍ය ඝණත්වයක් ඒකරාශී වී ඇති අතර වනාන්තර හා පතන බිම් වලින් සමන්විත කඳු මුදුන් අවම ඝණත්ව තත්ත්වයේ ඇත. සංවර්ධන පීඩනය විශ්ලේෂණය සාරාංශය අනුව ද නගර මධ්‍යය වූ වර්ග කිලෝමීටර 1.2 ක සීමිත ඉඩ ප්‍රමාණයට ඇති ඉල්ලුම ඉහළ මට්ටමක පවතී.එය මුළු භූමි ප්‍රමාණයෙන් 11% ක් වේ. මධ්‍ය සංවර්ධිත හා සංවර්ධිත මට්ටමේ පවතින ඉඩම් ප්‍රමාණය මුළු භූමි ප්‍රමාණයෙන් 84.7% ක් වේ.

සිතියම අංක 5.12 : සංවර්ධන පීඩන විශ්ලේෂණ ක්‍රමවේදය



# 6. සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

සිතියම අංක 6.1 : සංකල්පිත සැලැස්ම



### 6.1.2 සංකල්පිත සැලැස්ම හැඳින්වීම

සංකල්පිත සැලැස්ම තුලින් බදුල්ල නගරයේ අපේක්ෂිත නාගරික ව්‍යුහය පෙන්නුම් කර ඇත. මේ තුළින් ප්‍රධාන අංශ හතරකට අවධානය යොමු කර ඇත. එනම් නේවාසික සේවා, වාණිජ සේවා ආයතනික සේවා සංවර්ධනය හා පාරිසරික තිරසාර භාවයයි. ප්‍රදේශයේ පාරිසරික සංවේදීභාවය සැලකිල්ලට ගෙන පරිසරයට හානියක් නොවන සංවර්ධන කාර්යයන් සඳහා මුල් තැනක් දී ඇත. ඒ අනුව පවතින පරිපාලන හා සෞඛ්‍ය සේවා සංවර්ධනය සඳහා නාගරික භූමි ව්‍යුවහයේ ප්‍රධාන තැනක් ලබා දී ඇත. අනාගත බදුලු නගරයේ නගර මධ්‍යය ප්‍රදේශයේ භූමියේ බහුතරය මේ සඳහා වෙන් කර ඇත. ඒ තුලින් කාර්යක්ෂම සේවා සැපයීමක් අපේක්ෂිතය. කලාපයේ පරිපාලන අගනගරය ලෙස පවත්නා නාමය සෞඛ්‍ය සේවා අංශයත් සමග එක්ව කලාපයේ ප්‍රමුඛතම සේවා සැපයුම්කරු බවට පත් වනු ඇත.

සේවා සැපයුම්කරු වෙත පැමිණෙන සංක්‍රමණික හා නේවාසික ප්‍රජාව උදෙසා වාණිජමය අවශ්‍යතා සපුරාලීමටත් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරිමටත් පහල වීදිය ආශ්‍රිතව ප්‍රධාන වාණිජ කලාපය හා සබැදුනු වාණිජ සේවා කලාප 04ක් අපේක්ෂිතය එහිදී පිං අරාව සිට වෙලේකඩේ දක්වා සෞඛ්‍ය සේවා අන්තර්ගත වාණිජ පහසුකම්, කයිලගොඩ සිට පුවක්ගොඩමුල්ල දක්වා ආයතනික හා නේවාසික සේවා අන්තර්ගත වාණිජ පහසුකම් හිඳගොඩ ආශ්‍රිතව සංක්‍රමණික හා නේවාසික ප්‍රජාවගේ වානිජ සේවයත්, දුම්රියපල ආශ්‍රිතව තොග බඩු හා දෛනික අවශ්‍යතා ඇතුලත් වාණිජ සේවා අන්තර්ගත කොට සංවර්ධනය වනු ඇත.

නගරයේ නේවාසික ප්‍රජාව සහ අනාගත බදුල්ල නගරයට පදිංචිය සඳහා සංක්‍රමණය වන ජනතාවත් සැලකිල්ලට ගෙන නගර මධ්‍යය ක්‍රියාකාරිත්ව ප්‍රදේශයේ සිට පහසු ප්‍රවේශකත්වය සහිත නේවාසික කලාප ඇතිවනු ඇත.භූ විශමතාවයෙන් මදක් බෑවුම් කලාප නේවාසික කලාප ලෙස නගර මධ්‍යය එම ප්‍රජාවගේ විනෝදාස්වාදය සහ දෛනික අවශ්‍යතා පූර්ණය වන ප්‍රදේශ ලෙස පවතිනු ඇත.

පාරිසරික සංවේදි කලාප ප්‍රධාන වශයෙන් ස්වාභාවික ආපදාවන්ට ගොදුරුවිය හැකි ප්‍රදේශ වේ. මෙම ප්‍රදේශ සංරක්ෂිත කලාප ලෙස පවතිනු ඇත. මීට අමතරව නගර මධ්‍යය හරිත කලාප ඇති කර ඒවා අතර සහ සම්බන්ධතාව තුලින් පදික පහසුව හා නගර අලංකරණය ඇති වනු ඇත. මෙහිදි හරිත මංතීරු, පදික මාර්ග ආශ්‍රිතව ඇති කර පදික පහසුව වැඩි කිරිමට අපේක්ෂිතය. පරිපාලන හා සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පැමිණෙන ප්‍රජාව පෞද්ගලික ප්‍රවාහන ජාල භාවිතා නොකොට ඇවිදිමේ (walkability) ප්‍රවණතාවය ඇති වනු ඇත. සේවා ස්ථාන ආශ්‍රිතව හඳුනාගත් රථ වාහන නැවතුම් පලවල වාහන නතර කර හිරිත තීර ඔස්සේ ගොස් සේවා ලබා ගන්නා නගරයක් ලෙස බදුල්ල අනාගතයේ පත් වනු ඇත.

## 6.2 භූමි හා ගොඩනැගිලි සංවර්ධන උපක්‍රම

### 6.2.1 යෝජිත ඉඩම් පරිහරණ සැලසුම

**සිතියම අංක 6.2 : යෝජිත ඉඩම් පරිහරණ සැලසුම**



### 6.2.1.1යෝජිත ඉඩම් පරිහරණ සැලසුම හැඳින්වීම

ඌව පළාතේ ප්‍රධාන අගනගරය ලෙස ඌවේ සේවා සැපයීමේ ප්‍රමුඛයා බදුල්ල නගරය පත්ව ඇත. ඉතිහාසයේ පටන්ම අද දක්වාම එකී ඌවේ සේවා සැපයීමේ ප්‍රමුඛස්ථානය රැඳී පවතී. ඒ අනුව ඓතිහාසිකව බදුල්ල නගරයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. සේවා සැපයීම උදෙසාම ගොඩනැගුණු භූමි පරිභෝජනයකට උරුමකම් කියන බදුල්ල නගරයේ අනෙකුත් සියලු අංශ සේවා සැපයීමට සහායක වී ඇත.

බදුල්ල නගරය ලෙස ඉතිහාසයේ පටන්ම සැලකීම හේතුකොටගෙන ආගමික, අධ්‍යාපනික, වාණිජ යන අංශයන්ගෙන් සුවිශේෂීතාවයන් එක්ව ඇත. ඒ අනුව ආගමික පරිසරය හා මුසුව මුතියංගණ රජ මහා විහාරය හා සබැඳුනු සමාජයීය හා සංස්කෘතික වටපිටාවක් බිහිවී ඇත. එකී සබැඳියාව හේතුකොටගෙන පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි, නගරයට ආවේනික ගෘහ නිර්මාණ රටා බිහිවී ඇත. නගරයේ ස්වරූපය ඔප දැමීමට මෙකී ආගමික පරිසරය හේතුවී ඇත. බදුල්ල 2018-2030 සංවර්ධන සැලැස්ම තුලින්ද ඇති කිරීමට අපේක්ෂිත නාගරික ව්‍යුහය එකී බදුළු ස්වරූපයට හානි නොවන ආකාරයට සිදු කිරීමට යෝජිතය.

නගර මධ්‍යයේ පවතින නගරයටම ආවේනික වූ මාර්ග පද්ධතියකි. බදුල්ල මුතියංගණ රජ මහා විහාරයේ සිට බදුල්ල බන්ධනාගාරය දක්වා දිවෙන පහළ රජ වීදියට, ඊට සමගාමීව යන රජ වීදියේ සිට එකතුවන මාර්ග 8 කි. ඒ අනුව නගර මධ්‍යය මාර්ග, ජාල රූපි (Grid) ස්වභාවයක් ගනී. නගර මධ්‍යය පවත්නා කතරගම දේවාලය ආශ්‍රිත හරිත පරිශ්‍රය මෙම ජාලය තුල නාගරික තදබදය පැතිරීම අවම කිරීමට හේතු වී ඇත.

යෝජිත ඉඩම් පරිහරණ සැලසුමෙන් මෙම ජල රූපි මාර්ග රටාවේ මාර්ග වලට එයටම අනන්‍ය වූ ස්වරූපයක් එකතු කිරීමට යෝජිතය. ඒ අනුව රජ වීදිය ආශ්‍රිතව ඇති ආයතනික සේවා සඳහා පහසුකම් සැපයෙන පරිදි හරිත පදික මංතීරුත්, පහළ වීදියේ වාණිජ සේවාවලට පහසුකම් සැපයෙන පරිදි සුවිශේෂී පදික මංතීරුවලිනුත් නගරයේ පදික සංසරණය වැඩි දියුණු වනු ඇත. නගර මධ්‍යයේ පවත්නා මිශ්‍ර භූමි උපයෝජනයක් දිරි ගැන්වෙන පරිදි ඉහල ඝණත්ව මිශ්‍ර කලාපය නගර මධ්‍යයේ සිට වෙලේකඩේ දක්වාත්, පස්සර පාර හිඳගොඩ දක්වාත්, වේවැල්හින්න මාර්ගය එළදළුව හන්දිය දක්වාත්, මහියංගණය පාර කයිලගොඩ දක්වාත් පැතිර පවතී. ඒ තුලද ආයතනික සේවා හා එයට සහායක වාණිජ සේවා සඳහා මූලිකත්වයක් දෙනු ලැබේ. මීට අමතරව නාගරික ව්‍යුහයේ පවතින තදබදය අවම කිරීමටත් දෛනිකව නගරයට සංක්‍රමනය වන ප්‍රජාවට අවශ්‍ය විනෝදායනය ලබාදීමටත් අලිකුඹුර, මැදිරිය හරිත බිම් තීරුව, බදුළුපිටිය හරිත බිම් තීරුව ඇතිවනු ඇත.

ආයතනික හා වාණිජ සේවා හැරුණුකොට බදුල්ල 2018-20130 සංවර්ධන සැල්ස්මෙහි ප්‍රධාන අරමුණ වූ සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනයට සෞඛ්‍ය කලාපය ඇතිවී ඇත. බදුල්ල මහ රෝහල ආශ්‍රිතව සෞඛ්‍ය සේවය ඌව පළාතේ ප්‍රධානම සෞඛ්‍ය සේවා සැපයුම්කරු වන අතර පළාතෙන් ඔබ්බටත් සෞඛ්‍ය සේවය ලබා දීමට වර්තමානයේ බදුල්ල නගරයට හැකියාව පවතී. ඒ අනුව යෝජිත බදුල්ල සංවර්ධන සැලැස්ම (2018-2030) හරහා එමසේවය වැඩිදියුණු කිරීමට භූමි ව්‍යුහය ඊට හිතකර අන්දමින් යෝජිත වී ඇත. ඒ අනුව අත්‍යාවශ්‍ය සේවා ලෙස සැලකෙන සෞඛ්‍ය සේවය සඳහා මධ්‍යම ඝනත්ව ගොඩනැගිලි සමුදායකින් නමුත්

සංවර්ධන අතින් නගරයේ වැඩිම සංවර්ධන ගුණකයක් මත සෞඛ්‍ය සේවා කලාපය ඇතිවී ඇත. බදුල්ල මහ රෝහල ආශ්‍රිතව පැමිණෙන රෝගීන්ට පහසුවන ආර්ථික කටයුතුත් විවේක ස්ථානත් බිහිවීමට යෝජිතය. රෝහලේ භූමි පරිභෝජනය ව්‍යාප්ත කර ඒ තුල පහසු ප්‍රවේශකත්වයක් සපයා දී ඇත. එසේම රෝහල පදනම්කොට ගත් වාණිජමය සෞඛ්‍ය සේවා රෝහල ඉදිරිපසම ව්‍යාප්ත කර රෝගීන්ගේ සේවා පහසුව ඇති කර ඇත.

මිශ්‍ර කලාපයට යාබදව බදුළුපිටිය ඉහල ඝනත්ව ආයතනික හා නේවාසික භාවිතයන්ගෙන් අනූන කලාපය ඇති වී ඇත. අවිධිමත් අඩු ආදායම්ලාභී නිවාස වෙනුවට විධිමත් යටිතල පහසුකම්වලින් සපිරි සිරස් නේවාසික සංවර්ධනයකි. ආයතනික සේවාලාභීන්ට පහසුවෙන් ප්‍රවේශකත්වයක් ලබාගත හැකි බදුළුපිටිය දෙසට ව්‍යාප්තවූ පරිපාලන සංකීර්ණ කිහිපයකි.

නගරය වටා වූ නේවාසික කලාපය නගර මධ්‍යයට සම්බන්ධ කෙරුණු සැහැල්ලු දුම්රිය සේවාවකි. බදුල්ල දුම්රිය ස්ථානය හා මනා යටිතල පහසුකම්වලින් යුක්තව ව්‍යාප්ත කරන ලද බදුල්ල ප්‍රධාන බස් නැවතුම්පොල යා කරමින් සැහැල්ලු දුම්රිය සේවාව දිවෙයි. නගරයේ ආයතනික, අධ්‍යාපනික, සෞඛ්‍ය සේවා සමඟ වටා පිහිටි නේවාසික කලාපවල ගමනාගමනය පහසු වී ඇත.

නගරය මධ්‍යයේ සිට කඳු ප්‍රදේශ දක්වා බෑවුමත් සමඟ ඇති වී ඇති බෑවුම් ප්‍රදේශ අඩු ඝනත්ව නේවාසික ප්‍රදේශ ලෙස පවතී. නේවාසික භාවිතය පමණක් දිරිමත් වන මේ කලාපයේ අවම ගොඩනැගිලි ඝනත්වයකි.

බදුල්ල නගරයේ සුවිශේෂිතම පාරිසරික අංගය බදුළු ඔය වර්තමානයේ නගරයේ අප ජලය ගලා යෑමට පවතින ජලධාරයක්ව පවතී. නමුත් 2018-2030 සංවර්ධන සැලැස්මේ දැක්මට අනුව යමින් බදුළු ඔය හා සබැඳුනු ඒ බදුල්ලේ ස්වභාවය නැවත නගරයට එක්ව ඇත. නගරයට ස්වභාවික අලංකාරයක් නේවාසික ප්‍රජාවට විවේකී විනෝදාස්වාදයක් එක් කරමින් බදුළු ඔය මැදිරිය පාර හරිත බිම් තීරුව, ග්‍රීන් ලේන් ඩ්‍රයි , ඔසු උයන, කණුපැලැල්ල පාර ගඟ රක්ෂිතයේ ව්‍යායාම මංතීරු හරහා නගරයට දිස් වනු ඇත.

නගරය වටා එසවී ඇති කඳු පංතින් දේශීය වන වගාවෙන් වැසි හරිත මුදුන් ලෙස නගරයට දිස් වනු ඇත. 2018-2030 බදුල්ල සංවර්ධන සැලැස්මට අනුව ඌව නීල හරිත මිටියාවතේ පවතින පරිපාලන සුව සේවා නගරය ලෙස බදුල්ල සුව සේවා නගරය ලෙස බදුල්ල සේවා සැපයුමේ ප්‍රමුඛයා බවට පත්විමට මෙලෙස භූමි පරිහරණය යෝජිතය.

## 6.3භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම

බදුල්ල ඌව පළාතේ ප්‍රධාන පරිපාලන අගනගරය වීම හේතුවෙන් දෛනිකව නගරයට සිදුවන ජන සංක්‍රමනය 100,000 ක් පමණ බව ගණන් බලා ඇත. එසේම නගරය තුළ ඇති සේවා ස්ථානවල රැකියා කරන ප්‍රජාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පදිංචිය සඳහා බදුල්ල නගර සීමාවට සංක්‍රමණය වීමද ඉහල මට්ටමක පවතී. ඒ අනුව එකී සියළු ප්‍රජාව සැලකිල්ලට ගනිමින් භෞතික හා සමාජයීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කළ යුතුව ඇත.

බදුල්ල නගරයට පදිංචිය සඳහා සිදුවන සීඝ්‍ර ජන සංක්‍රමනිකයන්ගෙන් බහුතරය රැකියා පදනම්කරගත් සංක්‍රමණිකයන් වේ. එසේ සංක්‍රමණය වන පිරිස හා රාජ්‍ය , අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ගේ සේවය සඳහා දෛනිකව නගරයට පැමිණෙන පිරිස දෙයාකාර වේ. මෙම සියළු ප්‍රජාව යම්කිසි අධ්‍යාපනික තත්ත්වයකින් හෙබි මධ්‍යම හා ඉහළ සමාජ තලවලට අයත් වූ පරිපාලන නිලධාරින්, වෛද්‍යවරු, මාණ්ඩලික නිලධාරීන් වැනි පිරිසක් වීමද සුවිශේෂී වේ. ඒ අනුව අපරව්‍යුහ පහසුකම් එම සමාජ තල නියෝජනය කරන පිරිසට ගැලපෙන ආකාරයට සැකසිය යුතු වේ. එහිදී එම සේවා සැපයුම්කරුවන්ගේ දරුවන් සඳහා ගැලපෙන අධ්‍යාපනික ආයතන හා ඒවාට පහසුකම් ද, ඔවුන්ගේ වාණිජ අවශ්‍යතා, විනෝද කටයුතුද පූර්ණය වන සේ යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතු වේ.මීට අමතරව දෛනිකව පැමිණෙන ප්‍රජාව සැලකීමේදී පරිපාලන හා සෞඛ්‍ය යන දෙඅංශයේම සේවා වපසරිය ඌව පළාතට පමණක් නොව මඩකලපුව වැනි ප්‍රදේශවලටද පැතිරේ. එහිදී පැමිණෙන ප්‍රජාව සියළු සමාජතලයන් නියොජනය කරන්නවුන් වේ. ඒ අනුව එකී සියළු ප්‍රජාව සඳහා ගැළපෙන ප්‍රශස්ත වූ යටිතල පහසුකම් සැපයීම මේ යටතේ සිදු විය යුතුය.

### 6.3.1 යෝජිත සේවා සැපයුම් සැලැස්ම

බදුල්ල සංවර්ධන සැලස්ම 2018-2030ට අනුව බදුල්ල නගරය ඌව නීල හරිත මිටියාවතේ පරිපාලන හා සුව සේවා නගරය බවට පත් කරලීම දැක්ම ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව කලාපයේ පරිපාලන හා සෞඛ්‍ය සේවා කේන්ද්‍රස්ථානය බවට පත් කිරිම අරමුණු වී ඇත.මේ යටතේ හඳුනාගත් පරමාර්ථ හතරක් හරහා සේවා ආශ්‍රිත පහසුකම් විධිමත් කිරීමටත්, ඒ තුලින් නගරයේ නොවාසික ප්‍රජාවගේ සේවා පූර්ණය කිරීමටත් අපේක්ෂිතය. ඒ අනුව නගරයේ නේවාසික ප්‍රජාවත්, සංක්‍රමණික ප්‍රජාවත් යන දෙවර්ගයටම මේ හරහා පහසුකම් සැපයීමට අපේක්ෂිතය.

ඒ අනුව දැනට පවතින නාගරික ව්‍යුවහය තුළ සේවා සැපයීම දෙවර්ගයකි.එනම් ආයතනික සේවා හා සෞඛ්‍ය සේවා වේ. ආයතනික සේවා පරිපාලන කටයුතු, අධ්‍යාපනික ලෙසද වර්ගීකරණය කළ හැකිය. ආයතනික සේවා නගරය පුරා විසිරි ඇති අතර, සේවා සපයා ගැනීමටත් පැමිණෙන ප්‍රජාවටත් සේවා ස්ථාන වල රැකියා කරන පිරිසටත් එය විශාල ගැටලුකාරි තත්වයකට පත් වී ඇත. එනම් බොහෝ ආයතන සඳහා ස්ථිර ස්ථානයකත් නොමැති අතර බොහොමයක් කුලී පදනම මත ලබා ගත් ස්ථාන වල පිහිටා ඇත.

එසේම සෞඛ්‍ය සේවා ආශ්‍රිතවද පවත්නා භූමි වපසරිය මේ වන විට ප්‍රමාණවත් නොමැත. පවත්නා රෝහල් පරිශ්‍රයේ පුරා විද්‍යා ගොඩනැගිලි හේතුවෙන් එහි සිරස් සංවර්ධයක් සිදු කිරිමට නොහැකි වී ඇත. එසේම

රෝහලට පැමිණෙන ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සලසා දෙන ඒකාබද්ධ පරිශ්‍රයක් ද නොමැත. මේ හේතුව මත රෝගීන් හා රෝගීන් බැලීමට පැමිණෙන ප්‍රජාවද විශාල ගැටලුකාරි තත්වයන්ට මුහුණ පා ඇත.

ආයතනික සේවා ලබා ගන්නා සේවා වපසරිය ඌව පළාතටම පොදු වන අතර, සෞඛ්‍ය සේවා සඳහා ඌව පළාතටම පොදු වන අතර, සෞඛ්‍ය සේවා සඳහා ඌව පළාතට ඔබ්බෙන් වූ මඩකලපුව වැනි ප්‍රදේශ සිටද සංක්‍රමණය වේ. මෙම ආයතනික සේවා හා සෞඛ්‍ය සේවා පදනම් කරගෙන පදිංචිය සඳහා සීඝ්‍ර ජන සංක්‍රමණයක් නගරය තුළට පවතින අතර මෙම සංක්‍රමණික ප්‍රජාවගේ හා දැනට සිටින නේවාසික ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනික පහසුකම් සපුරාලීම උදෙසා සැකසුනු අධ්‍යාපනික ආයතන සමූහයක්ද පවති. නගරයේ දැනට සිටින මුළු ළමුන් ප්‍රමාණය 11,935ක් වන අතර 9249ක ප්‍රමාණයක් නගරයට පිටතින් පැමිණ අධ්‍යාපනික සේවා ලබා ගන්නා බව දත්ත විශ්ලේශනයේදී තහවුරු විය.

ඒ අනුව වර්තමානය වන විට සංසරණ ප්‍රජාවගේ 58% ක්ම සංසරණය වීම සඳහා පදනම් වනුයේ මෙම සේවා සැපයීමයි. ඒ අනුව අපේක්ෂිත ජනගහන වර්ධනයත් හා සංවර්ධන ව්‍යාපෘතින් සමග එය අනුව අපේක්ෂිත ජනගහන වර්ධනය හා සංවර්ධන ව්‍යාපෘතින් සමග එය 20% කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ඒ අනුව දැනට පවත්නා තත්ත්වයත්, අපේක්ෂිත සංවර්ධනයත් සමග ඇතිවන තත්ත්වයත් මත සේවා සැපයීමේ සුවිශේෂි වර්ධනයත් අවශ්‍ය වී ඇත. ඒ අනුව 2018-2030 බදුල්ල සංවර්ධන සැලැස්මහි අපේක්ෂිත දැක්මට අනුව පවත්නා සංවර්ධන උපනතීන් සේවා අශ්‍රිත සංවර්ධනයක් කරා යොමු කිරීමට අපේක්ෂිතය. එහිදී ඒකරාශි වන ප්‍රජාවගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීමේදී මහියංගන පාර සිට බදුලුපිටිය දක්වා විහිදුන අධ්‍යාපනික හා උසස් අධයාපනිකත ආයතනික භූමි ඇති කිරිමේ පරමාර්ථයද සාක්ෂාත් කර ගැනීමටද අපේක්ෂිතය. ඒ අනුව හඳුනාගත් උපාය මාර්ග දෙකකි.

### i. සේවා ආශ්‍රිත කලාපීකරණය කිරිම

මේ යටතේ සේවා සැපයීම සඳහාම සුවිශේෂ වූ කලාප තුනක් කලාපීයකරණ සැලැස්ම හරහා හඳුන්වා දී ඇත. නගර මධ්‍යය මිශ්‍ර කලාපය, බදුලුපිටිය ආශ්‍රිතව පරිපාලන හා නේවාසික මිශ්‍ර කලාපයක්, බදුල්ල මහ රෝහල පදනම් කොටගත් සෞඛ්‍ය සේවා කලාපයත් වශයෙනි. මෙම කලාප තුළ සේවා සැපයීම උදෙසා ඒ ඒ සංවර්ධන උපනතීන් හා සංවර්ධන විභවතාව අනුව පහසුකම් සලසා ඇත. මෙම උපාය මාර්ග හරහා සේවා සැපයීමේ ක්‍රියාවලිය විධිමත් කිරිමට හඳුනාගත් උපාය මාර්ගික ව්‍යාපෘති කිහිපයකි.

1. බදුල්ල මහ රෝහල ආශ්‍රිත ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සැපයුම් කලාපයක් ඇති කිරිම.

වර්තමානය වන විට බදුල්ල මහ රෝහලෙහි සෞඛ්‍ය සේවා පදනම් කරගෙන පැමිණෙන සංක්‍රමණික ප්‍රමාණය මුළු සංක්‍රමණික ප්‍රමාණයෙන් 18% ක් පමණ වේ. ඒ අනුව නගරයට ඇති සුවිශේෂිතම විභවතාවයක් ලෙස එම සේවාවේ උපරිම ඵලදායිතාව ලබා ගැනීමට අපේක්ෂිතය. එසේම පැමිණෙන සංක්‍රමික ප්‍රජාව සඳහා ප්‍රශස්ථ සේවා සැපයීමක් සිදු කිරීමත් අපේක්ෂිතය. මේ සඳහා බදුල්ල මහ රෝහල පසුපස ඉඩම් සෞඛ්‍ය සේවා කටයුතු ඇතුලත් ව්‍යාපෘතියක් සඳහා යෝජිතය. මෙම ව්‍යාපෘතිය තුළින්

රෝගීන් සඳහාත්, රෝගීන් බැලීමට පැමිණෙන පිරිසටත් අවශ්‍ය ආහාර, නවාතැන් පහසුකම් ඇතුළත් ඒකාබද්ධ සේවා සැපයුම් ස්ථානයක් ඇති කිරීමට යෝජිතය. ඒතුළින් රෝහල ආශ්‍රය කරගෙන මැදිරිය පාර දෙසට ව්‍යාප්ත වූ සෞඛ්‍ය කලාපය ප්‍රවර්ධනයට යෝජිතය.

**සිතියම අංක 6.3 : යෝජිත බදුල්ල මහ රෝහල පුළුල් කිරීමේ ව්‍යාපෘති ඉඩම**




ඒ අනුව බදුල්ල මහ රෝහලට සේවා සැපයීමේ වපසරියට ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස සෞඛ්‍ය සේවා වැඩි දියුණු වෙතැයිඅපේක්ෂිතය.

*රූපය අංක 6.1 : බදුල්ල මහ රෝහලේ සේවා සැපයුම් ව්‍යාප්තිය*




මූලාශ්‍රය : Google Earth

### i. සේවා ආශ්‍රිත කලාපයන්ට නොගැලපෙන භූමි උපයෝජනයන් වෙනස් කිරීම හා විධිමත් කිරීම

මේ තුලින් සේවා සැපයීම සඳහා වූ ස්ථාන නගර මධ්‍යයට ඒකරාශී කිරීමත්, සේවා සැපයීම සඳහාම වෙන්වූ කලාපයන්ගේ ඇති සංක්‍රමණික ආකර්ෂණය අඩු භූමි උපයෝජනයන් වෙනත් කලාපවලට යොමු කිරීමටත්, පවතින භූමි ව්‍යුවහය තුළ වැඩිදුර සංවර්ධනයට ලක් කළ නොහැකි භූමි උපයෝජන සඳහා සුදුසුම ස්ථාන ලබා දිමත් සිදු වේ. මෙම උපායමාර්ගය යටතේ ක්‍රියාත්මක විය යුතු උපායමාර්ගික ව්‍යාපෘති කිහිපයකි.

1. බදුල්ල පරිපාලන සංකීර්ණය අදියර II ව්‍යාපෘතිය

වර්තමානය වන විට ආයතනික සේවා නගරය පුරා විසිරි පවතිනුයේ එම ආයතන සඳහාම වෙන්වූ ස්ථාන නොමැතිකම නිසාවෙනි. නගරය පුරා එසේ විසිර ඇති ආයතන සංඛ්‍යාව 12 ක් පමණ වේ. නමුත් ඒ තුලින් නගරයට සේවා ලබා ගැනීම උදෙසා පැමිණෙන ප්‍රජාව විශාල ගැටලුකාරි තත්ත්වයකට පත් වෙයි.

2018-2030 බදුල්ල සංවර්ධන සැලැස්මෙහි දැක්මට අනුව මෙම ආයතන සියල්ලක්ම නිවැරදි පහසු ප්‍රවේශකත්වයක් සහිත ස්ථානයකට යොමු කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිතය. ඌව පළාත් අණ්ඩුකාර කාර්යාලයට යාබදව පිහිටා ඇති ඉඩමෙහි මෙය සිදු කිරීමට අපේක්ෂිතය.

**සිතියම අංක 6.4 : යෝජිත පරිපාලන සංකීර්ණය අදියර 2**




2. බදුල්ල බන්ධනාගාරය හා නිල නිවාස බදුල්ල මහ නගර සභාවෙන් පිටත ප්‍රතිශ්ඨාපනය කිරීම

පළාත් අග නගරය වීම හේතු කොට ගෙන ඉතිහාසයේ පටන්ම බන්ධනාගාරය නගර මධ්‍යයේම පිහිටා තිබේ. නමුත් 2018-2030 බදුල්ල සංවර්ධන සැලැස්මෙන් හඳුනාගත් ආයතනික හා වාණිජමය කලාපයන්ට නොගැළපෙන බදුල්ල බන්ධනාගාරය, නගර මධ්‍යයේ ඉතා වටිනා භූමි කලාපයක පිහිටා ඇත. එසේම ඓතිහාසික වටිනාකම් හේතු කොට ගෙන ස්ථානගතව ඇති පුරාවිද්‍යා ගොනැගිලි හේතු කොට ගෙන බන්ධනාගාරයේ සංවර්ධන කටයුතු සීමා සහිත වී ඇත. මීට අමතරව වර්තමාන බදුල්ල බන්ධනාගාරය පිටුපස ඇති බන්ධනාගාර නිල නිවාස ද අවිධිමත් ආකාරයට නගරයේ තවදුරටත් සංවර්ධන කළ හැකි ඉඩම්වල පිහිටා ඇත.

මෙම හේතූන් අනුව බදුල්ල බන්ධනාගාරය, බදුල්ල පොලිසියට හා රෝහලට ඉක්මන් ප්‍රවේශකත්වයක් ලබා ගත හැකි ස්ථානයක නැවත ප්‍රතිස්ථාපනයට යෝජිතය. බදුල්ල මහ නගර සීමාවේ පවත්නා සීමිත ඉඩකඩ තුළ නගරයේ දෛනික ක්‍රියාවලියට අවම දායකත්වයක් දක්වන බැවින් බදුල්ල බන්ධනාගාරය බදුල්ල මහ නගර සීමාවෙන් පිටතට ප්‍රතිස්ථාපනයට යෝජිතය.

3. බදුළුපිටිය පාර බන්ධනාගාර නිල නිවාස සහිත ඉඩම තුළ නව පරිපාලන සංකීර්ණය

2018- 2030 බදුල්ල සංවර්ධන සැලැස්මහි හඳුනාගත් ගැටළුවලට අනුව පරිපාලන ආයතන නගරය පුරා විසිර පැවතීම නගරයේ සේවා ආශ්‍රිත සංවර්ධනය උදෙසා ගැටළුකාරී වී ඇත. මෙයට පිළියමක් ලෙස ආයතන ඒකාබද්ධ වූ පරිපාලන සංකීර්ණවල අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව බදුළුපිටිය බන්ධනාගාර නිල නිවාස පවත්නා ඉඩම මේ සඳහා යෝජිතය. (සිතියම අංක 2.18 )

**සිතියම අංක 6.5 : යෝජිත බදුළුපිටිය පාර පරිපාලන සංකීර්ණය**




4. වත්මන් බන්ධනාගාරය සහිත ඉඩම තුළ වාණිජමය මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීම

පහළ වීදිය ආශ්‍රිතව පවත්නා වාණිජමය භූමි පරිභෝජන රටාව ශක්තිමත් කරලීම උදෙසා මෙම ව්‍යාපෘතිය යෝජිතය.

**සිතියම අංක 6.6 : යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය -බන්ධනාගාර ඉඩම**




5. බදුල්ල තානායම් පරිශ්‍රය - මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

පහසු ප්‍රවේශකත්වය, ස්ථානිය සුදුසුකම හා වාණිජ වටිනාකම කරුණු සලකා බලා මිශ්‍ර සංවර්ධන ක්‍රියාකරකම් වලින් සම්පිණ්ඩනය වූ ව්‍යාපෘතියක් බදුල්ල තානායම් පරිශ්‍රය තුළ ස්ථානගත කිරීමට යෝජිතය.

**සිතියම අංක 6.7 : යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය**



6. බදුළුපිටිය නිවාස සංවර්ධන ව්‍යාපෘතිය

**සිතියම අංක 6.8 : යෝජිත බදුළුපිටිය නිවාස සංවර්ධන ව්‍යාපෘතිය**




බදුළුපිටිය දැනට බදුල්ල නගරයේ ඇති ඉහළ ඝනත්ව නේවාසික ප්‍රදේශයකි. එමෙන්ම ස්වාභාවික ආපදා වන නායයෑම් උවදුරින් ද අවම බලපෑම් සහිත ප්‍රදේශයකි. නමුත් දැනට මහ නගර සභාව සතු ඉඩම් කට්ටිවල පදිංචිව සිටින අඩු ආදායම් ලාභී නේවාසික ප්‍රජාව සඳහා ඇත්තේ අවම යටිතල පහසුකම් හා ඉඩ ප්‍රමාණයකි. මේ හේතුව මත බදුළුපිටිය තුල අනවසර හා අවිධිමත් ඉදිකිරීම් බහුලව දක්නට ලැබේ.

මෙකී හේතූන් මත බදුළුපිටිය දැනට පවත්නා අඩු ආදායම් ලාභී නිවාස තිරය විධිමත් ආකාරයට නිවාස සංවර්ධන ව්‍යාපෘතියක් හරහා විධිමත් නේවාසික ප්‍රදේශයක් ලෙස ඇති කිරිමට මේ තුලින් යෝජිතය. මේ සඳහා දැනට තිරස් ලෙස සංවර්ධනය වී ඇති නේවාසික භාවිතයන් සිරස් නේවාසික සංවර්ධනයක් ලෙස සිදු කිරීමට යෝජිතය.

7. මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

බදුල්ල කණුපැළැල්ල පාර බදුල්ල දිස්ත්‍රික් ලේකම් භාරයේ පවතින රූඩ් 2, අක්කර 6.4 ක ඉඩම තුළ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියක් සිදු කිරිමට යෝජිතය. මේ තුළින් නගරයේ සේවා ආශ්‍රිත රැකියාවල නියුක්ත ජනතාවගේ නේවාසික ගැටළුව විසඳනු ඇත.

**සිතියම අංක 6.9 : යෝජිත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය**




**අධ්‍යාපනික සේවා සැලැස්ම**

පරිපාලන හා සෞඛ්‍ය සේවා ප්‍රමුඛයා බවට බදුල්ල නගරය පත්වන විට නගරයේ නේවාසික ප්‍රජාවගේ අධ්‍යාපනික අවශ්‍යතා පූර්ණය කිරීමට අධ්‍යාපනික අයතන අත්‍යාවශ්‍ය. ඒ අනුව 2018-2030 නගර සංවර්ධන සැලැස්මට අනුව නගරයේ අධ්‍යාපනික ආයතන වල මනා යටිතල පහසුකම් වලින් පූර්ණය කළ නොහැකි ලෙස පවත්නා ස්ථානවල පවත්නා පාසැල්, ස්ථානගත වීම වෙනස් කිරීමට යෝජිතය. ඒ තුළින් පාසැල් සඳහා අවශ්‍ය ක්‍රීඩාගාර හා පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීමට යෝජිතය.

i. බදුල්ල සරස්වතී ප්‍රාථමික විද්‍යාලය පවත්නා භූමියෙන් ඉවත්කර මහියංගනය පාර සරස්වති මධ්‍ය මහා විද්‍යාල භූමි පරිශ්‍රයේම ස්ථානගත කිරීම.

දැනට පවත්නා ප්‍රාථමික විද්‍යාලය සඳහා වැඩිදුර සංවර්ධනයක් කිරීමට හැකියාවක් නොමැති අතර ක්‍රීඩාගාර පහසුකම්ද නොමැත. එසේම 2018- 2030 අපේක්ෂිත දැක්මට අනුව මෙම කලාපය තුළ සීඝ්‍ර වාණිජ සංවර්ධනයක් සිදු වනු ඇත. ඒ අනුව පාසල් ළමුන් සඳහා අවශ්‍ය වන සුරක්ෂිතතාවය හා පාසල් සංවර්ධනය සැලකිල්ලට ගෙන පාසල මෙම පරිශ්‍රයෙන් ඉවත් කර දැනට සරස්වතී මධ්‍ය මහා විද්‍යාල භූමියේම ප්‍රතිශ්ඨාපනයට යෝජිතය.

සිතියම අංක 6.10 : යෝජිත සරස්වතී කනිටු විද්‍යාල ප්‍රතිශ්ඨාපනය



### 6.3.2 යෝජිත ප්‍රවාහන සැලැස්ම

2030 අපේක්ෂිත දැක්මට අනුව සේවා පදනම් කොට ගත් වාණිජ ආර්ථිකයක් හිමි නගරයක් බවට බදුල්ල පත් වනු ඇත. ඒ සඳහා අපේක්ෂිත නේවාසික හා සංක්‍රමණික ජනගහණය සැලකීමේදී, නේවාසික ජනගහණය 56,000ක් දක්වාත් සංසරණ ජනගහණය 120,000 දක්වාත් වර්ධනය වනු ඇත.

නගරයේ හඳුනාගත් ගැටලුකාරි තත්ත්වයක් වන රථ වාහන තදබදයක් ඇතිවීමේ ප්‍රවණතවයට විසඳුමක් ලෙසත් අපේක්‍ෂිත දැක්මට අනුව සේවා සැපයුම් ස්ථාන අතර මනා සහ සම්බන්ධතාවය ඇති කරලීමටත්, අපේක්‍ෂිත රථ වාහන සංසරණය කාර්යක්‍ෂමව පවත්වාගෙන යාමටත් යෝජිත ප්‍රවාහන උපාය මාර්ග හරහා අපේක්‍ෂිතයි.

ඒ අනුව මනා යටිතල පහසුකම් වලින් සපිරි නගරයක් බවට පත් කරලීමේ අරමුණු සාක්ශාත් කරගැනීම සඳහා, ආයතනික, සෞඛ්‍ය විවේකි ස්ථාන හා නේවාසික කලාප අතර පවත්නා සංචලතාවය වැඩි දියුනු කිරීමට පරමාර්ථ සකසා ඇත. එසේම වාණිජ සේවා මාර්ග ආශ්‍රිතව වැඩි නියාමනයක් සිදු කිරීම හරහා නගර අලංකරණයටඅපේක්‍ෂිතය.

දැනට පවතින ප්‍රවාහන පද්ධතිය කාර්යක්‍ෂමව සිදුනොවීමටත් අපේක්‍ෂිත සංවර්ධනයත් සමග නගරයේ රථ වාහන තදබදය ඇති වීමේ ප්‍රවණතාවයක් බදුල්ල නගරයේ ප්‍රවාහන අංශය ආශ්‍රිතව පවත්නා ගැටලුවයි. මෙහිදි නගරයේ ඇති භූ විෂමතාවයත්, නගරයේ සේවා සැපයුම් ස්ථාන විධිමත් ආකාරයට ස්ථානගත නොවීමත් හේතුකොට ගෙන මෙලෙස රථ වාහන පද්ධතියේ විෂමරූපි රථ වාහන තදබදයක් ඇති වීමට හේතු වී ඇත.පේරාදෙනිය - බදුල්ල- චෙන්කලඩි මාර්ගයට ඉහළ ඒකරාශි වීම සහිතසේවා ස්ථාන සංකේන්ද්‍ර වී ඇත. එසේම විෂම භූ විෂමතාවය හේතු කොට ගෙන නගරයේ සංවර්ධන පීඩනය නගරයේ විමධ්‍යගත කිරීමටද නොහැකිය. ඒ අනුව මෙම තත්ත්ව මග හැර මනා ප්‍රවාහන පද්ධතියක් ඇති කරලීම සඳහා කාර්යක්‍ෂම ප්‍රවාහය ඇති කර ලීමේ උපාය මාර්ග යෝජිතය

කාර්යක්‍ෂම ප්‍රවාහනය උදෙසා නගරයේ වර්ථමාන හා අපේක්ෂිත වාහන සංසරණය සැලකිල්ලට ගන්නා ලදී. දැනට බදුල්ල නගරයට දෛනිකව සංක්‍රමණය වන වාහන ප්‍රමාණය 11,909 ක් පමණ වන අතර මෙයින් 90% ක්ම සැහැල්ලු වාහන වේ. එයිනුත් 35%ක්ම වෙන් වනුයේ ත්‍රී රෝද රථ භාවිතා කිරීම මෙයට හේතුවයි. දැනට සංසරණය වන මුළු ජනගහන ප්‍රමාණයට පැමිණෙන වාහන ප්‍රමාණය සමග සංසන්දනාත්මකව බලන විට 2030 වන විට එය 20%කින් වැඩිවීමේ ප්‍රවණතාවයක් ඇත. ඒ අනුව කාරයක්‍ෂම ප්‍රවාහනයක් ඇති කරලීමට පහත උපාය මාර්ගික ක්‍රියාවන් යෝජිතය.

### i. පවත්නා ඒ 5 මාර්ගයේ කොටසක් වෙනස් කිරීම

නගරය හරහා දිවෙන මාර්ග සංවර්ධන අධිකාරියේ නියාමනය වන A5 මාර්ගය බන්ධනාගාරය අසල සිට විහාරගොඩ දක්වා කොටසෙහි එක් දිශාවකට පමණක් වාහන ධාවනය සිදුවේ. එසේම එම කොටස තුල මාර්ග සංවර්ධන අධිකාරිය පැනවෙන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක්ද පවතී. ඒ අනුව A5 මාර්ගයේ දිශාව පහත ආකාරයට වෙනස් කිරීමට යෝජිත වේ.

***වගුව අංක 6. 1 : යෝජිත ඒ 5 මාර්ගයේ දිශානතිය***

| පවත්නා මාර්ගය | යෝජිත මාර්ගය |
|---|---|
| බණ්ධනාගාරය ඉදිරිපස සිට පහළ විදිය විහාරගොඩ කොස්ගස් හන්දිය දක්වා කි.මී. 1.08 | බණ්ධනාගාරය ඉදිරිපස සිට මාටින් සිල්වා මාවත, රිවර් සයිඩ් මාර්ගය හරහා කොස්ගස් හන්දිය දක්වා කි.මී. 1.12 |

**සිතියම අංක 6.11 : පවත්නා හා යොජිත ඒ 5 මාර්ගය**




### ii. මංසන්ධි සංවර්ධනය

නගරය හරහා වැටී ඇති ප්‍රධාන මාර්ගවල ඇතිවිය හැකි මාර්ග තදබදය අවම කිරීම සඳහා හඳුනාගත් ස්ථාන ආශ්‍රිතව මංසන්ධි සංවර්ධනයක් යෝජිතය.

1. බදුල්ල පළාත් මහ රෝහල ඉදිරිපිට
2. හිඳගොඩ- හිඟුරුගමුව පාර අසල
3. කයිලගොඩ හන්දිය

**සිතියම අංක 6.12 : යෝජිත මංසන්ධි සංවර්ධනය**




### iii. මාර්ග පළල් කිරීම

නගරය තුල පවත්නා මාර්ග එකිනෙකට සම්බන්ධ වූ ජාලයකින් (Grid) සමන්විතය. නමුත් භූගෝලීය පිහිටීම මත නගරයේ මධ්‍යය තැනිතලා ස්වභාවයකුත් නගරයෙන් පිටත භූමිය බෑවුම් ප්‍රදේශ වේ. එනිසා තැනිතලා ස්වභාවය ගත් මුළු භූමි ප්‍රමාණය ආශ්‍රිතවම සේවා ස්ථාන හා වාණිජ ස්ථාන පිහිටා තිබේ. එහිදී මෙම ස්ථාන කරා යොමු වීමට පවත්නා මාර්ගයන්හි පහසුකම් අවම මට්ටමක පවතී. ඒ අනුව, සේවා ස්ථාන, නේවාසික ස්ථාන හා වාණිජ කලාප සම්බන්ධ කරමින් දිවෙන පහත මාර්ගයන් පළල් කිරීම සඳහා යෝජිත වේ.

1. මහ රෝහල ඉදිරිපස සිට බදුල්ල බන්ධනාගාරය, රිවර් සයිඩ් මාර්ගය හරහා කොස්ගස් හන්දිය දක්වා කොටස
2. පිං අරාව හන්දිය සිට බදුල්ල මහ විද්‍යාලය දක්වා කොටස
3. කයිලගොඩ හන්දිය සිට හංවැල්ල පාර හරහා හිඳගොඩ දක්වා කොටස
4. හිඳගොඩ සිට හිඟුරුගමුව හරහා කණුපැලැල්ල දක්වා කොටස
5. දුම්රිය ස්ථානය ඉදිරිපස සිට දෙයියන්නෙවෙල මාර්ගය හරහා රජ වීදිය දක්වා

**සිතියම අංක 6.13 : යෝජිත මාර්ග පළල් කිරීම්**




**iv. නව මාර්ග සංවර්ධනය**

ආයතනික සේවා හා නේවාසික කලාප එකිනෙකට සම්බන්ධ කිරිමට පහත ස්ථානයන් යා කරමින් නව මාර්ග ඇති කිරීමට යෝජිත වේ.

1. මැදිරිය මාර්ගයේ සිට පිලිපොතගම මාර්ගය දක්වා

**සිතියම අංක 6.14 : මැදිරිය පාර නව මාර්ග සංවර්ධනය**




**v. විකල්ප මාර්ග සංවර්ධනය**

ආයතනික සේවා හා වාණිජ සේවා ලබාගැනීම අරමුණුකොට නගරයට පිටපතින් පැමිණෙන හා නගරය තුල සිටින ජනතාව මාර්ග පහසුකම් ලබාගන්නා පවත්නා මාර්ග ජාලය තුල මාර්ග ජාලය තුල මාර්ග තදබදයක් ඇතිවීමේ ප්‍රවණතාවයක් පවතී. පවත්වා පඩිපේලි පාර, පටු මාර්ග අවම මීටර 3ක පළල දක්වා සංවර්ධනයට යොජිතය. ඒ අනුව, විසඳුම ලෙස නගරය මධ්‍යයට ගමන් නොකොට සේවා ස්ථාන කරා යා හැකි හඳුනාගත් පහත විකල්ප මාර්ග යෝජිත වේ.

1. පිංඅරාව සිට කයිලගොඩ හන්දිය දක්වා
2. කයිලගොඩ හන්දිය සිට හිඳගොඩ දක්වා
3. හිඳගොඩ සිට කණුපැලැල්ල දක්වා
4. දුම්රියපොල සිට දෙයියන්නෙවෙල පාර හරහා සායන පාර දක්වා
5. මැදිරිය පාර සිට පිලිපොතගම පාර දක්වා
6. මැදිරිය මාර්ගයේ සිට හුනුකොටුව මාර්ගය දක්වා කොටස

**සිතියම අංක 6.15 : යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය**




### vi. කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම්

බදුල්ල, කලාපයේ කේන්ද්‍රිත පොදු ප්‍රවාහන සැපයුම්කරු ලෙස සේවා සපයනු ලැබේ. පොදු බස් ප්‍රවාහනයත්, දුම්රිය ප්‍රවාහනයත් යන දෙකෙන්ම නගරය අනෙකුත් නගර සමග සම්බන්ධ වී ඇත. ඒ අනුව දිනකට නගරයට පැමිණෙන පොදු ප්‍රවාහනය කාර්යක්ෂම ආකාරයට නගරය තුළටත්, පිටතටත් පැවතීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව දැනට පවත්නා පොදු බස් රථ නැවතුම් පොළෙහි බස් රථ තදබදය අවම කිරීම සඳහා එය පුළුල් කිරීමට යෝජිත ය. මේ සඳහා දැනට පවත්නා පැරණි නගර සභා පොදු වෙළඳ සැළ පිහිටි ඉඩම ද යොදා ගෙන බස් නැවතුම් පොළ ව්‍යාප්ත කිරීමට යෝජිත වේ.

මෙහිදී දැනට ඉඩම තුළ පවත්නා වාණිජ ආයතන යෝජිත බස් නැවතුම් පළ තුළ වාණිජ සංකීර්ණයක් ලෙස ස්ථානගත කිරීමට යෝජිතය.

**සිතියම අංක 6.16 : යෝජිත බස් නැවතුම් පොළ පුළුල් කිරීමේ ව්‍යාපෘතිය**




vii. **පටුමං සංවර්ධනය**

නගරයේ වාහන සඳහා පවත්නා මාර්ග ජාලය එකිනෙකට සම්බන්ධ වී ප්‍රශස්ත මට්ටමක පැවතුණද පදික පහසුව සඳහා පටුමං ඇතිකිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව පහත හඳුනාගත් පටුමං පදිකයන්ගේ පහසුව ඇති කරවන ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

1. කණුපැලැල්ල පාලම සිට පහළ රජ වීදිය දක්වා
2. රජ වීදියේ සිට සායන පාර දක්වා
3. පහළ විදියේ සිට අලිකුඹුර හරහා රිවර් සයිඩ් මාර්ගය දක්වා
4. මැදිරිය පාර සිට හුණුකොටුව පාර දක්වා

සිතියම අංක 6.17 : යෝජිත පටුමං සංවර්ධනය




### viii. වාහන නැවතුම් ස්ථාන ඇතිකිරීම

නගරයේ වාහන තදබදය, මාර්ගය දෙපස වාහන නවතා තැබීම හා පදික පහසුව ඇතිකිරීම සඳහා වාහන නැවතුම් ස්ථාන අවශ්‍ය වී ඇත. ඒ අනුව ඒ ඒ ආයතනයන්හි සේවා හා වාණිජ සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවගෙ වාහන සඳහා පහත හඳුනාගත් ස්ථාන්හි වාහන නැවතුම් ස්ථාන ඇතිකිරීමට අපේක්ෂිතය.

1. බදුල්ල මහ රෝහල පිටුපස ඉඩම තුල
2. රේස්කෝස් මාර්ගයේ දකුණු පස බිම් තීරය
3. වර්තමාන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ භූමියට යාබද කොටස
4. අලිකුඹුර ඉඩම ආශ්‍රිතව
5. දුම්රිය නැවතුම්පොල ඉදිරිපස

**සිතියම අංක 6.18 : යෝජිත වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය**




### viii. පදික මාර්ග සංවර්ධනය

නගරයේ එකිනෙකට සම්බන්ධ වූ මාර්ග ජාලය ප්‍රවාහනය උදෙසා හිතකර වුවද පදිකයන්ගේ ගමනාගමනයට පහසුකම් සැලසී ඇත්තේ අවම ප්‍රමාණයකිනි. ඒ අනුව නගරය තුළ හඳුනාගත් පහත තීරයන් දෙපස පදික මං තීරු ඇති කිරීමට යෝජිතය.

1. වර්තමාන බදුල්ල බන්ධනාගාරය සිට රිවර් සයිඩ් මාර්ගය හරහා කොස්ගස් හන්දිය දක්වා කොටස
2. පිං අරාව හන්දිය සිට බදුල්ල මහ විද්‍යාලය දක්වා කොටස
3. කණුපැලැල්ල සිට දුම්රිය ස්ථානය දෙයියන්නෙවෙල මාර්ගය හරහා රජ වීදිය දක්වා දක්වා කොටස
4. තානායම් හන්දිය සිට රජ වීදිය හරහා තැපැල්හල මාර්ගය සිට රෙස්කොස් මාර්ගය දක්වා

**සිතියම අංක 6.19 : යෝජිත පදික මාර්ග සංවර්ධනය**




ix. **වීථී නියාමනය (Streetscape Guidelines)**

බදුල්ල නගරයේ ප්‍රධාන වාණිජ ප්‍රදේශය වන පහළ වීදිය, මීටර 630ක දිගින් යුක්තය. මාර්ගය තනි අතට වාහන ගමනාගමනය සිදු කළද නගරයේ වාහන තදබදය ඉහළ වීදියක් ලෙස හඳුනාගත හැකිය. තොග බඩු ප්‍රවාහනය කරන වාහන පාරේ නවතා බඩු පැටවීම හා බැස්සීමත්, පදිකයන් සඳහා ගමන් පහසුකම් නොතිබීමත් මෙයට හේතු වෙයි.

වර්තමාන පහළ වීදියහි පළල මීටර 10කි. ඒ අනුව ගොඩනැගිලි සීමාව මීටර 5ක් ලෙස සීමා කොට,වීදියට මුහුණලා ඇති සියළු ගොඩනැගිලිවල පහළ මාලයෙහි පමණක් ගොඩනැගිලි සීමාව මීටර 7ක් දක්වා සීමා කිරීමට යොජිතය. එලෙස මාර්ගයේ වෙන් වන කොටස පදික වේදිකා ලෙස පමණක් භාවිතයේ යෙදවීමට යොජිතය. එසේ මාර්ගයෙන් වෙන් වන කොටස රූපය අංක 2ලෙස වේ.

*රූපය අංක 6.2: පහළ වීදිය යෝජිත වීථි නියාමනය*




x. **නගර මධ්‍යය සඳහා සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය(LRT)**

මීට අමතරව භූගෝලීය විෂමතාවය, ඉඩම් හිමිකම් යන හේතූන් මත නගරය පුරා ආයතනික සේවා පැතිර පැවතීම නිසා සේවා ලබාගැනීමට පැමිණෙන පිරිස් සඳහා නගරය වටා දිවෙන පොදු ප්‍රවාහන පහසුකමක අවශ්‍යතාවය ද පවතී. ඒ තුළින් නගරය තුළද කාර්‍යක්ෂම ප්‍රවාහනයක් පැවතීම අපේක්ෂිත ය. මේ සඳහා පිටත වටරවුම් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා යෝජිතය.

බදුල්ල නගරයට ආවේණික වී ඇති නගරය මධ්‍යය වූ තැනිතලාව හූ විෂමතාවය පදනම් කරගෙන මෙම පද්ධතිය යෝජිතය. එහිදි නගර මධ්‍යයේ පවත්නා භූමියේ මුහුදු මට්ටමේ සිට මීටර් 600ක් 655 ක් අතර වූ සම උස් තැන් යා කරමින් මෙම පද්ධතිය ක්‍රියාත්මක කළ හැකයි. එහිදි නගරයේ සංවර්ධන ලක්‍ෂ හා සේවා සැපයුම් ස්ථාන යා කරමින් මෙය ක්‍රියාත්මක කළ යුතුය. යෝජිත සැහැල්ලු දුම්රිය ප්‍රවාහන තීර 2 කි.

i. කයිලගොඩ සිට වෙලේකඩේ - විහාරගොඩ දක්වා - කි.මී 1.5
ii. විහාරගොඩ - කොස්ගස් හන්දිය - හංවැල්ල පාර බදුලුපිටිය - කයිලගොඩ -පුවක්ගොඩමුල්ල සිට තානායම් හන්දිය දක්වා - කි.මී 5.5

**සිතියම අංක 6.20 : යෝජිත සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය**



### 6.3.3 යෝජිත ජල සැපයුම් සැලැස්ම

බදුල්ල මහ නගර සීමාවේ 2030 ඇස්තමේන්තුගත නේවාසික ජනගහනය හා සංක්‍රමණික ජනගහනයට සාපේක්ෂව ජල සැපයුම සඳහා සැලසුම් යෝජිත වේ.එහිදී දැනට බදුළු ඔය ආශ්‍රය කරගෙන සිදුවන ජල සැපයුමෙහි ඝණ මීටර් 278 ක හිඟයක් පවතී.

එසේම 2030 අපේක්ෂිත ජනගහනය සඳහා අවශ්‍ය දෛනික ජල ඉල්ලුම 10,292 ක් ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව දැන්ට පවතින ජල හිඟයත්, 2030 වන විට ඇතිවන ජල ඉල්ලුමටත් සරිලන ලෙස ජල ඉල්ලුම සපුරාලිය යුතුය.

**සිතියම අංක 6.21 : යෝජිත බදුල්ල- හාලිඇල- ඇල්ල ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය- බෙදාහැරීමේ ප්‍රදේශ**




මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, බදුල්ල

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2018 වසරේ ආරම්භ කරන ලද බදුල්ල, හාලි ඇල - ඇල්ල ඒකාබද්ධ ජල ව්‍යාපෘතිය වසර 2035 දක්වා ජනගහනය ඇස්තමේන්තු ගත කර

සිදු කරන ලද ජල ව්‍යාපෘතියකි. ඒ අනුව, හාලි ඇල සිට බදුල්ල මහ නගර සභා සීමා ප්‍රදේශය ඇතුලත් කොටසකට ඝණ මීටර් 8,500 උපරිම ජල සැපයුමක් සිදු කිරීමට නියමිතය. මේ නිසා පවත්නා ජල අර්බුදයට විසඳුමක් මේ වන විට සැලසුම් වී ඇත.

ඒ අනුව, බදුල්ල මහ නගර සීමාව සඳහා 2030 දක්වා සැලැස්ම තුල නේවාසික හා සංක්‍රමණික ජනගහනයට අවශ්‍ය වන ආකාරයට බදුළු ඔය ආශ්‍රය කොට ගෙන පවත්නා ජල මූලාශ්‍රයත්, හාලි ඇල-ඇල්ල, බදුල්ල ජල ව්‍යාපෘතියත් එක්ව ජල සම්පාදනය කිරීමට යෝජිතය. නමුත් දැනට ජල මාර්ග පවත්නා භූමි තීරයන් සේවා තීරයක් ලෙස නම් කර වෙන් කිරීමට යෝජිතය. එලෙස සේවා තීර ලෙස

i. පිං අරාව තානායම් හන්දිය-බැංකු පාර-විහාරගොඩ-හිඳගොඩ දක්වා
ii. පහළ විදිය - වර්තමාන බන්ධනාගාරය ඉදිරිපස සිට විහාරගොඩ දක්වා
iii. තානායම් හන්දිය - බන්ධනාගාරය - රේස්කෝස් පාර - රිවර්සයිඩ් පාර - කොස්ගස් හන්දිය
iv. තැපැල්හල පාර සිට රේස්කෝස් මාර්ගය දක්වා
v. විහාරගොඩ සිට කණුපැලැල්ල දක්වා

## 6.3.4 යෝජිතවිදුලිසහදත්තරැහැන්සැලස්ම

### 6.3.4.1 විදුලි සැපයුම

පවත්නා විදුලි සැපයුම ඒ ආකාරයෙන්ම පවත්වා ගැනීමටත් 2030 වන විට අපේක්ෂිත ජනගහනයට සාපේක්ෂව විදුලි සැපයුම ලබා දීමටත් යෝජිතය.

මෙහිදී පානීය ජල නල එලා ඇති තීරයේම කොටසක් භාවිතා කර භූගත විදුලි සැපයුම් රැහැන් සැකසීමට යෝජිතය. ඒ සඳහා 7.3.3 හි සඳහන් කළ මාර්ග තීරයන්ගේ පදික වේදිකාවන්ට අමතරව පවත්නා බිම් තීරයක් යොදාගත යුතුය.

### 6.3.4.2 සන්නිවේදන පහසුකම්

බදුල්ල මහ නගර සීමාවේ රජයේ හා පෞද්ගලික ආයතන, සෞඛ්‍ය සේවා අංශ හා අනෙකුත් වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන ආයතන සියළු ස්ථාන සඳහා දැනට සන්නිවේදන පහසුකම් ඇත.

**සිතියම අංක 6.22 : යෝජිත භූගත සේවා තීර**




බදුල්ල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ඩයලොග් ආදී සැපයුම්කරුවන් විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා ලෙස බ්‍රෝඩ් බෑන්ඩ්, ජාල යටිතල පහසුකම් ස්වා සපයා ඇත. නමුත් නගරයේ පවත්නා විෂම රූපී භූගෝලීය රටාව මත නගරයේ සියළු ස්ථාන වලට ඒකාකාරීව සන්නිවේදන පහසුකම් ලබාදීමට හැකියාවක් නොමැත.ඒ අනුව එසේ සන්නිවේදන පහසුකම්දැනට නොපවත්නා පිං අරාව වැනි ප්‍රදේශ වලට නව ක්‍රමවේදයන් ඔස්සේ සන්නිවේදන පහසුකම් ලබාදීමට යෝජිතය.

මීට අමතරව සේවා තීර ලෙස නම් කර ඇති පහත මාර්ගයන් ආශ්‍රිතව පවත්නා සන්නිවේදන රැහැන් භූගත රැහැන් ලෙස නැවත සකස් කිරීමට යෝජිතය.එහිදී විදුලි රැහැන්, ජල නල, අප ජලය හා සන්නිවේදන රැහැන් සඳහා භූගත සේවා මාර්ගයක් ඇති කිරීම සිදු වේ.නගරය පුරා විසිර පවතින පානීය ජලනල මාර්ග, සන්නිවේදන රැහැන් හා විදුලි රැහැන් සඳහා වන අළුත්වැඩිය කටයුතු වලදී නිරන්තරයෙන් මාර්ග වල වාහන තදබදයක් හා පදික වේදිකා අවහිර වීමත් සිදු වේ. ඒ අනුව පවත්නා පානීය ජල නල, විදුලි රැහැන්, සන්නිවේදන රැහැන් හා යොජිත අප ජල නල සඳහා 7.3.3 හි සඳහන් කළ මාර්ග තිරයන්ගේ වෙන්වූ තීරයක් ඇති කිරීමට යෝජිතය.

### 6.3.5 යෝජිතඅපද්‍රව්‍ය හා මලාපවාහන සැලසුම

බදුල්ල නගරයේ නේවාසික ප්‍රජාවටත් සංක්‍රමණික ප්‍රජාවටත් පහසුකම් සලසන්නාවූ අපද්‍රව්‍ය හා මලාපවාහන සැලැස්මක් මේ වන විට නොමැත.නගරයේ වැසි ජලය ගලා යෑම සඳහා ස්වභාවික කදුරුවලට අමතරව කෘත්‍රිමව සාදන ලද ඇල මාර්ග කිහිපයකි. එසේම වාරි ඇල හා පිට ඇල යන

දෙවර්ගයම නගරය තුල ඒකාබද්ධව පැවතීම කුඹුරු ඉඩම්වලට ජලය යොදාගැනීමේදී ගැටළුකාරි තත්ත්වයක් ද උද්ගතව ඇත. ඒ නගරයට අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොපවත්නා බැවින් බොහෝ වාණිජ හා නේවාසික භාවිතයන්ගේ අප ජලය ඇල මාර්ග වලට මුදා හැරීම නිසාවෙනි.

නමුත් නගරයේ කුඹුරු ඉඩම්හි පවත්නා ආර්ථික ඵලදායිතාව අඩුවීම මත නමුත් කුඹුරු ඉඩම් ජල රඳවන ස්ථාන ලෙස තවදුරටත් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය බැවින් නගරයට අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් යෝජිත වේ.

මේ සඳහා ප්‍රධාන වශයෙන් බදුල්ල මහ රෝහල, රාජ්‍ය පෞද්ගලික ආයතන, නේවාසික කලාප හා වාණිජ ස්ථාන සංකේන්ද්‍රනය වූ නගර මධ්‍යය සඳහා අප ජලය බැහැර කිරීමේ ක්‍රමවේදයක් ඇතිවිය යුතුය. නගරයේ භූ විෂමතාවය අනුව බැස්ම පිහිටා තිබීම මත අපජලය එකතු කර, පිරිපහදු කිරීමෙන් පසුව නිකුත් වනජලය බදුළු ඔයට එක් කිරීමට යෝජිත වේ. 2030 අනාගත දැක්මට අනුව අපේක්ෂිත ජනගහනයට සාපේක්ෂව 2,233,880 ක මල අපද්‍රව්‍ය නගරයේ දෛනිකව ඒකරාශී වන බව පුරෝකථනය කර ඇත. ඒ අනුව මෙම ගැටලුවට විසඳුමක් ලෙස නගරයට අපද්‍රව්‍ය හා මලාපවාහන පද්ධතියක් යෝජිතය. මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් යෝජිත අපද්‍රව්‍ය හා මලාපවහන සැලසුම මේ යටතේ ක්‍රියාත්මක විය යුතුය.

**සිතියම අංක 6.23 : යෝජිත අපද්‍රව්‍ය හා මලාපවාහන සැලසුම**




මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය , බදුල්ල

### 6.3.6 යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

බදුල්ල කලාපයේ සේවා සැපයීමේ ප්‍රමුඛයා බවට පත් කරලීමේ දැක්මට අනුව යටිතල පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය වේ. එහිදි මේ වන විට බදුල්ල නගරයේ ඇති විශාලතම ගැටලුවක් ලෙස ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය හැදින්විය හැකිය.

වර්තමානය වන විට දෛනිකව එකතුවන බදුල්ල මහ නගර සභා සීමාව තුල ටොන් 20 ක පමණ ප්‍රමාණයක් කසල ඒකරාශි වෙයි. ඒ සඳහා අක්කර 5 ක වපසරියක පැතිරුණු අංගනයක් ඇති අතර

එහි නිසි කළමනාකාරිත්වයක් නොමැත. මේ හේතුව මත දැනට කසල අංගනයේ ඝන හා ද්‍රව අපද්‍රව්‍ය බදුලු ඔයට එකතු වීමේ තත්වයක්ද පවතී.

දැනට ඒකරාශි වන කසල ප්‍රමාණයට සාපේක්ෂව 2030 වන විට බදුල්ල මහ නගර සීමාවේ එය ටොන් 22 දක්වා වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පවතී. ඒ අනුව බදුල්ල නගර සංවර්ධන සැලැස්ම තුළින් 2020 කසල කළමනාකරණයට අදාල උපාය මාර්ගික ව්‍යාපෘතින් සිදු කිරිමට යෝජිතය. එලෙස හඳුනාගත් උපාය මාර්ගික ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

බදුල්ල නගර සීමාව තුල විශාල ගැටළුවක්ව පවතින කසල සඳහා 2018-2030 නගර සංවර්ධන සැලැස්ම තුලින් පහත යෝජනා ඉදිරිපත් කෙරේ.

(1) දිරාපත්වූ කුණු එකතු කර කාබනික පොහොර නිශ්පාදන ක්‍රියාවලියට යොමු කිරීම

දිරාපත් වූ කසළ බැහැර කිරීම සඳහා කාබනික පොහොර නිශ්පාදනයට යෝජිත ය. ඒ අනුව පවත්නා කසළ අංගනය තුළම දිරාපත් වන කසළ කළමණාකරණ ව්‍යාපෘතියක් යොජිතය.

(2) දිරාපත් නොවන කසල පවත්නා කසල අංගනය තුල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට යොදා ගැනීම

පවත්නා කසළ අංගනය තුල දිරාපත් නොවන කසළ සඳහා අඛන්ඩ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියක් අපේක්ෂිතය. මේ සඳහා පවත්නා කසළ අංගනයෙන් පර්චස් 20ක ප්‍රමාණයක් පමණක් යොදා ගත යුතු වේ.

(3) මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරන රසායනික ද්‍රව්‍ය හෂ්මකයක් (incinerator) ස්ථාපිත කිරීම

බදුල්ල නගර සැලැස්මෙහි දැක්මට අනුව 2030 වන විට නගරයේ සෞඛ්‍ය කටයුතු ආශ්‍රිතව සුවිශේෂී වර්ධනයක් අපේක්ෂිතය. ඒ අනුව එම සෞඛ්‍ය සේවාවන්හි සැලකිය යුතු ප්‍රමාණයක් පෞද්ගලික ආයෝජකයන් වන අතර එහිදී ඒ ඒ සෞඛ්‍ය සේවා සැපයුම්කරුවන්ගේ රසායනික ද්‍රව්‍ය තැවරුණු කසල නියමිත ආකාරයට බැහැර කිරීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන හෂ්මකයක් (incinerator) ඇති කිරීමට යෝජිතය.

(4) සෞඛ්‍ය සේවා ආශ්‍රිත සංවර්ධන කටයුත්තකදී හා වර්ග මීටර් 500 ට වැඩි වන සෑම සංවර්ධන කටයුත්තකදීම කසල කළමනාකරණ රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

යෝජිත 2030 දැක්මට අනුව සෞඛ්‍ය සේවා අංශයේ අපේක්ෂිත සංවර්ධනයට අනුව යමින් මෙම උපායමාර්ගික ත්‍රියාවලිය යෝජිතය. ඒ අනුව බදුල්ල මහ නගර සභාවෙන් කසළ බැහැර කිරීමේ ක්‍රමවේදය සඳහා අවසර ලබාදීමේ අංශයක් ස්ථාපිත කළ යුතුය. නගරයේ පවත්නා හා යෝජිත පෞද්ගලික සෞඛ්‍ය සැපයුම්කරුවන් හා ව.මී. 400 වැඩි

ගොඩනැගිලි සඳහා කසළ බැහැර කිරීමේ අවසර පත්‍රයක් අදාල කසළ බැහැර කිරීමට අවසර ලබාදීමේ අංශයෙන් ලබාගත යුතුය. එසේ නැතිනම් කසළ බැහැර කිරීමේ පිළිවෙත සම්බන්ධව විස්තරාත්මක විග්‍රහයක් ලබාදිය යුතුය.

(5) අඛන්ඩව හා නියමාකාරයෙන් ක්‍රියාත්මක වන කසළ කළමනාකරණයක් ඇති කිරීම එසේම දිරාපත් වන කි.ග්‍රෑ. 50 ට වැඩි කසළ ලබාදෙන ස්ථානයක් හඳුනාගෙන එම ස්ථානයන්ට ඒ ඒ අදාල ස්ථාන වරිපනම් ලෙස ගෙවන අගයෙන් 10% ක් අය කරනු ලබයි. එසේම කි.ග්‍රෑ. 100 ට වැඩි කසළ නිකුත් කරන ස්ථානයන් සඳහා කසළ කළමනාකරණ ඒකක අදාල ස්ථානයේම කොටසක පවත්වා ගැනීමටත් නිර්දේශ කළ යුතුය.

## 6.4 ආර්ථික සංවර්ධන උපායමාර්ග

### 6.4.1 යෝජිත ආර්ථික සැලැස්ම

බදුල්ල 2030 අපේක්ෂිත දැක්මට අනුව පරිපාලන හා සුව සේවා නගරය බවට පත් කිරිමට උදෙසා ශක්තිමත් සේවා ආශ්‍රිත වාණිජ සංවර්නයක් කළ යුතුව ඇත. ඒ අනුව කලාපයේ පරිපාලන හා සෞඛ්‍ය සේවා කෙන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිංඅරාව හන්දිය සිට බදුළුපිටිය දක්වාත්, තානායම් හන්දිය සිට සුජාතා පාර දක්වාත් වාණිජ හා ආයතනික මිශ්‍ර තීරයන් දෙකක් ප්‍රවර්ධනය කිරිමට පරමාර්ථ සකසා ඇත.

බදුල්ල පරිපාලන නගරයක් ලෙස ක්‍රියාකාරි වුවද නගරයටම සුවිශේෂි වූ ආර්ථික රටාවකට හිමිකම් කියයි. මෙහිදී ආයතනික කාර්ායයන් හා බදුල්ල මහ රොහලහි සේවා කේන්ද්‍රකොට ගත් වාණිජ ස්ථාන රැසකි. මීට අමතරව නේවාසික හා සංක්‍රමණික ප්‍රජාවට අවශ්‍ය දෛණික උවමනාවන් සපුරාලීමට සමත් ආර්ථික ව්‍යුහයකින් සමන්විත ය. එහිදී නගරය තුළ සිවින හා නගරය වටා පිහිටි තේ වතු ප්‍රජාවගෙන් සැලකිය යුතු පිරිසක් මෙම වාණිජ ක්ෂේත්‍රය හා බැදුණු රැකියාවල නියුතුවූවෝ වෙති. පස්සර , මීගහකිවුල වැනි ප්‍රදේශවල සිටද නගරයෙන් වාණිජ සේවා ලබා ගැනීමට පැමිණෙන පිරිස ඉහළ මට්ටමක සිටී. ඒ අනුව නගරයේ පදිංචි නේවාසික ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමත්, නගරයට පිටතින් සංක්‍රමනිකයන් ලෙස පැමිණෙන ප්‍රජාව, නගරය හරහා වෙනත් ප්‍රදේශවලට ගමන් කරන ප්‍රජාවට වාණිජ පහසුකම් ලබාදීමටත් ශක්තිමත් ආර්ථික ව්‍යුහයක් සෑදීම උදෙසා ආර්ථික සංවර්ධන උපායමාර්ග සකසා ඇත.

**i.** සේවා ආශ්‍රිත වාණිජ සංවර්ධන උපාය මාර්ග

නගරයේ ප්‍රධාන විභවතාවය ලෙස පවත්නා සේවා සැපයුම් ස්ථාන ආශ්‍රිතව වාණිජමය ආර්ථිකයක් ප්‍රවර්ධනයට මෙමගින් ඉඩ සැලසෙනු ඇත. එහිදී සේවා ස්ථානවල සේවය කරන පිරිසටත් , නගරයේ සංක්‍රමණිකයන්ට ආර්ථික පහසුකම් ලබාදීම සඳහා වාණිජ ස්ථාන ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය පවතී. ඒ තුලින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම අපේක්ෂිතය.

1. සෞඛ්‍ය සේවා ආශ්‍රිත වාණිජ ස්ථාන ප්‍රවර්ධනය

බදුල්ල මහ නගර සීමාවේ ආර්ථිකයේ කැපී පෙනෙන, සුවිශේෂිතම අංගයක් වනුයේ බදුල්ල මහ රෝහල ආශ්‍රය කොටගෙන පවත්නා පෞද්ගලික රෝහල්, වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන හා රසායනාගාර සේවයයි. එහිදී 2030 දැක්මට අනුකුලව යමින් සෞඛ්‍ය සේවා අංශය හා සබැඳුනු වාණිජ පහසුකම් හා සේවා පහසුකම් ප්‍රවර්ධනයට කලාපීකරණ සැලැස්ම (7.2.2) හරහා සුවිශේෂී රෙගුලාසි එක් කර ඇත.

මේ යටතේ සෞඛ්‍ය කලාපයේ සීමිත ඉඩකඩ තුළ ඇති ඉඩම්වලින් උපරිම ප්‍රයෝජනයට ගත හැකි ආකාරයෙන් ගෙබිම් අනුපාතය වැඩි කර ඇත. එසේම එහි පවත්නා කුඹුරු ඉඩම්වලින් 50%ක උපරිම බිම් අනුපාතයකට ඉදි කිරීම් සිදු කිරීමට හැකියාව ඇත.

2. විවේකි හා විනොදාස්ථාන ආශ්‍රිත සකසුරුවම් වාණිජ සේවා ඇති කිරීම

බදුල්ල නගරයට දෛනිකව සංක්‍රමණය වන ප්‍රජාව සැලකීමේදී සියලු සමාජ තලයන්ට අයත් සෑම වයස් කාණ්ඩයකම පිරිස සංසරණය වේ. ඒ අනුව මැදිරය පාර සිට හුණුකොටුව මාර්ගය අක්වා කොටසෙහි, අලිකුඹුර නාගරික තෙත්බිම් උද්‍යානය තුළ, බදුළුපිටිය සිට මහියංගන මාර්ගය දක්වා වූ ඇවිදින මං තීරුව ආශ්‍රිතව සකසුරුවම් වාණිජ මධ්‍යස්ථාන ඇති කිරීමට අපේක්ෂිත ය.

**සිතියම අංක 6.24 : සේවා ආශ්‍රිත වාණිජ සංවර්ධනය**




**ii.** ප්‍රාදේශීය ආර්ථික ප්‍රශස්තිකරණ උපායමාර්ග

නගරය තුල සිටින ව්‍යාපාරික ප්‍රජාව තවදුරටත් ආර්ථිකමය ශක්තිමත් කිරීම සඳහා පවත්නා විභවතාවයන් උපරිම ඵලදායිතාවයකට පත් කිරීම මේ තුලින් අපේක්ෂිතය.

- පහළ වීදිය ආශ්‍රිත ව ප්‍රධාන වාණිජ කලාපය ඇති කිරීම

බදුල්ල නගරයේ වාණිජ කටයුතු පහළ වීදිය දෙසට ඒක රාශි වී ඇති අතර ඉඩම් කට්ටි වීම නිසා අපේක්ෂිත ඉදි කිරීම් සඳහා ප්‍රමාණවත් වූ අවම බිම් ප්‍රමාණයන් ද නොමැත. ඒ අනුව දැනට මෙම

වාණිජ තීරයේ අනවසර, අවිධිමත් ඉදිකිරීම් බහුලව දක්නට ලැබේ. මෙම තත්ත්ව තුළින් පහළ වීදිය,මාවතට මුහුණලා ඇති ඉඩම් වල භාවිතය නොසලකා තට්ටු 5ක් දක්වා උපරිම උසකට ඉදිකිරීම් සිදුකළ හැකිය. ඒ තුළින් නගර මධ්‍යය ඉඩම්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට අපේක්ෂිත ය.

මීට අමතරව පහළ වීදිය ආශ්‍රිතව ඇති වාණිජ භාවිතයන්ට නොගැලපෙන භාවිතයන් ඉවත් කර ඒ වෙනුවට වාණිජ වටිනාකමින් යුක්ත භාවිතයන් යොජිතය. ඒ අනුව වත්මන් බදුල්ල බන්ධනාගාරය ස්ප්‍රිංවැලි පාර එඩ්මන් බංගලාව සහිත ඉඩමට ප්‍රත්ශ්ඨාපනයටත්, බදුල්ල සරස්වතී ප්‍රාථමික විද්‍යාලය එහි කණිෂ්ඨ විද්‍යාලය පවත්නා භූමියේම ප්‍රතිෂ්ඨාපනයටත් යෝජිත ය.(සිතියම අංක 2.22)

- ඌණ සංවර්ධිත ඉඩම් ආයොජන අවස්ථා සඳහා යොමු කිරීම

මේ යටතේ නගර මධ්‍යය පවත්නා ඌණ සංවර්ධන මට්ටමේ ඇති ඉඩම් හඳුනාගන්නා ලදී. ඉඩම් මිල අධික නමුත් නිවරදි ආර්ථිකමය උපයොජනයට මෙමෙ ඉඩම් යොමුකර නොමැත.ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතනයන්ට අයත් ඉඩම්, පුරාවිද්‍යාත්මක වැදගත්කමින් යුත් එහෙත් නඩත්තුවක් නොමැති ඉඩම් මේ යටතේ බදුල්ල නගරයේ ආර්ථිකමය සංවර්ධනයට යොදාගැනීමට අපේක්ෂිත ය.

ඒ අනුව වර්තමාන තානායම් පරිශ්‍රය, බදුල්ල මහ නගර සභා පැරණි පොදු වෙළඳසැල,දකුණු පටුමඟ වෙළඳසැල් තීරය යන ස්ථාන වාණිජ ආර්ථිකමය වාසි ලබා ගත හැකි ආකාරයට උපයොජනයට යෝජිතය.

- ඌණ සංවර්ධනයට ලක්ව ඇති පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි සංචාරක ප්‍රවර්ධනය සඳහා යොමු කිරීම.

නගර මධ්‍යය පවත්නා පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන සංරක්ෂනය කරමින් ආර්ථිකමය ඵලදායී උපයෝජනයට යොමු කිරීමට යෝජිතය. ඒ අනුව වෙලේ කඩේ පැරණි බලකොටුව, සළුසල ගොඩනැගිල්ල, තල්දෙන වලව්ව, කොතලාවල වලව්ව යන ස්ථාන පොදු මහජන ප්‍රවේශය සහිත වාණිජ ආර්ථික කටයුතුවලට යොමු කිරීමට යොජිතය. මෙම සංර්ධන කටයුතු නගරය හරහා ගමන් කරන සංචාරකයන් ඉලක්ක කරගෙන වන ආයෝජන අවස්ථා ලෙස සංවර්ධනය වනු ඇත.

සිතියම අංක 6.25 : ප්‍රාදේශීය ආර්ථික ප්‍රශස්තිකරණය



## 6.5 පාරිසරික තිරසාර උපායමාර්ග

2030 ජාතික භෞතික සැලසුම හා 2050 යෝජිත භෞතික සැලසුමට අනුව බදුල්ල මහ නගර සභා සීමාව පාරිසරික සංවේදී කලාපයට අයත් වේ. එසේම ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප අනුව තෙත් හා වියළි අතරමැදි දේශගුණික කලාපයට අයත් වේ.

ඉතිහාසයේ පටන්ම බදුල්ල කලාපයේ ප්‍රධාන පරිපාලන අග නගරයයි. එකල බදුළු ඔය ආශ්‍රය කොටගෙන නිර්මිත වැවකින් වර්තමාන නගර මධ්‍යය වැසී පැවතුණි. එහිදී වර්තමාන කච්චේරි පරිශ්‍රය වටා පැවතුණ භූමියේ රජ මාලිගයත් ඒ වටා වැවත් පැවතුණ බව ජනප්‍රවාදයන්හි සඳහන්ය. වර්තමානය වන විට බදුල්ල නගරය හරහා ගලා යන බදුළු ඔය, කුඩා ඔය, රඹුක්පොත ඔය වැනි ජලධරයන් පවතී. නගර සීමාවෙහි රක්ෂිත වනාන්තර ප්‍රදේශ ලෙස නගරය වටා පවතින කඳු පන්තීන්හි මුදුන් වන නඩුකාර කන්ද, අළුගොල්ල කන්ද හා එළදළුව කන්ද හැඳින්විය හැකිය. පතන භූමියක් ලෙස මැදපතන කඳු මුදුනද පවතී. මීට අමතරව ජල රඳවන ස්ථාන ලෙස පවත්නා කුඹුරු ඉඩම් පවතී. මුහුදු මට්ටමේ සිට උස මීටර 650-1000 ත් දක්වා වූ වපසරියක බදුල්ල මහ නගර සභා සීමාව පිහිටා ඇත.

බදුල්ල 2018- 2030 සංවර්ධන සැපසුමෙහි ඉලක්කගත දැක්මට අනුව සකසා ඇති අරමුණු අතරින් පාරිසරික සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීමට මෙම උපාය මාර්ග සකසා ඇත. මෙම උපායමාර්ග හරහා 2030 වන විට ගඟ රක්ෂිතය, කුඹුරු ඉඩම් සංරක්ෂණය හරහා බදුළු ඔය හා එහි ජල ධාරය ආරක්ෂා කිරීම, බෑවුම අංශක 30ට ඉහල භූමියන්හි සංවර්ධන කටයුතු සීමා කිරීම හා පහළ බෑවුම් ප්‍රදේශයන්හි පවත්නා සංවර්ධනය පාලනය කිරීම තුලින් ස්වභාවික අවදානම් කලාප ආරක්ෂා කිරීම සහ 2025 වන විට විනෝද හා විවේකී පහසුකම් අවශයතාවය 80% ක් ඇති කිරීම තුලින් නේවාසික හා සංක්‍රමණික ජනතාවගේ විවේකී පහසුකම් ප්‍රවර්ධනය කිරීම යන පරමාර්ථද සාක්ෂාත් කර ගැනීම අපේක්ෂිතය. එකී උපායමාර්ග ලෙස පාරිසරික සංරක්ෂණය, භූ දර්ශණ කළමණාකරණය, ස්වාභාවික විපත් අවම කිරීමේ උපායමාර්ගය හා පොදු විනෝද කටයුතු සැලැසුම් යෝජිතය.

### 6.5.1 යෝජිත පාරිසරික සංරක්ෂණය

සංරක්ෂණ ප්‍රදේශ ලෙස දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නඩුකාර කන්ද හා අළුගොල්ල කන්ද ආශ්‍රිතව පවත්නා වනාන්තර ප්‍රදේශයන්හි වන සංරක්ෂණය පවත්වාගෙන යාම අපේක්ෂිතය.

මේ යටතේ පයිනස් වගාවන් පවතිත කඳු ප්‍රදේශ නැවත දේශිය වන වගා සිදු කිරීමට මේ තුළින් යෝජිතය.

### 6.5.2 යෝජිත භූ දර්ශණ කළමනාකරණය

භූ දර්ශණ කළමනාකරණය හරහා පරිසර පද්ධතිය තිරසාර ලෙස ආරක්ෂා කර ගැනීම සිදුවන අතර මෙයට භූ ලක්ෂණ, ජෛව විවිධත්වයෙන් පිරි භූමි භාවිතයන්, දේශගුණික හා සංස්කෘතික ලක්ෂණයන් ඇතුලත් වේ.

බදුල්ල නගරය තුල භූ දර්ශණ කළමනාකරණයඇති කරලීමට ප්‍රධාන අරමුණු හා අදාල අරමුණු සාක්ෂාත් කරගන්නා උපාය මාර්ග පහත පරිදි වේ.

1. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම

   නගරයට පවත්නා සුවිශේෂිතම අංගය වන බදුළු ඔය, කුඩා ඔය හා රඹුක්පොත ඔය යන ජලධරයන් ආශ්‍රිතව ඉවුරේ සිට මීටර් 15 ක රක්ෂිත කලාපයක් ප්‍රකාශයට පත් කෙරේ. එසේම ගඟ රක්ෂිත ආශ්‍රිතව ඇවිදීමේ මං තීරු ප්‍රකාශයට පත් කර සංවර්ධනයට යෝජිතය.

   i. බදුල්ල තාක්ෂණික විද්‍යාල පිටුපස ගඟ රක්ෂිතයේ මීටර් 270 ක තීරය
   ii. ග්‍රීන් ලේන් ඩ්‍රයිව් ගඟ රක්ෂිතය මීටර් 140 ක තීරය
   iii. කණුපැලැල්ල පාලම අසල සිට කුමාරසිංහ මාවත දක්වා ගඟ රක්ෂිතය මීටර් 500 තීරය
   iv. බදුල්ල මහ නගර සීමා දකුණු පස සීමාවේ සිට කුඩා ඔයේ කි.මී 1 ක ගඟ රක්ෂිත තීරය

2. පවත්නා පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම

   i. සේනානායක උද්‍යානය
   ii. බදුල්ල උද්භිද උද්‍යානය
   iii. හරිත පුස්තකාලය තීරය
   iv. තිසර මල් ශාලාව ඉදිරිපිට හරිත තීරය

3. පදික මාර්ග දියුණු කිරීම

නගරය පුරා විසිරී පවතින සේවා ස්ථාන අතර පරතරයක් සලකා බැලූවිට කි.මී. 1.5 දක්වා වූ උපරිම පරතරයකට අඩුව පවතී. මේ අනුව සේවා ස්ථාන හා නේවාසික කලාප යා කර හඳුනාගත් පහත මාර්ගයන්හි හරිත පදික මංතීරු ඇති කිරීමට යෝජිතය.

i. වෙලේකඩේ හන්දිය සිට මහා විද්‍යාල හන්දිය දක්වා තීරය
ii. පිං අරාව සිට බදුළුපිටිය දක්වා තීරය
iii. බදුල්ල ඩිපෝව බැංකු පාර දක්වා තීරය
iv. කයිලගොඩ සිට තානායම් හන්දිය දක්වා තීරය
v. තානායම් හන්දිය සිට බැංකු පාර දක්වා තීරය
vi. විහාරගොඩ සිට දුම්රිය නැවතුම්පොල දක්වා තීරය
vii. රජ වීදිය

4. නව විවේකී හා විනෝද කලාප ඇති කිරීම තුලින් නගර අලංකරණ වැඩි දියුණු කිරීම

   i. මැදිරිය පාර මැහෝගනී වන කොටස

දැනට මැදිරිය පාර මහෝගනී වෘක්ෂ තීරය නගරයේ හුදකලාව පවතින පරිසර පද්ධතියක් ලෙස හැඳින්විය හැකිය. නමුත් මෙම පවත්නා සම්පත උපරිම ආකාරයට නගරයේ අලංකරණයට හා විවේකි ස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීම මෙයින් අපේක්ෂිත ය. ඒ අනුව යෝජිත මාර්ග සංවර්ධනයත් සමඟ මෙම වෘක්ෂ තීරය මහජන විවේකී ස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමට යෝජිත ය.

*රූපය අංක 6.3: මැහෝගනී වෘක්ෂ තීරය*




ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

*රූපය අංක 6.4 : යෝජිත මැහෝගනී වෘක්ෂ තීරයේ හරිත උයන*



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

ii. මැදිරිය පාර ගඟ රක්ෂිතයේ සිට සේනානායක උද්‍යානය දක්වා කොටස

ගඟ රක්ෂිතයේ සිට සේනානායක උද්‍යානය දක්වා කොටස මේ වන විට පටු මං තීරුවක් ලෙස පවතී. නගරයේ නේවාසික ප්‍රජාවට ව්‍යායාම මංතීරු සහිතව උද්‍යානයක් ඇති කිරීම මේ තුළින් යෝජිතය. ඒ අනුව සේනානායක උද්‍යානය සිට මැදිරිය පාර දක්වා කොටසහි කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් මේ සඳහා යෝජිතය.

*රූපය අංක 6.5 : මැදිරිය පාර සිට සේනානායක උද්‍යානය දක්වා*





ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

*රූපය අංක 6.6: යෝජිත බදුළු ඔය ආශ්‍රිත හරිත උයන*



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

iii. අලිකුඹුර යෝජිත තෙත් බිම

අලි කුඹුර, පහළ වීදිය ආශ්‍රිතව පවත්නා අත් හැර දැමූ කුඹුරු ඉඩමකි. එක් පසෙකින් බදුල්ල ප්‍රධාන වාණිජ තීරයත් අනෙක් පසින් නේවාසික භාවිතයටත් මැදිව පිහිටා ඇත. පහළ වීදිය වාණිජ ප්‍රදේශය සඳහා අවශ්‍ය වන රථ වාහන නැවතුම් ස්ථානයක්ද සහිතව මෙම භූමිය සංවර්ධනයට යෝජිතය. පහළ වීදිය ආශ්‍රිතව ඇති ස්වාභාවික ජල බැස්ම මෙම ප්‍රදේශය හරහා ඇති අතර ජල රඳවන පොකුණක් සහිතව තෙත් බිම් උද්‍යානයක් ඇති කිරීමට යෝජිතය.

***රූපය අංක 6.7 : අලිකුඹුර ඉඩම***



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

***රූපය අංක 6.8 : යෝජිත අලිකුඹුර තෙත් බිම් උද්‍යානය***



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

iv. රෝහල පිටුපස උද්‍යානය

බදුල්ල මහ රෝහල පිටුපස පවත්නා කුඹුර ඉඩම බදුල්ල මහ රෝහල අශ්‍රිත සංවර්ධනයකට යෝජිත අතර මෙම පරිශ්‍රයේම රෝගීන් හා රෝගීන් බැලීමට පැමිණෙන පිරිසට සුදුසු වන ආකාරයට විවේකී හරිත ප්‍රදේශයක් මේ තුළින් යෝජිතය.

***රූපය අංක 6.9 : බදුල්ල මහ රෝහල පිටුපස ඉඩම***



ග්‍රහණය: නා.සං.අ. ඌව පළාත් කාර්යාලය

*රූපය අංක 6.10 : යෝජිත බදුල්ල මහ රෝහල පිටුපස හරිත උයන*



මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

v. යෝජිත ගඟ ආශ්‍රිත සංවර්ධනය(ග්‍රීන් ලේන් ඩ්‍රයිව්)

බදුළු ඔය රක්ෂිතය ග්‍රීන් ලේන් ඩ්‍රයිව් මාර්ගය ආශ්‍රිතව ඔසු උයනක් සහිතව මගී විවේකී ස්ථානයක් ලෙස සංවර්ධනයට යෝජිතය.

*රූපය අංක 6.11 : .ග්‍රීන් ලේන් ඩ්‍රයිව් ගඟ රක්ෂිත ඉඩම*



*රූපය අංක 6.12 : .ග්‍රීන් ලේන් ඩ්‍රයිව් ගඟ රක්ෂිත ඉඩමේ යෝජිත ඔසු උයන*



### 6.5.3 යෝජිත ස්වභාවික ආපදා හා විපත් අවම කිරීමේ උපායමාර්ගය

බදුල්ල මහ නගර සභා සීමාව තල පහත සඳහන් ආපදාවන් හඳුනාගත හැකිය.

i. නාය යාම අවදානම
ii. ගංවතුර

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් හඳුනාගෙන ඇති ආපදා අවදානම් කලාපය සිතියම අනුව මෙම උපායමාර්ගික ක්‍රියාවන් යෝජිතය. මැදපතන, එළදළුව, අළුගොල්ල ආදි ප්‍රදේශ ආශ්‍රිතව පවත්නා නාය යාම් අවදානම හේතුවෙන් යෝජිත නගර සංවර්ධන සැලැස්ම තුළ $45^0$ ට වැඩි භූමි කලාපයන්හි ඉදිකිරීම් රෙගුගාසි මගින් සීමා කෙරේ.

නාය යාම් අවම කිරිම සඳහා ඉඩම් අනුබෙදුම් සිදු කිරීමේදී හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී පහත රෙගුලාසි අනිවාර්ය සැලකිල්ලට ගත යුතුය.

i. නාය යාම් අවදානම අවම වුවත් අංශක 20ට වැඩි බෑවුම් සියළු ප්‍රදේශ සඳහා ආපදා අවමට කිරීමේ උපාය මාර්ග හා ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නියමයන් මත සැලසුම් කාර්යයන් අනුමත විය යුතුය.
ii. සමෝච්ඡ රේඛා සැලකිල්ලට ගනිමින් කඳු බෑවුම්වල ගොඩනැගිලි ඉදිකිරීම් සිදු කිරීම.
iii. සංරක්ෂිත ප්‍රදේශයට අයත් නොවන බෑවුම් ප්‍රදේශයන්හි හූ දර්ශණයට හානි නොවන හෝ හානි අවමහ වන පරිදි පවත්නා හා යෝජිත සංවර්ධිත කටයුතු පවත්වාගෙන හා සිදුකිරීම

බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ අංශයට අනුව ගංවතුර ආපදා සහිත ස්ථානවල සිදුකරන ඉදිකිරිම් කටයුතු පාලනය කිරීම සඳහා ගඟ රක්ෂිතය ඇති කරනු ලැබේ. ඒ අනුව ගං ඉවුරේ සිට මීටර් 15 ක සීමාව තුල කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර දෙනු නොලැබේ.

ගං වතුර තත්ත්වයන් අවම කිරීම සඳහා පහත රෙගුලාසි අනිවාර්ය සැලකිල්ලට ගත යුතුය.

i. නගර සීමාවේ සියළු භූමියන්හි සංවර්ධන කාර්යයන් සිදු කිරීමේදී ජල බැස්ම සිදු කරන ආකාරය සැලසුමෙහි නිශ්චිතව පෙන්නුම් කර තිබිය යුතුය.
ii. කුඹුරු ඉඩම් ගොඩ ඉඩම් ලෙස වෙනත් භාවිතයකට හැරවීමේදී ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනිවාර්යය වේ.
iii. කලාපිකරණ සැලැස්මෙහි කලාප අංක 6 ට අයත්වන කිසිදු කුඹුරු ඉඩමක් ගොඩ ඉඩමක් ලෙස හැරවීමට අවසර නොදිය යුතුය.
iv. කලාප අංක 6 ට අයත් නොවන එහෙත් කුඹුරු ඉඩම් නාම ලේඛනයට අයත් වන ඉඩමක් ගොඩ ඉඩමක් ලෙස වෙනත් භාවිතයකට හැරවීමේදී, ඉඩමේ වර්තමාන ජල බැස්ම හා යෝජිත ජල බැස්ම පෙන්නුම් කළ යුතුය.
v. නගරය තුල පවත්නා පිට ඇලවල් හා වාරි ඇලවල් ආශ්‍රිතව සිදු කරන සංවර්ධන කටයුතු වලදී ඇල රක්ෂිත පවත්වාගෙන යාම.

මීට අමතරව නගරය තුල පවත්නා පිට ඇල හා වාරි ඇලවල් සංවර්ධන හා නඩත්තු කටයුතු අඛන්ඩව පවත්වාගත යුතුය.

### 6.5.4 යෝජිත පොදු විනෝද පහසුකම් සැලසුම

හෙක්ටයාර 1030 කින් සමන්විත බදුල්ල මහ නගර සභා සීමාව තුලට පරිපාලන හා සෞඛ්‍ය සේවා පදනම් කොටගෙන වර්තමානයේ පැමිණෙන 100000 ක පමණ සංක්‍රමණික ජනගහනයත්, 2030 අපේක්ෂිත 20% පමණ වර්ධිත සංක්‍රමණික ප්‍රජාවත් සැලකිල්ලට ගෙන විවේකී පහසුකම් හා නේවාසික ජනගහනයට පොදු විනෝද පහසුකම් සහිතව සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ඇති කිරීම මෙම සැලසුමෙහි අරමුණෙනි.

ඒ අනුව, පහත සඳහන් වර්ගීකරණයකට අනුකූලව බදුල්ල මහ නගර සීමාව තුල පොදු විනෝද පහසුකම් ඇති කරලීමට අපේක්ෂිතය.




#### 6.5.4.1 යෝජිත පොදු එළිමහන් සැලැස්ම

බදුල්ල මහ නගර සභීමාව තුල වර්තමානයේ පවත්නා ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත එළිමහන් කලාපයන්හි වර්ග ප්‍රමාණය වගුව අංක 2.20 අනුව වේ.

*වගුව අංක 6.2 : **පවත්නා ස්වභාවික හා මිනිසා විසින් නිර්මිත එළිමහන් කලාපයන්හි වර්ග ප්‍රමාණය***

| | විවෘත ප්‍රදේශය | වර්ග ප්‍රමාණය (හෙක්) | ස්වභාවය |
|---|---|---|---|
| 1 | සේනානායක උද්‍යානය | 0.8 | |
| 2 | බදුල්ල උද්භිද උද්‍යානය | 2 | |
| 3 | වීල්ස් පාර්ක් පිට්ටනිය | 0.38 | |
| 4 | කම්මානන්කඩ පිට්ටනිය | 0.2 | |
| 5 | මැහෝගනී වෘක්ෂ තීරය | 0.7 | |
| 6 | කටුපැලැල්ලගම ක්‍රීඩාපිටිය | 0.03 | |
| 7 | දුම්රිය ස්ථානයඉදිරිපිට | 0.3 | |
| 8 | බදුලුපිටිය නෙල්සන්ප්‍රජා ශාලාව අසල ක්‍රීඩාපිටිය | 0.17 | |
| 9 | බදුලුපිටිය නිමල්වික්‍රමතුංග ක්‍රීඩාපිටිය | 0.7 | |
| 10 | තිසර මල්ශාලාවඉදිරිපිට මගී විවේකී ස්ථානය | 0.07 | |
| 11 | හරිත පුස්තකාලය තීරය -මහියංගණ පාර | 0.03 | |
| 12 | මුතියංගණ රජ මහා විහාරභූමිය | 0.37 | ක්‍රියාකාරි |

| | | | |
|---|---|---|---|
| 13 | මැදපතන - පතන ඉඩම | 29 | |
| 14 | හිඟුරුගමුවක්‍රීඩාපිටිය | 0.7 | |
| 15 | මයිලගස්තැන්නක්‍රීඩාපිටිය | 0.2 | |
| | එකතුව | 35.65 | |

පොදු එළිමහන් ස්ථානයන්හි අවම ප්‍රමිතීන්ට අනුකූලව ජනගහනය 1,000 කට අවශ්‍ය පොදු එළිමහන් භූමි ප්‍රමාණය හෙක්ටයාර් එකකි. ඒ අනුව බදුල්ල මහ නගර සභා සීමාව තුල මුළු ජනගහනය 2017 වන විට 48,641 ක් වන අතර පැවතිය යුතු පොදු එළිමහන් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 48 කි. නමුත් අපේක්ෂිත ජන ගහණ වර්ධනය නිසා එය 55,847 දක්වා වර්ධනය වන බව පුරෝකථනය කර ඇත. ඒ අනුව අවශ්‍ය පොදු එළිමහන් භූමි ප්‍රමාණය හෙක්ටයාර් 55කි.

එබැවින් වගුව අංක 2.3 හි ඇතුලත් පොදු එළිමහන් ප්‍රදේශ සංවර්ධනය හා ජනතාවට ප්‍රවේශකත්වය සැපයීම අපේක්ෂිතය. (සිතියම 2.38)

*වගුව අංක 6.3 : යෝජිත පොදු එළිමහන් කලාපයන්හි වර්ග ප්‍රමාණය*

| | විවෘත ප්‍රදේශය | වර්ග ප්‍රමාණය (හෙක්.) | උද්‍යානය | සේවා ප්‍රදේශය (අරය) කි.මී |
|---|---|---|---|---|
| 1 | කුඹුරු ඉඩම 1 | 3.4 | Local park (මධ්‍ය උද්‍යාන පහළ ) | 0.4 |
| 2 | කුඹුරු ඉඩම 2 | 3.5 | Local park (මධ්‍ය උද්‍යාන පහළ ) | 0.4 |
| 3 | කුඹුරු ඉඩම 3 | 11.2 | Community park (මධ්‍ය උද්‍යාන ඉහළ ) | 0.8 |
| 4 | මහ රෝහල පිටුපස උද්‍යානය | 0.2 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 5 | අලිකුඹුර | 2.5 | Local park (මධ්‍ය උද්‍යාන පහළ ) | 0.4 |
| 6 | සේනානායක උද්‍යානය | 0.8 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 7 | බදුල්ල උද්භිද උද්‍යානය | 1.5 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 8 | වීල්ස් පාර්ක්පිට්ටනිය | 0.38 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 9 | කම්මානන්කඩ පිට්ටනිය | 0.2 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 10 | මැහෝගනී වෘක්ෂ තීරය | 0.7 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 11 | මැදිරිය පාර උද්‍යානයසහ ඇවිදින මංතීරු | 0.3 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 12 | කටුපැලැල්ලගම ක්‍රීඩාපිටිය | 0.03 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 13 | දුම්රිය ස්ථානයඉදිරිපිට | 0.3 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 14 | බදුලුපිටිය නෙල්සන්ප්‍රජා ශාලාව අසල ක්‍රීඩාපිටිය | 0.17 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |

| | | | | |
|---|---|---|---|---|
| 15 | බදුලුපිටිය නිමල්වික්‍රමතුංග ක්‍රීඩාපිටිය | 0.7 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 16 | තිසර මල්ශාලාවඉදිරිපිට මගී විවේකී ස්ථානය | 0.07 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 17 | හරිත පුස්තකාලය තීරය -මහියංගණ පාර | 0.03 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 18 | මුතියංගණ රජ මහා විහාරභූමිය | 0.37 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 19 | මැදපතන - පතන ඉඩම | 29 | Town park (නගර උද්‍යාන) | 1.6 |
| 20 | හිඟුරුගමුවක්‍රීඩාපිටිය | 0.7 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| 21 | මයිලගස්තැන්නක්‍රීඩාපිටිය | 0.2 | Pocket park (ඉතා කුඩා උද්‍යාන) | - |
| 22 | ගහ රක්ෂිතය | 1.14 | Mini Park (කුඩා උද්‍යාන) | 0.2 |
| | එකතුව | 57.89 | | |

**සිතියම අංක *6.26*: යෝජිත පොදු එළිමහන් කලාපයන්හි සේවා කලාපය**



## 6.6 සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ උපායමාර්ග

### 6.6.1 යෝජිත සංස්කෘතික උරුමයන් සංරක්ෂණ සැලැස්ම

බදුල්ල නගරය තුල ආගමික වටිනාකමින් යුත් උරුමයන් ලෙස බදුල්ල මුතියංගණ රජමහා විහාරය, කතරගම දේවාලය හැඳින්විය හැකිය. ඒ අනුව බදුල්ල 2030 අපේක්ෂිත දැක්මට අනුව යමින් බදුල්ල උරුමයන්ගේ අනන්‍යතාවය සුරකීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම මෙම උපාය මාර්ග හරහා අපේක්ෂිතය.

ඒ අනුව පර්මාර්ථ සකසා ඇති ආකාරයට ආගමික හා සංස්කෘතික වටිනාකමින් යුත් ස්ථාන සංරක්ෂණය කිරිම, මුතියංගණ රජමහා විහාරය ආශ්‍රිතව භූ දර්ශණ නියාමනය තුලින් අනන්‍යතාවය සුරකීම හා පවත්නා භාවිතයන්ට අනුකල ලෙස හඳුනාගත් පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථානයන්හි භාවිතයන් වෙනස් කර සංවර්ධනය කිරිම උදෙසා, ආගමික අනන්‍යතාවය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගය යෝජිතය.

ඒ අනුව මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කිරිම සඳහා උපායමාර්ගික ක්‍රියාවන් ලෙස පහත අංශ හඳුනා ගන්නා ලදි.

මුතියංගණ පූජා භූමියට යාබදව ඇති නව පස්සර පාර, දුම්රිය පළ පාර යන මාර්ල දෙපස මීටර 50ක් ඇතුළත ඉදි කරනු ලබන ගොඩනැලිලි සඳහා උපරිම වශයෙන් තට්ටු 03කට වඩා ඉඩ දෙනු නොලැබේ

i. මුතියංගණ පූජා භූමියට යාබදව ඇති නව පස්සර පාර, දුම්රිය පළ පාර යන මාර්ල දෙපස මීටර 50ක් ඇතුළත ඉදි කරනු ලබන ගොඩනැලිලි සඳහා උපරිම වශයෙන් තට්ටු 03කට වඩා ඉඩ දෙනු නොලැබේ

*රූපය අංක 6.13: මුතියංගණ රජ මහා විහාරය වටා වූ සංවර්ධන පාලන අවරෝධක ප්‍රදේශය (*Buffer zone)



ii. සංස්කෘතිකමය උත්සව පවත්වන වීථි විධිමත් ආකාරයට පවත්වාගෙන යාම

බදුල්ල නගරය ඓතිහාසිකව වටිනාකමක් හිමිවීමට ඒ ඒ ආගමික ස්ථානයක් ඇසුරුකොට පවත්වනු ලබන පෙරහැර සුවිශේෂී වී ඇත. බදුල්ල නගරයට ආවේණික වූ සංස්කෘතික රටාවක් ඇති කරමින් මෙම පෙරහැර සංකල්පය බදුල්ල නගරයේ මුල් බැස ගෙන ඇත.

ඒ අනුව බදුල්ල මුතියංගණ රජ මහා විහාරය, බදුල්ල කතරගම දේවාලලය,කම්මානන්කඩ රජ මහා විහාර පෙරහැර සහ රොක්හිල් කෝවිල් රදම් පෙරහැර ඒ අතර සුවිශේෂී වෙයි. ඉතිහාසයේ පටන් අද දක්වාම මෙම සංස්කෘතිමය අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීම සිරිත වී ඇත. ඒ අනුව ප්‍රධාන වශයෙන් බදුල්ල පහල වීදිය, බණ්ඩාරවෙල පාර, බැංකු පාර යන මාර්ග ආශ්‍රිය කරගෙන මෙම සංස්කෘතිමය අවස්ථාවන් පවත්වනු ඇත. ඒ අනුව පෙරහැර පවත්වන මාර්ග අශ්‍රිතව පදික මංතීරු ඇති කිරීමට යෝජිතය.

**සිතියම අංක *6.2*7 : බදුල්ල සංස්කෘතික පෙරහැර පවත්වන මාර්ග**



### 7.6.2 යෝජිත පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණ සැලැස්ම

බදුල්ල නගරය හා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන අතර එකී ඓතිහාසික කාල පරිච්ඡේදයන්ගේ නටබුන් නගරය තුළ ශේෂ වී ඇත. එබැවින් එම ඓතිහාසික උරුම අනාගතයටද ආරක්ෂා කිරීම උදෙසා සංරක්ෂණයට යෝජිතය. ඒ සඳහා

i. ආගමික හා පුරාවිද්‍යා ස්මාරක ලෙස පවත්නා ස්ථාන සංරක්ෂණය කිරීමේ උපාය මාර්ගය (උපලේඛණ අංක 01)

ආගමික උරුමයන් ලෙස බදුල්ල මහ නගර සීමාව තුළ පවත්නා සුවිශේෂිතම අංගයන් දෙකකි. ඒ මුතියංගණ රජමහා විහාරස්ථානය හා කතරගම දේවාලයයි. මුතියංගණ රජ මහා විහාරස්ථානය පවත්නා භූමිය තුල ආවේණික ගෘහ අලංකරණයට, භූ දර්ශණයට නොගැලපෙන කිසිදු සංවර්ධන කටයුත්තක් නොකළ යුතුය.

කතරගම දේවාල පරිශ්‍රය එනම් රජ වීදියේ සිට පහළ වීදිය දක්වා වූ කොටස තුළ පවත්නා ගොඩනැගිලි වල ආවේණික ගෘහ නිර්මාණ ක්‍රමවේදය හා භූ දර්ශණයට අනුකූලව ඉදිකිරීම් සිදු කළ යුතුය.

පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන ලෙස උපලේඛණ අංක 1 සඳහන් ස්ථානයන්හි සිදු කරනු ලබන සියළු සංවර්ධන කාර්යයන්ට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලැබිය යුතුය

iii. මීට අමතරව පුරාවිද්‍යා සංරක්ෂණ ස්ථාන ලෙස පවත්නා පහත ස්ථානයන්හි සංරක්ෂණ කරමින් භාවිතය වෙනස් කර සංවර්ධන ව්‍යාපෘතින් සිදු කිරීමට හඳුනා ගන්නා ලදි.

- වෙලේකඩේ පැරණි බලකොටුව - මහජන විවේකි ස්ථාන ව්‍යාපෘතිය
  බදුල්ල පරිපාලන ආයතන හා බදුල්ල මහ රෝහල පැවතීම හේතුකොට ගෙන නගරයට සංක්‍රමණය වන විශාල සංක්‍රමනික ප්‍රජාවට විවේකී ස්ථානයක් ලෙස වෙලේකඩේ පැරණි බලකොටුව යොදා ගැනීමට යෝජිතය. මෙහිදී එහි පවත්නා පුරාවිද්‍යා ලක්ෂණ වලට හානි නොවන ආකාරයට අවශ්‍ය භූමි අලංකරණ කටයුතු සිදුකිරීම සිදු කළ යුතුය.

*රූපය අංක 6.14 : වර්තමාන වෙලේකඩේ පරිශ්‍රය හා යෝජිත මහජන විවේකි ස්ථාන*






මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

- සළුසල ගොඩනැගිල්ල

  සළුසල ගොඩනැගිල්ල පවත්නා භූමියට යාබදව ඇති තානායම් පරිශ්‍රය, කම්කරු උසාවිය, ආයුර්වේද මධ්‍යස්ථානය සහිත භූමිය ඒකාබද්ධ කොට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් කිරීමට යෝජිතටය. එහිදි සළුසල ගොඩනැගිල්ලෙහි පවත්නා පුරාවිද්‍යා ස්මාරකය ඒ අයුරින්ම පවත්වාගෙන යමින් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට එක් කිරීම සිදු කළ යුතු වේ.

*රූපය අංක 6.15 : වර්තමාන සළුසල ගොඩනැගිල්ල හා යෝජිත මිශ්‍ර සංවර්ධනය*





මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

- තල්දෙන වලව්ව

  බදුල්ල නගරයේ සිටින නේවාසික ප්‍රජාවත්, නගරයට පැමිණෙන සංක්‍රමණික ප්‍රජාවත්, නගරය වටා පවතින සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථාන කරා යන සංචාරක ප්‍රජාව ඉලක්ක කොටගත් අවන්හල් ව්‍යාපෘතියක් යෝජිතය. එහිදී පවත්නා පුරාවිද්‍යා ස්මාරකයට හානි නොවන ආකාරයට ගොඩනැගිල්ල නැවත පිළිසකර කිරීම් සිදු කළ යුතු වේ.

*රූපය අංක 6.16 : වර්තමාන තල්දෙන වලව්ව හා යෝජිත අවන්හල් ව්‍යාපෘතිය*




මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

- කොතලාවල වලව්ව

  පස්සර මාර්ගය ආශ්‍රිතව පවතින මෙම ගොඩනැගිල්ල ගඟට යාබද පවත්නා පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගොඩනැගිල්ලකි. නගරයේ නේවාසික ප්‍රජාවත්, සංචාරක ආකර්ෂණය දිනාගත් ප්‍රදේශ කරා ගමන් කරන ප්‍රජාවත් ඉලක්ක කර ගෙන මෙම ගොඩනැගිල්ල නැවත පිළිසකර කර අවන් හල් ව්‍යාපෘතියක් ලෙස යෙදවීමට යෝජිතය.

*රූපය අංක 6.17: වර්තමාන කොතලාවල වලව්ව හා යෝජිත අවන් හල් ව්‍යාපෘතිය*






මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි

## 6.7 ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

2018-2030 සංවර්ධන සැලැස්මෙහි ඒ ඒ උපාය මාර්ග යටතේ හඳුනාගන්නා ලද ව්‍යාපෘතින්ක්‍රියාත්මක කිරීමේ පිළිවෙල හඳුනා ගැනීමට ව්‍යපෘති සංසන්ධනාත්මක ක්‍රමවේදය තුළින් හා සමාජීය හා පාරිසරික බලපෑම අනුව විශ්ලේෂණය කරන ලදි.

ව්‍යාපෘති සංසන්ධනාත්මක විශ්ලේෂණයේදි එක් එක් ව්‍යාපෘතිය අනෙක් ව්‍යාපෘති සමග ඇති සහසම්බන්ධතාවය මත අගය දමන ලදි ව්‍යපෘතියක් අනෙක් ව්‍යාපෘතියට සම්බන්ධතාවයක් නොමැති නම් එහි අගය 0 විය. ඒ අනුව සිදු කළ විශ්ලේෂණයෙන් එක් එක් ව්‍යාපෘතියට අනෙක් සියලු ව්‍යාපෘති වල බලපෑම මත එකතු වූ දළ අගයක් ලැබී ඇත. මෙම දළ එකතුව මත ව්‍යපෘති ප්‍රමුඛතාවය හඳුනා ගන්නා ලදී. (ඇමුණුම අංක 2) ව්‍යාපෘතිවල හා පාරිසරික බලපෑම හඳුනා ගන්නා විශ්ලේෂණයේදි එක් එක් ව්‍යාපෘතියට පාරිසරික හා සමාජයීය වශයෙන් ඇති ධනාත්මක හා සමානාත්මක ගය අනුව ප්‍රමඛත්වය සොයා ගන්නා ලදී (ඇමුණුම අංක 3) පසුව ඒ ඒ විශ්ලේෂණයෙන් ලබා ගන්නා ලද අගයන් මත ව්‍යාපෘති පුමුඛතා ලැයිස්තුව සකස් කරන ලදී(වගුව අංක 2.24)

## 6.7.1. උපාය මාර්ගික ව්‍යාපෘති ලේඛනය

### i. ව්‍යාපෘති ප්‍රමුඛතා සාරාංශකරණය

වගුව අංක 6.3 : ව්‍යාපෘති ප්‍රමුඛතා සාරාංශකරණය

| ප්‍රමුඛතා අගය | ව්‍යාපෘතිය | සමාජීය හා පාරිසරික විශ්ලේෂණය | සමාජීය හා පාරිසරික | සංසන්ධනාත්මක විශ්ලේෂණය | සංසන්ධනාත්මක විශ්ලේෂණය | එකතුව | ප්‍රතිශතාත්මක අගය % |
|---|---|---|---|---|---|---|---|
| | | දළ අගය | ප්‍රතිශතාත්මක අගය % | දළ අගය | ප්‍රතිශතාත්මක අගය % | | |
| 1 | අප ජලය කළමනාකරණ ව්‍යාපෘතිය | 2 | 100 | 50 | 50.51 | 150.51 | 75.25 |
| 2 | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය | 2 | 100 | 45 | 45.45 | 145.45 | 72.73 |
| 3 | යෝජිත හරිත උද්‍යානය-මැදිරිය පාර | 2 | 100 | 29 | 29.29 | 129.29 | 64.65 |
| 4 | හරිත මංතීරු සංවර්ධන ව්‍යාපෘතිය | 2 | 100 | 24 | 24.24 | 124.24 | 62.12 |
| 5 | යෝජිත පහළ වීදිය පදික වීථි සංවර්ධන ව්‍යාපෘතිය | 2 | 100 | 23 | 23.23 | 123.23 | 61.62 |
| 6 | මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය | 2 | 100 | 22 | 22.22 | 122.22 | 61.11 |
| 7 | සැහැල්ලු දුම්රිය සංවර්ධන ව්‍යාපෘතිය | 2 | 100 | 21 | 21.21 | 121.21 | 60.61 |
| 8 | විකල්ප මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 2 | 100 | 17 | 17.17 | 117.17 | 58.59 |
| 9 | වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය- වෙලේකඩේ වෙළඳ සංකීර්ණය 1 වන මහල | 2 | 100 | 13 | 13.13 | 113.13 | 56.57 |
| 10 | යෝජිත ගඟ ආශ්‍රිත සංවර්ධනය(ග්‍රීන් ලේන් ඩ්‍රයිව්) | 2 | 100 | 13 | 13.13 | 113.13 | 56.57 |
| 11 | කොතලාවල වලව්ව සංචාරක අවන්හල ව්‍යාපෘතිය | 2 | 100 | 9 | 9.09 | 109.09 | 54.55 |
| 12 | තල්දෙන වලව්ව සංචාරක අවන්හල් ව්‍යාපෘතිය | 2 | 100 | 9 | 9.09 | 109.09 | 54.55 |
| 13 | යෝජිත නේවාසික සංවර්ධන ව්‍යාපෘතිය( බදුළුපිටිය) | 2 | 100 | 9 | 9.09 | 109.09 | 54.55 |
| 14 | මහජන රථ ගාල -අලිකුඹුර | 2 | 100 | 8 | 8.08 | 108.08 | 54.04 |
| 15 | නාගරික තෙත් බිම් උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය (අලිකුඹුර) | 2 | 100 | 8 | 8.08 | 108.08 | 54.04 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **16** | යෝජිත නව මාර්ග සංවර්ධනය- මැදිරිය පාර | 2 | 100 | 4 | 4.04 | 104.04 | 52.02 |
| **17** | බස් පර්යන්ත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 1 | 50 | 30 | 30.30 | 80.30 | 40.15 |
| **18** | බදුල්ල මහ රෝහලේ පසුපස භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 1 | 50 | 29 | 29.29 | 79.29 | 39.65 |
| **19** | යෝජිත බන්ධනාගාර නිල නිවාස පරිශ්‍රයේ පරිපාලන සංකීර්ණ ව්‍යාපෘතිය | 1 | 50 | 26 | 26.26 | 76.26 | 38.13 |
| **20** | යෝජිත බන්ධනාගාර පරිශ්‍රයේ මිශ්‍ර වාණිජ සංවර්ධනය | 1 | 50 | 26 | 26.26 | 76.26 | 38.13 |
| **21** | යෝජිත බන්ධනාගාර ප්‍රතිශ්ඨාපන ව්‍යාපෘතිය | 1 | 50 | 23 | 23.23 | 73.23 | 36.62 |
| **22** | යෝජිත පැරණි පොදු වෙළඳසැල් සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 50 | 22 | 22.22 | 72.22 | 36.11 |
| **23** | යෝජිත බන්ධනාගාර නිල නිවාස ප්‍රතිශ්ඨාපන ව්‍යාපෘතිය | 1 | 50 | 20 | 20.20 | 70.20 | 35.10 |
| **24** | තානායම් භූමියේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය (ආයතන හා වාණිජ) | 1 | 50 | 19 | 19.19 | 69.19 | 34.60 |
| **25** | බදුල්ල පරිපාලන සංකීර්ණය II අදියර ව්‍යාපෘතිය | 1 | 50 | 19 | 19.19 | 69.19 | 34.60 |
| **26** | වෙලේකඩේ මහජන විවේකාගාර ව්‍යාපෘතිය | 1 | 50 | 15 | 15.15 | 65.15 | 32.58 |
| **27** | යෝජිත මංසන්ධි සංවර්ධනය | 1 | 50 | 10 | 10.10 | 60.10 | 30.05 |
| **28** | යෝජිත රථ ගාල්- දුම්රිය ස්ථානය (බදුල්ල) | 1 | 50 | 5 | 5.05 | 55.05 | 27.53 |
| **29** | යෝජිත රථ වාහන නැවතුම් පොළ -රේස්කෝස් පාර | 1 | 50 | 5 | 5.05 | 55.05 | 27.53 |
| **30** | බදුල්ල සරස්වතී කනිටු විදුහල ප්‍රතිශ්ඨාපනය | 1 | 50 | 5 | 5.05 | 55.05 | 27.53 |
| **31** | යෝජිත කාර්යාල නිල නිවාස සංවර්ධන ව්‍යාපෘතිය(නඩුකාර කන්ද) | 1 | 50 | 3 | 3.03 | 53.03 | 26.52 |
| **32** | ඒකාබද්ධ සේවා තීර සංවර්ධන ව්‍යාපෘතිය | 1 | 50 | 3 | 3.03 | 53.03 | 26.52 |
| **33** | බදුල්ල සරස්වතී කනිටු විදුහල් භූමියේ පරිපාලන සංකීර්ණ ව්‍යාපෘතිය | 1 | 50 | 1 | 1.01 | 51.01 | 25.51 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 34 | රසායනික සන අපද්‍රව්‍ය භෂ්මක ව්‍යාපෘතිය | 0 | 0 | 13 | 13.13 | 13.13 | 6.57 |

## 6.7.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

වගුව අංක 6.4: ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය

| සැලැස්ම | උප සැලැස්ම හා ක්‍රියාකාරි සැලැසුම | සම්බන්ධිත ආයතන | සම්බන්ධිත ආයතන සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා පවතින වගකිම |
|---|---|---|---|
| සේවා සැලැසුම | බදුල්ල මහ රෝහලේ පසුපස භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | බදුල්ල පළාත් මහ රෝහල / නාගරික සංවර්ධන අධිකාරිය | • ඉඩම් අත්පත් කර ගැනිම |
| | | | • ගොඩ කිරීම සඳහා අවශ්‍ය අනුමැතින් ලබා ගැනීම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | බදුල්ල පරිපාලන සංකීර්ණය අදියර II ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර ගැනිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | | | |
| | බදුල්ල බන්ධනාගාරය හා නිල නිවාස බදුල්ල මහ නගර සභාවෙන් පිටත ප්‍රතිශ්ඨාපනය කිරීම | බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ බන්ධනාගාර දෙපාර්තමේන්තුව | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | | | |
| | බදුළුපිටිය පාර බන්ධනාගාර නිල | නාගරික සංවර්ධන අධිකාරිය | • ඉඩම් අත්පත් කර ගැනිම |

| | | | |
|---|---|---|---|
| | නිවාස සහිත ඉඩම තුළ නව පරිපාලන සංකීර්ණය | | • ව්‍යාපෘති විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත බන්ධනාගාර පරිශ්‍රයේ මිශ්‍ර වාණිජ සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් අත්පත් කර ගැනිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | තානායම් භූමියේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය (ආයතන හා වාණිජ) | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් අත්පත් කර ගැනිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත නේවාසික සංවර්ධන ව්‍යාපෘතිය( බදුළුපිටිය) | නිවාස සංවර්ධන අධිකාරිය/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් අත්පත් කර ගැනිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය- වෙලේකඩේ වෙළඳ සංකීර්ණය 3 වන මහල | බදුල්ල මහ නගර සභාව | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත පැරණි පොදු වෙළඳසැල් සංවර්ධන ව්‍යාපෘතිය | බදුල්ල මහ නගර සභාව | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |

| | | | |
|---|---|---|---|
| | බදුල්ල සරස්වතී කනිටු විදුහල ප්‍රතිශ්ඨාපනය | ඌව පළාත් සභාව/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් අත්පත් කර ගැනීම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | මධ්‍යම පාන්තික නිවාස යොජනා ක්‍රමය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ නාගරික සංවර්ධන අධිකාරිය | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| ප්‍රවාහන සැලැසුම | හරිත මංතීරු සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව/ මාර්ග සංවර්ධන අධිකාරිය | • ඉඩම් නිදහස් කර දිම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | විකල්ප මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | මංසන්ධි සංවර්ධන ව්‍යාපෘතිය | බදුල්ල මහ නගර සභාව/ මාර්ග සංවර්ධන අධිකාරිය | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | මහ රෝහල ඉදිරිපස සිට බදුල්ල බන්ධනාගාරය, රිවර් සයිඩ් මාර්ගය හරහා කොස්ගස් හන්දිය දක්වා මාර්ගය පළල් කිරිම | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |

| | | | |
|---|---|---|---|
| | පිං අරාව හන්දිය සිට බදුල්ල මහ විද්‍යාලය දක්වා මාර්ගය පළල් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | කයිලගොඩ හන්දිය සිට හංවැල්ල පාර හරහා හිඳගොඩ දක්වා මාර්ගය පළල් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | හිඳගොඩ සිට හිඟුරුගමුව හරහා කණුපැලැල්ල දක්වා මාර්ගය පළල් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | දුම්රිය ස්ථානය ඉදිරිපස සිට දෙයියන්නෙවෙල මාර්ගය හරහා රජ වීදිය මාර්ගය පළල් කිරීම | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | මැදිරිය මාර්ගයේ සිට පිලිපොතගම මාර්ගය දක්වා කෙටිටසෙහි මාර්ග සංවර්ධනය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | බස් පර්යන්ත පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | වාහන නැවතුම් පොළ ව්‍යාපෘති | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දීම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |

| | | | |
|---|---|---|---|
| | පහළ වීථි නියාමන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව/ මාර්ග සංවර්ධන අධිකාරිය | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | නගර මධ්‍ය ය සඳහා සැහැල්ලු දුම්රිය ප්‍රවාහනය(LRT) | මාර්ග සංවර්ධන අධිකාරිය | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත රථ ගාල්- දුම්රිය ස්ථානය (බදුල්ල) | බදුල්ල දුම්රිය දෙපාර්තමේන්තුව/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත රථ වාහන නැවතුම් පොළ - රේස්කෝස් පාර | බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| යෝජිත ජල සැපයුම් සැලැස්ම | භූගත සේවා තීර සංවර්ධන ව්‍යාපෘතිය | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |

| | | | |
|---|---|---|---|
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| කාණු හා අප ද්‍රව්‍ය ප්‍රවාහන පද්ධති සැලැස්ම | යෝජිත අප ජල කළමණාකරණ ව්‍යාපෘතිය | ප්‍රදේශිය ලේකම් කාර්යාලය -බදුල්ල/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම | යෝජිත කැලි කසල අංගන කළමණාකරණ ව්‍යාපෘතිය | බදුල්ල මහ නගර සභාව | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | ඝන අපද්‍රව්‍ය හෂ්මක ව්‍යාපෘතිය | බදුල්ල මහ නගර සභාව | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| සංරක්ෂණ සැලසුම | අළුගොල්ල කන්ද දේශිය වන වගා ව්‍යාපෘතිය | වන සංරක්ෂණ දෙපාර්ත්තමේන්තුව | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| භූ දර්ශන කළමණාකරණය සැලසුම | මැදිරිය පාර මැහෝගනී වන කොටසහි හරිත උද්‍යාන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • සංරක්‍ෂණ කලාප පිහිටුවීම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | මැදිරිය පාර ගහ රක්ෂිතයේ සිට සේනානායක උද්‍යානය දක්වා හරිත උද්‍යාන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය / බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම<br>• ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම<br>• ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | අලිකුඹුර යෝජිත තෙත් බිම් ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන අධිකාරිය | • ඉඩම් නිදහස් කර දිම |

| | | | |
|---|---|---|---|
| | | / බදුල්ල මහ නගර සභාව | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | යෝජිත ගහ ආශ්‍රිත සංවර්ධනය(ග්‍රීන් ලේන් ඩ්‍රයිව්) | බදුල්ල මහ නගර සභාව/ බදුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | බදුල්ල මහ රෝහල පිටුපස උද්‍යානය | බදුල්ල මහ රෝහල | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණ සැලැස්ම | කොතලාවල වලව්ව සංචාරක අවන්හල ව්‍යාපෘතිය | පුරාවිද්‍යා සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ බදුල්ල මහ නගර සභාව/ නාගරික සංවර්ධන අධිකාරිය | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | වෙලේකඩේ මහජන විවේකාගාර ව්‍යාපෘතිය | පුරාවිද්‍යා සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |
| | තල්දෙන වලව්ව සංචාරක අවන්හල් ව්‍යාපෘතිය | පුරාවිද්‍යා සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ බදුල්ල මහ නගර සභාව | • ඉඩම් නිදහස් කර දිම |
| | | | • ව්‍යාපෘතිය විභවතාවය අධ්‍යනය කිරිම |
| | | | • ව්‍යාපෘතිය සංකල්පය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම |

# Concept Paper


Badulla Bus stand expansion Project ....................................................................................163

Badulla old Market Redevelopment....................................................................................165

Badulla waste water and sewer management project ..........................................................167

Badulla Mediriya road recreational park development ........................................................169

Thaldena walwwa Modern Restaurant project ....................................................................171

KothalawalaWalawwa Restaurant and resort Project...........................................................173

Alikumbura Urban Wetland Park and Vehicle Park ............................................................175

Mixed development project at Badulla existing Rest House land........................................177

**Badulla Bus stand expansion Project**

**Under Badulla Town Development Plan**

**Rational of Project**

Badulla is a capital city of Uva Province. All government, Provincial and District Offices are located within Badulla city limit. As a commercial hub many private sector regional officers are all so located in Badulla. General Hospital of Badulla cater all region and therefore over 100 000 daily commuting people come to the Badulla to get all services.

Apart from that Badulla is act as transport hub of the region. Therefore Badulla public transports are running towards several directions. There are about 800 private and public buses coming to the Badulla central bus stand per day. 75% of the buses starting location is Badulla bus stand while 25% of the buses are passing through.

However Badulla Central Bus Stand having three number of bus terminals provided 40 bus bays. These constructions have done about more than twenty years back. At present, required numbers are not adequate with present situation. About 15 bays remain on the road without having shelters and minimum safety for the people. As well as though there are 40 bus bays it is highly congested during the peak hours in the bus stand. Due that it causes to generate traffic congestion in south lane, King's street and post office road.

The land back of the Badulla bus stand is currently own by the Badulla municipal council and it consist with one story and two story old Municipal council market. This is in between the new Badulla commercial complex building and Bus stand. There are about 20 routes that do not having integrated public, private bus transportation. Currently these private buses are stop at this corner of the bus stand and it is very congested all the day. Therefore as the provincial main town and regional transport facilitator it is essential to expand the bus stand premises and create smooth transport facilities.

**Project Objectives**

Proper accessibility to the transportations is improving the development potential of the area. Therefore expansion of Badulla bus terminal will improve the serviceability. This project mainly focuses to facilitate passengers with smooth bus transportation. There are

several objectives that propose to achieve through this development. It is focuses on to increase public and private bus bays, to create safe passenger movement, to provide commercial facilities for passengers. Through this project it will create better serviceable town.

The identified land is consisting with about 57 perches. It is propose to construct about one more bus terminal with resting area, changing rooms. And also it provides present commercial activity replacement space in upper and ground floors. Out of 57 perches more ground space will remain to circulation of busses.

**Following benefits are taken from the project**

- Increase number of Bus Bays
- Cater for more Passengers.
- Provide toilet facilities and resting rooms.
- Provide better commercial activity replacement

